# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,915 – 1970 ජූලි 17 වැනි සිකුරාදා – 1970.7.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 943 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 986 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 951 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | 997 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 962 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 983 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 983 | විවිධ දැන්වීම ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ජීවන් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී මසුව ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන්ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(iv) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පාඨමාලාවට උචිත (පිළිගත් විශ්ව විද්‍යාලයක) දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුය.

**(තෝරා ගනු ලබන අපේක්ෂකයින් ග්‍රීක් භාෂාව ඉගෙනීමට එකඟ විය යුතුයි.)**

**සංලක්ෂ්‍යය 1.—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක,** විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970. 12. 31 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර** තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස් වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය:—

(1) ග්‍රීසියට යාමට හා ආපසු ඒමට ගමන් වියදම්.

(2) මාසික දීමනාවක්.

**සංලක්ෂ්‍යය.—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවක** යන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. සම්මුඛ පරීක්ෂණය.—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා යනිමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. ගිවිසුම.—තෝරාගනු ලබන අපේක්ෂකයන් ග්‍රීසිය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. වෛද්‍ය පරීක්ෂණය.—තෝරාගනු ලබන අපේක්ෂකයන් ග්‍රීසියේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බලට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයකින් සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970. 7. 31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන් අදාල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අයදුම් පත් එවිය යුතුයි.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ජූලි මස 7 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

7–554—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය—සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු ආධුනික තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයෙ මහජන සෞඛ්‍ය ඉංජිනේරු ආධුනික තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන පෝරමය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1970. 7. 31 වැනි දින හෝ ඊට කලින් හෝ, කොළඹ 1, තැ. පෙ. අංක 500 හිමි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලැබිය යුතු ය.

2. පුහුණුවීමේ දීමනා හා සේවා කොන්දේසි:—

(i) ආධුනිකයාට ඔහුගේ ආධුනික කාල සීමාව තුළ දී පහත දැක්වෙන අයුරු ගෙවීම් කරනු ලැබේ:—

| | | |
|---|---|---|
| පළමුවැනි අවුරුද්ද | ... | දිනකට රු. 7.80 බැගිනි. |
| දෙ වැනි අවුරුද්ද | ... | දිනකට රු. 8.50 බැගිනි. |
| තෙ වැනි අවුරුද්ද | ... | දිනකට රු. 9.20 බැගිනි. |
| සිව් වැනි අවුරුද්ද | ... | දිනකට රු. 9.90 බැගිනි. |
| පස් වැනි අවුරුද්ද | ... | දිනකට රු. 10.60 බැගිනි. |

(ii) තෝරා ගනු ලැබූ ආධුනිකයා පහත දැක්වෙන අයුරු පස් වසරක පුහුණුවක් ලැබිය යුතු ය.

(ඒ) මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ සැලසුම් කාර්යාලයේ අවුරුදු එකයි.

(බී) මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ රසායනාගාරයෙහි මාස හයයි.

(සී) මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ වැඩ හලෙහි මාස හයයි.

(ඩී) සමීක්ෂණ හා විමර්ශන කටයුතු පිළිබඳ අවුරුදු එකයි.

(ඊ) ඉදිකිරීම පිළිබඳ අවුරුදු දෙකයි.

(ඩී) සහ (ඊ) කාල සීමාවන් ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ අභිමතය පරිදි එකවර ගෙවී යා හැක.

(iii) තෝරා ගනු ලැබූ ආධුනිකයා සිවිල් හා මහජන සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ විෂයයන් හා සමීක්ෂණ I හා II සඳහා ලංකා කාර්මික විද්‍යාලයේ පවත්වනු ලබන පංතිවල ඉගෙන ගැනීම අවශ්‍යය.

**3. සිවිල් ඉංජිනේරු ආයතනයේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු හා ජල ඉංජිනේරු ශිෂ්‍යයෝ**

පහත දක්වෙන කොන්දේසි සතුටුදායකව සම්පූර්ණ කරන, බලාපොරොත්තු තැබිය හැකි යහපත් හැසිරීමෙන් යුත්, ආධුනිකයින් සිසුන් වශයෙන් නිර්දේශ කිරීමට ඉඩ ඇත.

(ඒ) උප පරීක්ෂකයින්ගේ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට පවත්වන දෙපාර්තමේන්තු විභාගයේ දී සම්මාන සාමාර්ථ සහිතව සමත් වීම.

(බී) ලංකා කාර්මික විද්‍යාලයේ නියමිත පාඨමාලාවක් සතුටුදායක ලෙස උගෙන සම්පූර්ණ කිරීමත් එම ආයතනයේ අධ්‍යක්ෂගෙන් හොඳ වාර්තා ලබා ගැනීමත් සහ,

(සී) නිලධාරීන් යටතේ තමන් කළ සේවය පිළිබඳ එම නිලධාරීන් ගෙන් හොඳ වාර්තා ලබා ගැනීමටත් ය. එහෙත් ආධුනිකයෙකු සිසුවෙකු ලෙස නිර්දේශ කිරීම පිළිබඳ ස්ථිර පොරොන්දුවක් දෙනු නො ලැබේ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය නොමැතිව කිසියම් ආධුනිකයෙක් මෙම ඉංජිනේරු අංශය අතහැර ගියහොත් ඔහුගේ ආධුනිකත්වය නතර කර දැමූ ලෙස සලකන අතර ඔහුට සිසුවෙකු ලෙස ඉගෙනීමට තිබූ ඉඩකඩ ද ඉවත් කරනවා ඇත.

4. හය මසක් පුහුණුව අවසානයේ දී ආධුනිකයා හා ඔහුගේ දෙමව්පියන් හෝ භාරකාරියන් හෝ සමග බහු පාක්ෂික ඔප්පුවක් අත්සන් කරනු ලැබේ. නොමනා හැසිරීම හෝ වැඩ පිළිබඳ උනන්දුවක් නොහොත් සැලකිලිමත් බවක් නො දක්වීම හෝ හේතු කොට ගෙන බහු පාක්ෂික ඔප්පුව අවලංගු කළ හැක.

5. රක්ෂාවෙන් බලාපොරොත්තු වන මතු දියුණුව—

තමන්ගේ බහු පාක්ෂික ඔප්පුව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, දෙපාර්තමේන්තුවේ පත්වීමක් ලබා ගැනීම සම්බන්ධයෙන් හිමිකම් කියා පෑමට කිසිම ආධුනිකයෙකුට අයිතිවාසිකමක් නොමැත. එහෙත් සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා වූ පරීක්ෂණයේ (ඒ) සහ (බී) කොටස්වලින් සමත්ව ඇති ආධුනිකයෝ, ඉංජිනේරු ශ්‍රේණියේ පුරප්පාඩු ඇති වුවහොත්, කණිෂ්ඨ සහකාර ඉංජිනේරු ශ්‍රේණියට පත්වීම් ලැබීමට සුදුසුකම් ඇත්තෝ වෙති.

කෙසේ වෙතත් ඔවුන් ද එවැනි හෝ ඒ හා සමාන අධ්‍යාපන සුදුසුකම් ඇති අනිත් අයවලුන් සමග තෝරා ගැනීම සඳහා කෙරෙන තරඟයකට මුහුණ පෑ යුතු ය.

උප පරීක්ෂකවරුන්ගේ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පැවැත්වෙන දෙපාර්තමේන්තු විභාගයෙන් සාමාර්ථය ලබා ඇති අනිකුත් සුදුසුකම් සහිත අයවලුන් උප පරීක්ෂකවරුන්ගේ ශ්‍රේණියේ පුරප්පාඩු ඇතොත්, එම ශ්‍රේණියට පත් කිරීමට ඉඩ තිබේ.

ඉහත දක්වූ ශ්‍රේණි දෙකෙන් එකකවත් ඇබෑර්තු නැතිවූ විටක, දෙපාර්තමේන්තු වැඩ සඳහා පරිපාලන නිලධාරීන් අවශ්‍ය වුවහොත්, මේ ආධුනිකයින් දෛනික වැටුප් ප්‍රමාණයක් මත ආධුනිකත්‍ව විමුක්ත නිලධාරීන් ලෙස සේවයේ යෙදවිය හැක.

6. අවශ්‍ය සුදුසුකම් :—

සෑම අයදුම්කරුවෙක්ම, තමා,

(ඒ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් හෝ ලාංකිකයෙකු බවටත්,

(බී) 1970. 7. 31 වැනි දින දී වයස අවුරුදු 17 කට නො අඩු සහ 22 කට නොවැඩි බවටත්,

(සී) මනා ශරීර සෞඛ්‍යයෙන් හා හොඳ ඇස් පෙනීමෙන් යුක්ත බවටත්, තෝරා ගනු ලැබුවහොත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද සහතිකයක් අවශ්‍යය.

(ඩී) ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි භාෂාව, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළු ශුද්ධ ගණිතය ප්‍රශ්න පත්‍ර දෙකකින් හා පහත දක්වෙන විෂයයන් ගෙන් දෙකක් ද ඇතුළුව එක්වර එකම විභාගයක දී සම්මාන සාමාර්ථය ලබා ඇති බවටත් ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කළ යුතු ය :—

යාන්ත්‍රික විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව.

7. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත දක්වෙන සහතිකවල පිටපත් එවිය යුතු ය. (මුල් පිටපත් නොවේ.)

(ඒ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා පිළිබඳ වාචස්ථා සංග්‍රහය අනුව නිකුත් කරන ලද සහතික හෝ භාර ගනු නො ලැබේ.) රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා විසින් නිකුත් කරන උප්පැන්න සහතික හෝ විශේෂ සහතික (උප්පැන්න ලියාපදිංචි කොට නොමැති අයදුම්කරුවන් සම්බන්ධයෙනි) අයදුම්කරුවන්ගේ වයස ඔප්පු කිරීම සඳහා පිළිගනු ලැබේ.

(බී) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(සී) අයදුම්කරුගේ චරිතය පිළිබඳව මෑතක දී ලබා ගත් සහතික තුනක් (රජයේ සේවයේ යෙදී සිටින අයැදුම්කරුවන් විසින් මෙම සහතික පත් සැපයීම අනවශ්‍යයි.)

8. මේ ගැසට් පත්‍රයේ I කොටසෙහි II ඡේදයේ ආරම්භයෙහි දක්වා ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවමි.

9. ඉල්ලුම් පත් ලැබුණු බැව් දන්වනු නො ලැබේ. මෙම දැන්වීමෙහි ඇති සියලුම අවශ්‍යතාවයනට අනුකූල නොවූ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

ආර්. ඩබ්ලිව්. ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

තැ. පෙ. 500,
ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලය,
කොළඹ 1.
1970 ජූනි මස 4 වන දින.

## ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ස්ථිර ලිපිනය :————.

3. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනයේ දී නියම වයස :——
අවුරුදු :————. මාස :————. දවස් :————.

4. ජාතිය :————.

ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

5. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(සමත් වූ විෂයයන් හා ඒ ඒ විෂයයන් පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාව)

6. පාසැලින් හෝ විද්‍යාලයෙන් අස් වූ තැන් සිට කරන ලද රක්ෂාවන් පිළිබඳ විස්තර :————.

සේවයේ යෙදී සිටි කාලය හා ලබන ලද වැටුප් විස්තරය :——.

7. වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :————.

8. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ?
එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

මේ අයදුම් පතෙහි මා විසින් සපයන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි. එමෙන්ම මා විසින් සපයා ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බැව් තෝරා ගැනීමට කලින් සොයා ගනු ලැබුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු වීමට ද පත්වීමෙන් පසු එම වරද සොයා ගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා තනතුරින් පහ කිරීමට ද ඉඩ ඇති බැව් මම දනිමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-601—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

### මහජන බැංකුව—ආරක්ෂක නිලධාරි තනතුර

1970. 5. 8 දින රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අපගේ ගැසට් නිවේදනයට අමතරවයි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 1970 අගෝස්තු මස 31 දින දක්වා දීර්ඝ කර ඇත.

සේවක කළමනාකාරතැන.

1970. 7. 7.

7–586—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/202.

### අධ්‍යාපන අමාත්‍යාංශය

### 1971 හවායි විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යත්ව

හවායි විශ්ව විද්‍යාලයේ පහත සඳහන් ක්ෂේත්‍රයයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා පෙර-අපර දෙදිග සංස්කෘතික හා කාර්මික අන්තර් හුවමාරු මධ්‍යස්ථානය විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:—

| | |
|---|---|
| පුස්තකාල විද්‍යාව | කීට විද්‍යාව |
| අධ්‍යාපන විද්‍යාව | ක්ෂුද්‍රජීව විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ධීවර ජීව විද්‍යාව |
| භූගර්භ විද්‍යාව | ජීව රසායන විද්‍යාව |
| ආර්ථික විද්‍යාව | ජීව භෞතික විද්‍යාව |
| ව්‍යාපාර පරිපාලනය | කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව | කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව |
| විදුලි ඉංජිනේරු විද්‍යාව | ශස්‍ය විද්‍යාව |
| ගණිතය | උද්‍යාන විද්‍යාව |
| භෞතික විද්‍යාව | පස පිළිබඳ විද්‍යාව |
| රසායන විද්‍යාව | මානව උත්පාදන විද්‍යාව |
| උද්භිද විද්‍යාව | භෛෂජ්‍ය විද්‍යාව |
| සත්ව විද්‍යාව | |

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් ගේ අයදුම් පත් ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 9 සිට මාස 24 දක්වා වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ හවායි බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1970.9.1 වැනි දිනට වයස අවුරුදු 21 හා 35 අතර විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුයි.

(iv) ඇමෙරිකානු විශ්ව විද්‍යාලයයක කලින් ඉගෙන ගත් කෙනෙකු නොවිය යුතුයි.

(v) උසස් ඉංග්‍රීසි ප්‍රවීනත්වයක් තිබිය යුතුයි. (මේ ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා කිරීම පිණිස තෝරාගනු ලබන අපේක්ෂකයන් විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පරීක්ෂණයකට පෙනී සිටීමට සූදානම් වී සිටිය යුතුය. මේ පරීක්ෂණය මූලික වශයෙන් විදේශීය ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි ප්‍රවීණත්වය නිශ්වය කිරීම පිණිස ඇතුලත්වීමේ පරිපාටියේ කොටසක් හැටියට පිළියෙල කරන ලද්දකි. එය පැය තුනහමාරක් තිස්සේ එක් වරකදී කොළඹ දී පැවැත්වේ. මේ සම්බන්ධයෙන් ඩොලර් 10 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතු අතර එය පරීක්ෂණයට පෙනී සිටින අපේක්ෂකයන් විසින්ම දැරිය යුතුව ඇත. කෙසේ වෙතත් පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවකදී එම ගාස්තුව ගෙවීම අපේක්ෂා නොකෙරේ. අපේක්ෂකයන් ශිෂ්‍යත්ව සඳහා අවසාන වශයෙන් තෝරා ගනු ලැබුවහොත් පමණක් ඔවුන්ට ගෙවන දීමනාවන්ගෙන් ඩොලර් 10 ක් පෙර-අපර දෙදිග මධ්‍යස්ථානය විසින් හවායිහිදී අඩු කරගනු ඇත. පරීක්ෂණය පිළිබඳ විස්තර අපේක්ෂකයන් වෙත යථා කාලයේදී එවනු ලැබේ.)

**සංලක්ෂ්‍යය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.9.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) හවායි බලා යාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්.

(ආ) උගැන්වීම හා පොත්පත්.

(ඉ) ආහාර සඳහා දීමනාවක් හා නවාතැන්.

(ඊ) සෞඛ්‍ය රක්ෂණය.

(උ) සුළු පෞද්ගලික දීමනාවක්.

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6 **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් හවායි බලා පිටත්ව යැමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් හවායිනි අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එසින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරා ගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1970 ජූලි 31 වැනි දින හෝ ඉන් පෙර ලැබෙනසේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු සි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුව ද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන් අදාල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අයදුම්පත් එවිය යුතුයි.

17. සියලුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අසිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූලි මස 7 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

7–558—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### III වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන දෙපාර්තමේන්තු අංශයේ III වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 1970.8.3 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් මා වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය : රු. 4,152—6×144—රු. 5,016 වාර්ෂික—ඒකාබද්ධ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු තාවකාලිකය ; බඳවා ගනු ලබන්නන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම් :**

(1) (i) රජයේ කම්හලේ හෝ වෙනත් ඒ හා සමාන රජයේ ආයතනයක පස් වසරක යාන්ත්‍රික ඉංජිනේරු හෝ යාන්ත්‍රික පරිපාලන ඕවර්සියර්වරයෙකු ලෙස ආධුනික පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

හෝ

(ii) ප්‍රායෝගික කාර්මික විද්‍යායතනයක අර්ධකාලීන දේශනයන් හදාරා ඇති සහ පිළිගත් පුද්ගලික ආයතනයක පස් අවුරුද්දක යාන්ත්‍රික ඉංජිනේරු ආධුනික පුහුණුවක් තිබීම.

හෝ

(iii) යාන්ත්‍රික—විදුලි, කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ ඇවුරුදු පාඨමාලාවක් සතුටුදායක ලෙස හදාරා තිබීම සහ ඊට අමතරව රජයේ දෙපාර්තමේන්තුවක යාන්ත්‍රික පරිපාලන ඕවර්සියර්වරයෙකු ලෙස (3) තුන් අවුරුදු කාලයක් තුල සේවයක් කර තිබීම.

සහ

(iv) සහකාර ෆෝර්මන් (යාන්ත්‍රික) තනතුරට පත් කිරීම සඳහා සුදුසුකම් ලැබෙන විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ විභාගයෙන් සමත්ව තිබීම.

(2) වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර 35 ට වැඩි නොවිය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ).

5. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත්වලට පහත සඳහන් ලියකියවිලි (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකය.

(iii) තම චරිතය පිළිබඳව මෑතදී ලබාගත් චරිත සහතික තුනක්. (දැනට රජයේ සේවයේ නියුක්ත අය විසින් එම සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

6. රජයේ සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලැබ නියමිත දිනට පසුව මෙම කායර්‍යාලයට ලැබෙන අයදුම්පත් ගැන සලකා බලන්නේ ඒවා නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් හා ප්‍රමාදයට සෑහෙන හේතු දක්වමින් ඔවුන් ඒවා පිළිගත යුතු යයි නිර්දේශ කරන්නේ නම් පමණි.

7. රජයේ සේවකයින්ගේ අයදුම්පත් සළකා බලනු ලබන්නේ නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා, නිලධාරියා පත්වීමක් ලැබීමට තෝරාගනු ලැබුවහොත් නිදහස් කරන බව සඳහන් කළහොත් පමණි.

8. අයදුම්පත් මගේ නමට හෝ මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට නොව, අධ්‍යක්ෂ, ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව, රත්මලාන, කියා එවිය යුතුය.

9. අයදුම්කරුවන් යම්කිසි නියමිත ස්ථානයකදී සහ වේලාවකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍යවනු ඇත. ඉල්ලුම් පත්වලට අමුණා එවන ලද සහතිකවල මුල් පිටපත්ම එම සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා හෝ ගෙවනු නොලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ පළමු වන කොටසේ සේවා තනතුරු සඳහා අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
අධ්‍යක්ෂ,
ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව.

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව,
රත්මලාන, 1970 ජූලි 7.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

### III ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුරු

### ජලසම්පාදන හා ජලපවහන දෙපාර්තමේන්තුව, රත්මලාන

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.
(ලිපිනයේ වෙනස්වීම් වහාම දැන්විය යුතුයි).

3. ජාතිය :————.
(ලාංකික වන්නේ පරම්පරාවෙන්ද, ලියා පදිංචිවීමෙන් නම් පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ සැසඳුම් අංකය හා දිනයත් සඳහන් කරන්න).

4. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න).
(ආ) ඉල්ලුම් පත් භාරගන්නා අවසන් දිනට නියම වයස : ————.

5. උපන් ස්ථානය :—
(ආ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. විවාහක අවිවාහක බව :————.

7. (i) අධ්‍යාපනික සුදුසුකම් :————.
(ii) වෘත්තීය සුදුසුකම් :————.
(iii) වෙනත් විශේෂ සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණන්න).

8. චරිත සහතික ලබාගත් අයගේ නම්, තනතුරු, ලිපිනයන් :—
(ii) ————.
(iii) ————.

9. පාසැලෙන් අස්වූවාට පසු කරන ලද රැකීරක්ෂා පිළිබඳ විස්තර :—
(i) දරණ ලද තනතුරු :————.
(ii) සේවා කාලය :————.
(iii) අස්වීමට හේතුව :————.

10. දැනට යෙදී සිටින රක්ෂාව :—
(i) තනතුර, ශ්‍රේණිය හා පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිත/රහිත බව :————.
(iii) දැනට ලබන මූලික වැටුප හා වැටුප් ක්‍රමය :————.

11. ගැසට් නිවේදනයේ 4 (i) ඡේදය යටතේ ලබා ඇති සුදුසුකම් පැහැදිලිව දක්වන්න :—
(i) ————.
(ii) ————.
(iii) ————.
(iv) ————.

මෙම අයදුම් පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරාගනු ලැබීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–668—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### ඇබෑර්තුවක්

රාජ්‍ය දැව සංස්ථාවේ කාර්මික සහකාර (මාර්ග) තනතුරක් සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

(අ) වැටුප් ක්‍රමය.—මසකට රු. 300—15×8/20×4—500 (සියළු දීමනා ඇතුළුව).

(ආ) වයස් සීමාව.—1970. 7. 28 දිනට අවුරුදු 30 ට අඩු විය යුතුය.

(ඇ) සුදුසුකම්.—(1) ප්‍රායෝගික කාර්මික ආයතනයේ කාර්මික කණිෂ්ඨ නිලධාරී සහතිකය (සිවිල්) හෝ ඊට සමාන සුදුසුකමක් සමග මාර්ග තැනීම සහ නඩත්තු කිරීමේ වැඩ පිළිබඳ අවුරුදු දෙකක පළපුරුද්දක් හෝ,

(2) ශුද්ධ ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ශුද්ධ ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළුව විෂයයන් 6 කින් එකවර ලබා ගත් අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) සමග මාර්ග තැනීම සහ නඩත්තු කිරීමේ වැඩ පිළිබඳ අවුරුදු 4 ක පළපුරුද්ද.

සාමාන්‍ය :

(1) තෝරා ගනු ලබන අයදුම් කරුවන් 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුයි.

(2) පත්වීම අවුරුදු 3 ක කාලයකට ආධුනික තත්ත්වයේ පවතිනු ඇති අතර තෝරා ගනු ලබන අයදුම්කරු සේවා අර්ථසාධක අරමුදලට වැටුපෙන් 5% බැගින් දායක මුදල් ගෙවිය යුතුවේ. සංස්ථාව විසින් 10% ක් ගෙවනු ලැබේ.

(3) රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම් පත් තම දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. එවැනි අවස්ථාවලදී අයදුම් පතේ පිටපතක් කෙළින්ම මෙහි එවිය හැකිය.

(4) අයදුම්කරුවන් විසින් (අ) වයස, (ආ) අධ්‍යාපන සුදුසුකම්, (ඇ) කාර්මික, වෘත්තීය සුදුසුකම් සහ (ඈ) පළපුරුද්ද ආදිය පැහැදිලිව සඳහන් කර ලියා පදිංචි තැපෑලෙන් තම අයදුම්පත් 1970. 7. 28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය. (සහතික පිටපත් ද අයදුම් පතට ඇමිණිය යුතුය.)

(5) අයදුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

සේවක කළමනාකාර,
රාජ්‍ය දැව සංස්ථාව.

30, අශෝක උයන,
කොළඹ 4. 1970. 6. 29.

7–626—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශයේ III වෙනි පංතියේ කාර්මිකයින්ගේ පුරප්පාඩු

ලංකා ගමනාගමන මණ්ඩලයේ පහත සඳහන් ඇබෑර්තු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් පමණක් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ :—

කම්මල් කරුවන්
පට්ටල් කරුවන්
බෙලෙක් වැඩ කරුවන්
වඩු කාර්මිකයින්
වාත්තු කරුවන්
විදුලි කාර්මිකයින්
වැද්දුම් කරුවන්
සර්විස් කරුවන්
වයර් සවිකරන්නන්

සුදුසුකම් :—

වයස—අවුරුදු 20–35 වත් අතර (1970.7.31 වෙනි දිනට).

අධ්‍යාපනය.—අවම වශයෙන් පස්වෙනි ශ්‍රෙණියේ සාමාර්ථයක් ලබා තිබීම.

පළපුරුද්ද.—පිළිගත් ආයතනයක අවම වශයෙන් අවුරුදු තුනක අඛණ්ඩ පළපුරුද්දක් තිබීම.

පඩි ක්‍රමය :—

සියළු දීමනාවන් ඇතුළුව මසකට රු. 185—5 × 18—275 දක්වා නගින පඩි ක්‍රමය අනුව මසකට රු. 185/- බැගින්.

අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා වෘත්තීය පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු තෝරා ගනු ලැබේ.

සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන් තමන්ගේ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 යෙහි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කර 1970 වේ ජූලි මස 31 වෙනි දිනට පෙර එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම් පස ' පීබීඇප් ' ශාඛාව යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.
1970 වේ ජූලි මස 5 වෙනි දින දීය.

### අයදුම් පත්‍ර ආකෘතිය

**ලංගම යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශයේ III වෙනි පංතියේ තනතුරු සඳහා අයදුම් පත්‍රය**

1. ඉල්ලුම් කරන තනතුර :————.
2. සම්පූර්ණ නම :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.
   1970.7.31 වෙනි දිනට වයස : අවුරුදු———— මාස————
   (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනුපිටපතක් අමුණන්න.)
5. අධ්‍යාපන සුදුසුකම් :————.
   (සමත්වූ ඉහළම ප්‍රමාණයත්, භාෂා මාධ්‍යයත්—එනම් සිංහලද, දෙමළද, ඉංග්‍රීසිද යන වගත් සඳහන් කරන්න.)
6. පළපුරුද්ද :————.
   (පිළිගත් ආයතනයේ නම සහ පළපුරුද්ද සඳහන් කළයුතු අතර සහතිකයේ පිටපතක් අමුණන්න.)

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, ලේඛණගත සාක්ෂි වලින් ඒවා සනාථ කළ හැකි බවත් මෙයින් සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව, මා තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට මා නුසුදුස්සෙකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලබන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–651—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීමසඳහා පැවැත්වෙන තරඟ විභාගය—1970

ඊ 1/70.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීම සඳහා 1970 වර්ෂයේදී කොළඹ දී පැවැත්වෙන විභාගයේ රෙගුලාසි මහජනයාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරනු ලැබේ.

අංක 14,908 සහ 1970 මැයි මස 29 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබූ මෙම විභාගය සම්බන්ධයෙන් වූ 1970 මැයි මස 8 වැනි දින දරණ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
කොළඹ,
1970 ජූලි මස 4 වැනි දින,

#### රෙගුලාසි මාලාව

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට බඳවා ගැනීම පිණිස විවෘත තරඟ විභාගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 1970 දෙසැම්බර් මාසයේදී හෝ ඊට තුදුරු දිනයක දී පවත්වනු ඇත. නියමිත දිනයන් පසුව දැනුම් දෙනු ලැබේ. මෙම විභාගය පොදු යහපත සලකා අවලංගු කළ යුතු යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැඟී ගියහොත් එසේ අවලංගු කිරීමේ බලය එම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. එසේම මෙම විභාගය කල් දැමීම අවශ්‍ය යයි පෙනී ගිය විටක එසේ කල් දැමීමේ බලය ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත්වේ.

2. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ලංකා පරිපාලන සේවයේ සහ ලංකා විදේශ සේවයේ පුරවනු ලබන ඇබැර්තු සංඛ්‍යාවත්, එම ඇබැර්තු පුරවනු ලබන දිනයත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථා කාලයේදී තීරණය කරනු ලැබේ. තවද, මහජන යහපත තකා කළයුතු යයි රාජ්‍ය සේ◌ා කොමිෂන් සභාව විසින් සලකතොත් පුරප්පාඩු කිසිවක් හෝ සියල්ලම හෝ නොපුරවා හැරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සියලු දෙනාම ලාංකිකයන් විය යුතුය. මෙම විභාගයේ පරමාර්ථයන් සඳහා ලාංකිකයෙකු යන්නෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු වන කෙනෙකි.

4. මෙම විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයින් 1970 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 22 ලබා තිබිය යුතු අතර වයස අවුරුදු 30 ලබා නොතිබිය යුතුය. පූර්වෝක්ත වයස් සීමාවන් රජයේ සේවයෙහි, රජයේ සංස්ථා සේවයෙහි සහ පළාත් පාලන සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන්ට අදාල වන්නේ නැත.

5. නියම කරන ලද සුදුසුකම් හිමි ස්ත්‍රී අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වන අතර පුරවනු ලබන ඇබැර්තු සංඛ්‍යාවෙන් සියයට 20 කට වැඩි ප්‍රමාණයක් ඔවුන් පත් කිරීමෙන් පුරවනු නොලැබේ.

6. විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය.

7. තමන් සෞඛ්‍ය තත්ත්වයෙන් හා චරිත ශුද්ධියෙන් යෝග්‍යයයන් බව අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තෘප්තියට හේතු වන පරිදි දක්විය යුතුය. තවද, ඔවුහු මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් හා හොඳට ඇස් පෙනීමෙන්ද දිවයිනේ කවර ප්‍රදේශයක වුවත් සේවය කිරීමට යෝග්‍ය කාය බලයකින්ද යුක්ත විය යුත්තෝය. විභාගයෙන් සමත්වන අපේක්ෂකයින්ට තමන් මෙකී කරුණු අතින් යෝග්‍යයයන් දැයි පරීක්ෂා කර බැලීම සඳහා පැවැත්වෙන දැඩි සෞඛ්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ඇත.

8. විවාහක අපේක්ෂිකයෙක්/අපේක්ෂිකාවක් වේ නම් ඔහු/ඇ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය නොමැතිව පත්වීමක් දෙනු ලැබීමට යෝග්‍ය නොවේ.

9. **විභාග ගාස්තුව පිළිබඳ විස්තර මෙසේය.**—තරඟ විභාගය සඳහා ගාස්තුව රු. 200 කි. මෙම විභාග ගාස්තුව, ආදායම් ශීර්ෂය VI, උප ශීර්ෂය 2, විෂය (4) ට බැරවන සේ අයදුම්පත් බාරගන්නා අවසාන දිනයට පෙර කොළඹ මහ භාණ්ඩාගාරයට හෝ ළඟම ඇති කච්චේරියට ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා කච්චේරියෙන් හෝ මහ භාණ්ඩාගාරයෙන් ලබා ගත් රිසිට් පත අයදුම්පත්‍රයෙහි අන්තිම පිටුවෙහි ඇලවිය යුතුය.

සටහන.—විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබුව හොත් අපේක්ෂකයින් විසින් ගෙවූ සම්පූර්ණ විභාග ගාස්තු ඔවුන්ට ආපසු ගෙවනු ලැබේ. විභාගයට පෙනී සිටීමට අවසර දීමෙන් පසුව කවර අවස්ථාවක කවර හේතුවක් නිසාවත් විභාගයෙන් ඉල්ලා අස්වන හෝ විභාගයට පෙනී නොසිටින අපේක්ෂක අපේක්ෂිකාවන්ට තමන් ගෙවූ විභාග ගාස්තුව සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ආපසු ලබා ගැනීමට අයිතියක් නොමැත.

(ආ) වෛද්‍ය පරීක්ෂණය සඳහා ගෙවිය යුතු ගාස්තුව රු. 10.50කි. මෙම ගාස්තුව ගෙවිය යුත්තේ කෙසේදැයි සමත්වූ අපේක්ෂකයින්ට පසුව දන්වනු ඇත.

10. (අ) තරඟ විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලබන්නේ, පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව හෝ සාමාන්‍ය උපාධි විභාගයකින් හෝ නැතහොත් යටත් පිරිසෙයින් තත්ත්වයෙන් එම විභාගයට සමානවූ වෙනත් විභාගයකින් සමත්වූ අපේක්ෂිකයින්ට/අපේක්ෂිකාවන්ට පමණකි.

(ආ) වාචික පරීක්ෂණයට ප්‍රථමයෙන් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් ස්වකීය උපාධි සහතික ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ඉහත සඳහන් සුදුසුකම් සතු අපේක්ෂක/අපේක්ෂිකාවන්ට පමණක් ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ සහ ලංකා විදේශ සේවයේ ඇබැර්තු සඳහා තරඟ කළ හැකිය. ලංකා පරිපාලන සේවය සහ ලංකා විදේශ සේවය අතුරෙන් තමන් වඩා කැමති සේවය, අපේක්ෂකයින් විසින් අයදුම්පතෙහි 18 වැනි ඡෙදයෙහි සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසු, සඳහන් කර ඇති කැමැත්තේ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. **ඉල්ලුම් කළ යුතු අන්දම.**—(අ) අයදුම්පත් පෝර්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් 1970 ජූලි 19 සිට අගෝස්තු 14 දින දක්වා ලබාගත යුතුය. අයදුම්පත්‍ර පෝර්ම ඉල්ලුම් කරන විට අයදුම්කරුවන් විසින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූ තම ලිපිනය ලියන ලද, මුද්දර නොගැසූ ලියුම් කවරයක් එවිය යුතුය. අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ තැපැලෙන් පමණි. පුද්ගලිකව මෙම කාර්යාලයට පැමිණ අයදුම්පත් ලබාගත නොහැකිය.

සටහන.—(i) අංක 14,908 සහ 1970 මැයි මස 29 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබූ 1970 මැයි මස 8 වැනි දින දරණ නිවේදනය අනුව දැනටමත් තම අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් ද සංශෝධිත රෙගුලාසිවලට අනුකූලව විභාගයට පෙනී සිටීමට කැමති වෙතොත් අළුතෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම අයදුම්පත් පහත 11 (ආ) ඡෙදය ප්‍රකාර 1970 අගෝස්තු 18 වැනි දින හෝ ඊට පෙර එවිය යුතුය. මුළු විභාගය සඳහා විභාග ගාස්තුව රු. 200 කි. එ බැවින් මෙම අයදුම්කරුවන් විසින් තවත් රු. 100 ක මුදලක් තැන්පත් කළ යුතුය. අංක 14,908 සහ 1970 මැයි මස 29 වැනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබූ 1970 මැයි මස 8 වැනි දින දරණ නිවේදනය අනුව ලැබුණු අයදුම්පත් අවලංගු කරන ලදැයි සලකනු ලැබේ. මෙම ගැසට් නිවේදනයට අනුකූලව අළුතෙන් අයදුම් පත්‍රයක් එවීමට යම් අයදුම්කරුවකු අපොහොසත් වෙතොත් ඔහු/ඇය කළින් අයදුම් පත්‍රයක් එවා ඇතත් විභාගයට පෙනී සිටීමට හිමිකම් නො ලබනු ඇත.

(ii) අංක 1 ,908 සහ 1970 මැයි මස 29 වැනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබූ 1970 මැයි මස 8 වැනි දින දරණ මගේ නිවේදනය අනුව දැනටමත් තම අයදුම්පත් එවා ඇත්තාවූද, එහෙත් සංශෝධිත රෙගුලාසිවලට අනුකූලව විභාගයට පෙනී සිටීමට අකමැති වන්නාවූ ද අයදුම්කරුවන් විසින් තම විභාග ගාස්තු ආපසු ගෙවන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තුමා වෙත ලියවිල්ලකින් ඉල්ලීමක් කරනු ලැබූ විට එම විභාග ගාස්තු ආපසු ගෙවනු ලැබේ. මෙම ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තුමා වෙත එවිය යුත්තේ 1970 අගෝස්තු 18 වැනි දින හෝ ඊට පෙරය. මෙම දිනට පසුව ලැබෙන ඉල්ලීම් බාරගනු නොලැබේ.

(ආ) අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැපැල් පෙට්ටිය අංක 500, කොළඹ, යන ලිපිනයට, 1970 අගෝස්තු, 18 වැනි න හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර, පාලන රෙගුලාසි 109 ප්‍රකාර, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය සංස්ථාවල සහ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් ද ස්වකීය ආයතන ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

(ඇ) අයදුම්පත් සියලු ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතුය. ඉල්ලා ඇති සියලුම තොරතුරු සපයා නොමැති නම්, ඉල්ලුම් පත්‍රය එහි සඳහන් ක ඇති තොරතුරු අනුව තීරණය කොට ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ඉ) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නො ලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතුවේ.

(ඊ) අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත් පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත් එහි සඳහන් කර ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මෙම කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සලකා බැලීම සම්බන්ධ ඔහුට ඇති අයිතිය අහිමි වේ.

12. විභාගයට පෙනී සිටීමට අනුමැතිය දීම පිළිබඳ සලකා බලනුයේ ඉල්ලුම්පත් ලැබීමෙන් පසුවය.

13. විවෘත තරඟ විභාගය සඳහා කිසිම අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට දෙවතාවකට වඩා පෙනී සිටිය නොහැක.

14. විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබූ සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ.

15. **හැඳුනුම් පත්.**—අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයන් සඳහා විභාග ශාලාවේදී පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් කවරක් හෝ පිළිගනු ඇත :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් ;

(ආ) මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද වලංගු ගමන් ප්‍රවේශ පත්‍රයක් ;

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරය පිට මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද දරන්නාගේ ඡායාරූපය අඩංගු කිසියම් සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන් කිසි ලියවිල්ලක්.

16. **වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම්**—මේ විභාගයට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙක් ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හා ඊට පසු යන කවර අවස්ථාවකදී වුව ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් ඔහුගේ දැනුම පරිදි වැරදි බව පෙනී යන ලද නම් හෝ ඔහු විසින් සවධ්‍යානයෙන්ම කිසියම් වැදගත් කාරණයක් වසන කරන ලද නම් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වනු ඇත.

17. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයෙහි ආරම්භයේ පළ කොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදල පොදු කොන්දේසි කෙරෙහි ඉල්ලුම්කරුවන්ගේ සැළකිල්ල යොමු කරවනු ලැබේ.

### ලංකා පරිපාලන සේවයේ V වැනි පංතියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීමේ විවෘත තරඟ විභාගය

### විභාග පරිපාටිය

මාධ්‍යය.—මෙම තරඟ විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(අ) **අනිවාර්‍ය විෂයයන්.**—රචනය, සාරාංශය හා සාමාන්‍ය දැනීම—අපේක්ෂකයින් විසින් මෙම විෂයයන් ගන්නා භාෂා මාධ්‍යය සඳහන් කළ යුතුය. අපේක්ෂකයින් විසින් අනිවාර්‍ය විෂයයන්ට එක් භාෂා මාධ්‍යයකින් පමණක් පෙනී සිටිය යුතුය. අපේක්ෂකයින් විසින් අනිවාර්‍ය විෂයයන්ට පෙනී සිටින භාෂා මාධ්‍යය, ඔවුන් රාජ්‍ය සේවයට ඇතුළු වන භාෂා මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

(ආ) **වෛකල්පික විෂයයන්**—(i) යම් අපේක්ෂකයෙකු විසින් තෝරා ගනු ලබන විෂයයන්, ඔහු/ඇය විසින් එය උපාධිය ලබාගැනීමේදී සාමාර්ථය ලත් විෂයයක් වුවහොත් එම විෂයය උපාධිය සඳහා ගන්නා ලද භාෂා මාධ්‍යයෙන්ම ගත යුතුයි.

(ii) අන් සෑම විෂයයකදීම, ඒ ඒ විෂයයන් සඳහා පෙනී සිටීමට වඩාම කැමති කුමන මාධ්‍යයකින් ද යන්න අනු පිළිවෙලින් දක්විය යුතුයි. මෙම විෂයයන්ට පෙනී සිටීමේ මාධ්‍යය කොමිෂන් සභාව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇත.

මෙම විභාගයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ. එක් එක් විෂයය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය ඒ ඒ විෂයයට ඉදිරියෙන් දැක්වේ :—

'' අ '' කොටස—සියලුම අපේක්ෂකයන්ට අනිවාර්යය

| | | ලකුණු |
|---|---|---|
| 1. | වාක්‍ය රචනය ... ... ... ... ... | 100 |
| 2. | සාරාංශය ... ... ... ... ... | 50 |
| 3. | සාමාන්‍ය දැනීම ... ... ... ... ... | 150 |
| 4. | වාචසික පරීක්ෂණය (සාමාන්‍ය) ... ... ... ... | 250 |

**" බී " කොටස—වෛකල්පික විෂයයෝ—මුළු ලකුණු සංඛ්‍යාව 600 ක් වන පරිදි මෙම කොටසෙහි දක්වෙන විෂයයන් අතුරෙන් සුදුසු විෂයයන් ගණනක් අපේක්ෂකයන් විසින් ගත යුතුය**

| | | | | ලකුණු |
|---|---|---|---|---|
| 5. | සිංහල | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 6. | සිංහල | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 7. | දෙමළ | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 8. | දෙමළ | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 9. | අරාබි | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 10. | අරාබි | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 11. | සංස්කෘත | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 12. | සංස්කෘත | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 13. | පාලි | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 14. | පාලි | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 15. | ඉංග්‍රීසි | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 16. | ඉංග්‍රීසි | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 17. | ලතින් | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 18. | ග්‍රීක් | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 19. | සම්භාවිත සාහිත්‍ය | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 20. | ප්‍රංශ භාෂාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 21. | ඉතිහාසය | පහළ කොටස | පත්‍ර හතරකින් දෙකක් | 200 |
| 22. | ඉතිහාසය | ඉහළ කොටස | පත්‍ර අටකින් හතරක් | 400 |
| 23. | ආර්ථික විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 24. | ආර්ථික විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර දහයකින් හතරක් | 400 |
| 25. | දේශපාලන විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 26. | දේශපාලන විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 27. | සමාජ විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 28. | සමාජ විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර පහකින් හතරක් | 400 |
| 29. | භූගෝල විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 30. | භූගෝල විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 31. | පුරා විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 32. | පුරා විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 33. | මානව විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 34. | බෞද්ධ සංස්කෘතිය | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 35. | බෞද්ධ සංස්කෘතිය | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 36. | දර්ශන ශාස්ත්‍රය | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 37. | දර්ශන ශාස්ත්‍රය | ඉහළ කොටස | පත්‍ර හයකින් හතරක් | 400 |
| 38. | ශුද්ධ ගණිතය | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 39. | ප්‍රායෝගික ගණිතය | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 40. | ගණිතය | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 41. | භෞතික විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 42. | භෞතික විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 43. | රසායන විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 44. | රසායන විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 45. | උද්භිද විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 46. | උද්භිද විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 47. | සත්ත්ව විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි | 200 |
| 48. | සත්ත්ව විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි | 400 |
| 49. | රාජ්‍ය පරිපාලන විද්‍යාව | | පත්‍ර එකයි | 100 |
| 50. | රාජ්‍ය මූල්‍ය | | පත්‍ර එකයි | 100 |
| 51. | ව්‍යාපාර පරිපාලනය | | පත්‍ර එකයි | 100 |
| 52. | පරිපාලන විද්‍යා මූලධර්ම | | පත්‍ර එකයි | 100 |
| 53. | අලෙවි කිරීම | | පත්‍ර එකයි | 100 |
| 54. | අධ්‍යාපන මනෝවිද්‍යාව | | පත්‍ර දෙකයි | 200 |
| 55. | අධ්‍යාපනික මූලධර්ම | | පත්‍ර එකයි | 100 |
| 56. | තුලනාත්මක අධ්‍යාපනය | | පත්‍ර එකයි | 100 |
| 57. | පුද්ගල හා දේපල නීතිය | | පත්‍ර එකයි | 100 |
| 58. | බැඳීම් නීතිය | | පත්‍ර එකයි | 100 |
| 59. | රෝම නීතිය | | පත්‍ර එකයි | 100 |
| 60. | රාජ්‍ය විධි නීතිය | | පත්‍ර එකයි | 100 |
| 61. | ජාත්‍යන්තර නීතිය | | පත්‍ර එකයි | 100 |
| 62. | නීති විද්‍යාව හා නෛතික සිද්ධාන්තය | | පත්‍ර එකයි | 100 |
| 63. | අපරාධ නීතිය | | පත්‍ර එකයි | 100 |

**" සී " කොටස—ලංකා විදේශ සේවා අපේක්ෂකයින් සඳහා අනිවාර්යයි**

| | | |
|---|---|---|
| 64. | වාචික පරීක්ෂණය (විශේෂ) | 150 |

**සංලක්ෂ්‍යය.**—(i) ස්වාභාවික විද්‍යා විෂයයන්ට (41 සිට 48 දක්වා විෂයයන්) පෙනී සිටින අපේක්ෂකයන් විශ්ව විද්‍යාල තත්ත්වයේ ආයතනයක රසායනාගාර පුහුණුවක් ලැබූ බවට එම ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය.**—(ii) භූගෝල විද්‍යාව ගන්නා බාහිර හා පුද්ගලික අපේක්ෂකයන් තමන් විශ්ව විද්‍යාල තත්ත්වයේ ආයතනයක ප්‍රායෝගික පුහුණුවක් ලැබූ බවට එම ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය.**—(iii) ඒ ඒ විෂයය අරභයා අපේක්ෂකයන්ට දෙනු ලබන ලකුණුවලින් හුදු නොගැඹුරු දැනුමක් නිසා ලකුණු ලබාගැනීමට ඉඩ නොතබනු පිණිස අඩු කිරීම අවශ්‍ය වේ යයි පරීක්ෂකයින් විසින් සැලකෙන ලකුණු ප්‍රමාණයක් අඩු කරනු ඇත.

**සංලක්ෂ්‍යය.**—(iv) යම්කිසි අපේක්ෂකයකුගේ අත් අකුරු පහසුවෙන් කියවා ගැනීමට තරම් පැහැදිලි නොවේ නම් ඔහුට/ඇයට ලැබිය යුතු මුළු ලකුණු ප්‍රමාණයෙන් සැලකිය යුතු තරම් වූ ලකුණු ප්‍රමාණයක් ඒ සඳහා අඩු කරනු ඇත.

**සංලක්ෂ්‍යය.**—(v) භාෂාවට විශේෂයෙන් කැපවූ 1 වැනි විෂයය සම්බන්ධයෙන් පමණක් නොව විභාගයේ අන්‍ය සියලුම විෂයයන් සම්බන්ධයෙන්ද පිළිතුරු ලිවීමේදී වාග් බාහුල්‍යයෙන් තොරවූත් නිරවුල්වූත් ප්‍රාණවත්වූත් නිවැරදිවූත් බස් වහරට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—(vi) අපේක්ෂකයන් විසින් ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වාචික පරීක්ෂණ පවත්වන මණ්ඩලවලට දෙනු නොලැබේ.

## නිර්දේශ මාලාව

**විශෙෂයෙන් සඳහන් කොට නැතිනම් සෑම ප්‍රශ්න පත්‍රයකටම නියමිත කාල සීමාව පැය තුනකි**

**" ඒ " කොටස**

1. **වාක්‍ය රචනය.**—නියම කරන ලද විෂයයන් 4ක් හෝ 5ක් අතරින් එකක් තෝරා ගෙන රචනය ලිවීම, විශේෂ උගෙනීම් ක්ෂෙත්‍රයකට මේ රචනා විෂයයන් සම්බන්ධිත නොවන අතර ඒ සම්බන්ධිතවනුයේ අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනීම හා ඥනය, ප්‍රකාශ කිරීමට හා සිතීමට ඇති හැකියාව පරීක්ෂණයට භාජනය කරනු සඳහාය. වාක්‍ය රචනයේ තත්ත්වය විසඳනවා ඇත්තේ තමා තෝරා ගත් මාතෘකා පැහැදිලි කිරීමේදී අනුගමනය කරන කල්පනා ශක්තිය හා නිවහල් භාවය අනුව මෙන්ම එහි භාෂා විලාශය, ශෛලිය හා සකස් කිරීම අනුවය. මෙය පැහැදිලිව මෙන්ම කියවිය හැකි සේ ලිවිය යුතුය.

සංලක්ෂ්‍යය.—(ඒ) මාතෘකාවට එකඟතාවය හා (බී) පැහැදිලි භාවය වෙත ඇති අගය කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. ලිවීම් ආරම්භ කරන්නට ප්‍රථමයෙන් විෂය ගැන සිතා මතා එහි ඇතුලත් වියයුතු දේ හා එහි අවශ්‍යතාවය ගැනද සිතිය මනාය. විෂය සුපරීක්ෂාකාරීව විභාග කර බැලීම, කල්පනා කිරීමේ තත්ත්වය හා ලියන දේ සම්බන්ධයෙන් විශේෂතාවයක් දක්වනු ලැබේ.

2. **සාරාංශය.**—මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය එක් පැයකි. මෙහි ලා අපේක්ෂකයන් විසින් කළ යුත්තේ ප්‍රශ්න පත්‍රයට ඇතුළත් ගද්‍ය පාඨයෙහි හෝ පාඨ කිහිපයෙහි ගැබ් වූ අදහස් වඩාත් සම්පිණ්ඩය කොට දක්වීමය.

3. **සාමාන්‍ය දැනීම.**—වර්තමානයෙහි සංස්කෘතික, සාමාජික, ආර්ථික, දේශපාලනමය හා විද්‍යාත්මක විෂයයන් සම්බන්ධයෙන් පොදු වැදගත් කම්න් යුතු කරුණු පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රයකි. අපේක්ෂකයන්ට තමන් කැමති ප්‍රශ්න පමණක් තෝරා ගැනීමට හැකිවන අයුරින් මෙම ප්‍රශ්න පත්‍රයට ප්‍රශ්න රාශියක් ඇතුළත් වෙනු ඇත.

4. **වාචසික පරීක්ෂණය (සාමාන්‍ය).**—අපේක්ෂකයා මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ. මෙම මණ්ඩලය මගින් අපේක්ෂකයා පරීක්ෂාවට භාජන කරනුයේ ඔහුගේ ජීවිත චර්යාව පිළිබඳ විස්තර සටහනක් ද තමන් වෙත ඇතිවය. සම්මුඛ පරීක්ෂණයේදී ඔහුගෙන් පොදු වැදගත් කම්න් යුතු කරුණු ගැන ප්‍රශ්න අසනු ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයෙහි පරමාර්ථය වනුයේ අපේක්ෂකයා ඇතුළත්වීමට අදහස් කරන සේවාව සඳහා ඔහු තුළ ඇති යෝග්‍යතාව ගැන විමසා බැලීමය. පරීක්ෂක මණ්ඩලය තමන්ගේ තීරණයන්ට එළඹීමේ දී අපේක්ෂකයා විසින් ප්‍රකට කළ බුද්ධිය, මානසික ප්‍රබෝධය, චරිත ශක්තිය හා චරිත බලය, නායකත්වයෙහි ලා ඔහු තුළ පවත්නා ශක්තිය ද ගැන විශේෂ අවධානයක් දක්වනු ඇත. වාචසික පරීක්ෂණ වලට කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයෙන් සෑහෙන උසස් තත්වයක් ලබාගන්නා අපේක්ෂකයින් පමණකි.

**" බී " කොටස—වෛකල්පික විෂයයන්**

5. **සිංහල (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි—12 වැනි සිය වසෙහි සිට අද දක්වා ලියවුණු ගද්‍යමය ගැටපද සන්න, නිඝණ්ඩු හා පැරණි ගී කාව්‍ය ද හැර අන්‍ය සිංහල ග්‍රන්ථ ; මෙම ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් කොටස් ලිහිල් බසින් ලිවීම හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න ද ඇතුළත් වේ.

12 වැනි සියවසේ සිට නූතන සමය දක්වා සිංහල සාහිත්‍යයේ ඉතිහාසය සංක්ෂෙපයෙන් ; ගද්‍ය රචනය.

6. **සිංහල (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරකි—සිංහල සෙල් ලිපි ; සීගිරි පවුරු ලිපි ; ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ. මෙම ග්‍රන්ථයන්ගෙන් උපුටාගත් කොටස් ලිහිල් බසින් ලිවීම හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න ද ඇතුළත් වේ.

වාක්‍ය රචනයක් ; ඉංග්‍රීසියෙන් සිංහලට හා සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; සාහිත්‍ය විචාරය.

ආදිම කාලයේ සිට අද දක්වා සිංහල සාහිත්‍යයේ ඉතිහාසය ; සිංහල භාෂාවේ ඉතිහාසය.

ආගමෙහි හා (චිත්‍ර, මූර්ති හා නිර්මාණ) කලාවෙහි දියුණුව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව සිංහලයින්ගේ සංස්කෘතිය හා සභ්‍යත්වය.

7. **දෙමළ (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි—මධ්‍යම කාලීන හා නූතන ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් කොටස් පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු ද පිළිබඳ ප්‍රශ්න.

ආදිම කාලයේ සිට ද්‍රවිඩ සාහිත්‍යයේ ඉතිහාසය ; ගද්‍ය රචනය.

8. **දෙමළ (ඉහළ කොටස.)**—ප්‍රශ්න පත්‍ර හතරකි—දෙමළ සෙල්ලිපි වලින් හා පැරණිතම දෙමළ ග්‍රන්ථ වලින් උපුටා ගත් කොටස් පරිවර්තනය කිරීම, සාහිත්‍ය විචාරය, දෙමළ භාෂා ඉතිහාසය ; ජන්දෝලංකාර හා කාව්‍ය ශාස්ත්‍රය.

ද්‍රවිඩ වර්ගයා පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව ආදිම යුගයේ සිට 19 වැනි සියවසේ අවසානය දක්වා ද්‍රවිඩ සභ්‍යත්වයේ ඉතිහාසය.

මුල් කෘතීන් ආශ්‍රයෙන් ගෙනහැර දක්වන සාධකවලට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

9. **අරාබි (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි—පශ්චාත් ඉස්ලාමීය යුගයට අයත්වූත් නූතන යුගයට අයත්වූත් අරාබි පොත්වලින් උපුටා ගත් කොටස් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; ඒවායේ අන්තර්ගත කරුණු හා ව්‍යාකරණ පිළිබඳ ප්‍රශ්න.

අරාබි භාෂාමය ගද්‍ය රචනය ; අරාබි සාහිත්‍යයේ ඉතිහාසය.

10. **අරාබි (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරකි—සප්ත මුඅල්ලක්වාත් ද ඇතුළු පූර්ව ඉස්ලාමීය, අපර ඉස්ලාමීය හා මධ්‍යතන යුගයේ ග්‍රන්ථවලින් උපුටා ගත් කොටස් පරිවර්තනය ; ඒවායේ ව්‍යාකරණ විධීන් පිළිබඳ ප්‍රශ්න.

අරාබි සාහිත්‍යයේ ඉතිහාසය හා දෙන ලද මාතෘකා කිහිපයක් අතුරෙන් එකක් අනුව අරාබි භාෂාවෙන් රචනයක් ලිවීම ; කාව්‍ය ශාස්ත්‍රය හා මාත්‍ර ලකුණු කිරීම.

ඉස්ලාමීය සභ්‍යත්වය.

සෙමිටික් ආගම් ඉතිහාසය ; දේවකථා හා පූර්ව ඉස්ලාමීය අරාබියානු චින්තනය පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව.

මූල කෘති ආශ්‍රයෙන් දක්වන සාධකයන්ට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

11. **සංස්කෘත (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි—වෛදික හා පැරණි සංස්කෘත සාහිත්‍ය කෘතිවලින් උපුටා ගත් සරල කොටස් පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

සංස්කෘත සාහිත්‍යය ඉතිහාසය, ජන්දෝලංකාර හා කාව්‍ය ශාස්ත්‍රය හා දේවනාගරී අකුරෙන් ගද්‍ය රචනය.

12. **සංස්කෘත (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරකි—දර්ශනික හා ප්‍රාවෛධික සාහිත්‍ය කෘතීන්ද ඇතුළු වෛදික හා පැරණි සංස්කෘත ග්‍රන්ථවලින් උපුටා ගත් දුෂ්කර තත්ත්වයේ පාඨයන් පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

දෙන ලද මාතෘකා කිහිපයක් අතුරෙන් එකක් අනුව රචනයක් ලිවීම. තරමක් දුෂ්කර ඡෙදයක් සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම හෝ පද්‍ය රචනය. රචනයක් ලිවිය යුත්තේ දේවනාගරී අකුරෙනි.

වෛදික, දර්ශනික හා ප්‍රාවෛධික සාහිත්‍යයේ ඉතිහාසය හා වෛධික යුගයේ පුරාවස්තු ; මේ හා සම්බන්ධ පුරා විද්‍යාත්මක සොයාගැනීම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ.

ඉන්දියානු ආගම, දේවකථා, දර්ශනවාදය හා ඉන්දියා චින්තාවේ ඉතිහාසය ආරම්භයේ සිට ක්‍රි. ව. 1200 පමණ දක්වා.

මූලාශ්‍රයන් පිළිබඳ දැනුමට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

13. **පාලි (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි—ප්‍රකරණ සාහිත්‍යය හැර පිටක සාහිත්‍යයෙන් හා පශ්චාත්පිටක සාහිත්‍යයෙන් ද උපුටාගත් සරල කොටස් පරිවර්තනය ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

ගද්‍ය රචනය, ලංකාවේ පාලි සාහිත්‍යයේ ඉතිහාසය හා ලංකාවේ බෞද්ධ ඉතිහාසය.

14. **පාලි (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරකි—අභිධර්ම හා ප්‍රකරණ සාහිත්‍යයද ඇතුළු වඩාත් දුෂ්කර පිටක සාහිත්‍ය කෘතීන්ගෙන් උපුටා ගත් පාඨ පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා,අන්තර්ගත කරුණු, ව්‍යාකරණය හා වාග් විද්‍යාවද පිළිබඳ ප්‍රශ්න ; තත්කාලීන ඉන්දීය දර්ශනවාදය හා සම්බන්ධ කොට බෞද්ධ ධර්මය පිළිබඳව ලබාගත් දැනුමක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

නියමිත මාතෘකා කිහිපයක් අතුරෙන් එකක් අනුව වාක්‍ය රචනයක් ලිවීම හෝ ඒ වෙනුවට සුදුසු ග්‍රන්ථයකින් උපුටා ගත් කොටසක් පාලි ගද්‍යයට හෝ පද්‍යයට නැගීම.

පාලි සාහිත්‍යයේ ඉතිහාසය හා පුරාවස්තු : බෞද්ධ චින්තනයේ ඉතිහාසය ; මහායානය පිළිබඳ සංක්ෂිප්ත දැනුමක් අවශ්‍යය.

මූල කෘතීන් පිළිබඳ දැනුමට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

15. ඉංග්‍රීසි (පහළ කොටස).—ප්‍රශ්න පත්‍ර දෙකකි—ෂේක්ස්පියර්, ඩ්‍රයිඩන්, පෝප්, ආචාර්ය ජොන්සන්, බ්ලේක්, වර්ඩ්ස්වර්ත් ; ජේන් ඔස්ටන්, කීට්ස් යන ලේඛකයන් පිළිබඳ විශේෂ අවධානයකින් යුතුව 1600 සිට 1832 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය.

ටෙනිසන්, ආර්නෝල්ඩ්, තෝමස් හාඩි, ෂෝ, කොන්රඩ්, ටී. එස්. එලියට්, ඩී. එච්. ලෝරන්ස්, යන ලේඛකයින් අතුරෙන් සිව් දෙනෙකු පිළිබඳ විශේෂ අවධානය කින් යුතුව 1832 සිට නූතන කාලය දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය.

විශේෂ අවධානයකින් යුතුව උගත යුතු ලෙස දක්වා ඇති ලේඛකයින්ගේ කෘතීන් සියල්ලම පිළිබඳ සවිස්තර දැනුමක් හෝ ඔවුන්ගේ කෘතිවලින් උපුටා ගත් කොටස් වෙන්කොට හඳුනා ගැනීමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තුවනු නොලැබේ. නිදසුනක් වශයෙන් ෂේක්ස්පියර්ගේ කෘති යනු වෙන් අදහස් කෙරෙනුයේ ඔහු ලියූ විවිධ ස්වරූපයේ කෘතීන් අතර වඩාත් ප්‍රකට වූ විශේෂ ලක්ෂණ සහිත කෘතීන් පිළිබඳ දැනුමක් ; උද : සුඛාන්ත කෘති අතුරෙන් As You Like It ද, දුක්ඛාන්ත කෘති අතුරෙන් King Lear ද පසු කාලයේ ලියූ නාට්‍ය කෘතීන් අතුරෙන් The Tempest ද ආදි වශයෙනි. විශේෂයෙන් හදළ යුතු සේ නියමිත ලේඛකයන්ගේ කෘතීන් සම්බන්ධයෙන් අපේක්ෂකයින් විසින් ලියන පිළිතුරුවලට එම ලේඛකයන්ගේ ප්‍රධාන කෘතීන්ගෙන් තෝරා ගත් කොටස් ද නිදසුන් වශයෙන් උපුටා දක්විය යුතුය. පහළ කොටසට ඇතුළත්වන, පොදුවේ දළ වශයෙන් බෙදුණු පූර්වෝක්ත යුග දෙකෙහි සාහිත්‍යයේ දියුණුව පිළිබඳ දැනුමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තුවනු නොලැබේ. එසේ වුවද තමන් කෙරෙහි භාෂාව පිළිබඳ මනා පරිචයක් ඇති බැව් ස්වකීය පිළිතුරු මගින් විදහා දක්වීමක් ඔවුන්ගෙන් බලාපොරොත්තුවනු ලැබේ.

16. ඉංග්‍රීසි (ඉහළ කොටස).—ප්‍රශ්න පත්‍ර හතරකි—චෝසර්, ස්පෙන්සර්, ෂේක්ස්පියර්, බෙන් ජොන්සන්, ඩොන්, මිල්ටන්, වෙබ්ස්ටර් යන මොවුන් පිළිබඳ විශේෂ අවබෝධයකින් යුතුව 1550—1660 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය.

1660 සිට 1798 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය—ඩ්‍රයිඩන්, පෝප්, ස්විෆ්ට්, ඇඩිසන්, ආචාර්ය ජොන්සන්, fපිල්ඩින්, බර්ක් යන මොවුන් පිළිබඳ විශේෂ අවබෝධයක් අවශ්‍ය වේ.

1798 සිට 1880 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය—වර්ඩ්ස්වර්ත්, කීට්ස්, ෂෙලි, ජේන් ඔස්ටන්, ටෙනිසන්, ආර්නෝල්ඩ්, ඩිකන්ස් යන මොවුන් ගැන විශේෂ අවබෝධයක් අපේක්ෂා කරනු ලැබේ.

1880 සිට අද දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය—හොප්කින්ස්, ෂෝ, කොන්රඩ්, ජොයිස්, ඩී. එච්. ලෝරන්ස්, ඊ. ඇම්. පෝර්ස්ටර්, ටී. ඇස්. එලියට් යන මොවුන් පිළිබඳ විශේෂ අවබෝධයක් අවශ්‍ය වේ.

විශේෂයෙන් උගත යුතු සේ ඉහතින් තෝරා දක්වුණු කොටස් එක එකින් යටත් පිරිසෙයින් ලේඛකයන්ට සිව් දෙනෙකු ගැනවත් විශේෂ දැනුමක්ද එසේම එකී එක් එක් ලේඛකයාගේ කෘතීන්ගෙන් උපුටා ගත් කොටස් හඳුනාගැනීමට හා විවේචනය කිරීමට ඇති දක්ෂතාව පරීක්ෂා කරනු පිණිස දෙනු ලබන අනිවාර්ය ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමක් (අන්‍ය ප්‍රශ්නවලට වැඩියෙන් මෙම ප්‍රශ්නයට ලකුණු දෙනු ලැබේ.) අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තුවනු ලැබේ. උගත යුතු සේ නියමිත එක් එක් සාහිත්‍ය යුගයෙක මූලික සාහිත්‍ය ප්‍රවීණතාවයන්ගෙන් එකක විශේෂ ලක්ෂණ ප්‍රකට කොට දක්වෙන පාඨයක් ඇසුරු කොට ගෙන පිළිතුරු ලිවිය යුතු ප්‍රායෝගික විචාරය පිළිබඳ ප්‍රශ්නයක්ද ඇතුළත් වේ. එම සාහිත්‍ය යුගයෙහි සාමාජික හා සාහිත්‍යයික පසුබිම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය සේ සලකනු ලැබේ. මෙම විෂය ගන්නා අපේක්ෂකයන් ඉංග්‍රීසි භාෂා විෂයෙහිලා මනා පරිචයක් තමන් සතුව ඇති බවද එම සාහිත්‍යයේ ප්‍රධාන කෘතීන් සුපරීක්ෂාවෙන් කියවා ඇති බවටද සාක්ෂ්‍ය ප්‍රකට කළ යුතුය.

17. ලතින් (පහළ කොටස).—ප්‍රශ්න පත්‍ර දෙකකි—ලතින් පොත්වලින් උපුටා ගත් අනියමිත කොටස් පරිවර්තනය ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

ගද්‍ය රචනය හා ලතින් සාහිත්‍යයේ ඉතිහාසය.

18. ග්‍රීක් (පහළ කොටස).—ප්‍රශ්න පත්‍ර දෙකකි—ග්‍රීක් පොත්වලින් උපුටාගත් අනියමිත කොටස් පරිවර්තනය ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

ගද්‍ය රචනය හා ග්‍රීක සාහිත්‍යයේ ඉතිහාසය.

19. සම්භාවිත පුරාණ සාහිත්‍ය (ඉහළ කොටස).—ප්‍රශ්න පත්‍ර හතරකි—ග්‍රීක් පොත්වලින් උපුටා ගත් දුෂ්කර තත්ත්වයේ අනියමිත කොටස් පරිවර්තනය හා ග්‍රීක බසින් ගද්‍ය හා/හෝ පද්‍ය රචනය (ප්‍රශ්න සත්‍ර 1යි).

ලතින් පොත්වලින් උපුටා ගත් දුෂ්කර තත්ත්වයේ අනියමිත කොටස් පරිවර්තනය හා ලතින් බසින් ගද්‍ය හා/හෝ පද්‍ය රචනය (ප්‍රශ්න පත්‍ර 1යි).

ග්‍රීක හා රෝම සභ්‍යත්වයේ ඉතිහාසය, සාහිත්‍යය, භූගෝල විද්‍යාව හා සාමජික, දේශපාලනික, සාමාජික හා දර්ශනික දියුණුව (ප්‍රශ්න පත්‍ර 2යි).

රෝම ඉතිහාසයෙහි ලා ක්‍රි.පූ. 133 සිට ක්‍රි. පූ. 43 දක්වා කාල පරිච්ඡේදයත්, ලතින් සාහිත්‍ය විෂයෙහි ලා සිසරෝනියානු හා ඔගස්තීනු යුගයත් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත. ග්‍රීක ඉතිහාසය විෂයෙහි ක්‍රි. පූ. 510 සිට ක්‍රි. පූ. 430 දක්වා කාල පරිච්ඡේදයත්, ග්‍රීක සාහිත්‍ය විෂයෙහි ඇටික් නාට්‍ය කරුවන් හා ලේඛකයින් කෙරෙහිත් විශේෂ අවධානය යොමු කරනු ලැබේ. මූල කෘති පිළිබඳ දැනුමට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

20. ප්‍රංශ භාෂාව (පහළ කොටස).—ප්‍රශ්න පත්‍ර දෙකකි —

(I) ප්‍රශ්න පත්‍රය.—17 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වාවූ ප්‍රංශ සාහිත්‍යයෙන් උපුටා ගත් අනියමිත පාඨ පරිවර්තනය ; ඒවායේ ශෛලිය හා අන්තර්හත කරුණු පිළිබඳ ප්‍රශ්න ; ගද්‍ය රචනය.

(II) ප්‍රශ්න පත්‍රය.—මොලියර්, රේසීන්, රූසෝ, හ්‍යුගෝ, ප්ලෝබා, බොඩ්ලියර්, ගිඩේ, ගිරෝඩෝ යන මේ ලේඛකයන් අතුරෙන් සිව් දෙනකු කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව 17 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා ප්‍රංශ සාහිත්‍යය.

විශේෂයෙන් උගෙනීමට නියමිත ලේඛකයන් පිළිබඳ ප්‍රශ්නයන්ට සැපයෙන පිළිතුරුවලින් ඔවුන්ගේ ප්‍රකට ලක්ෂණ සහිත කෘතීන් අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ පිළිබඳ සවිස්තර අවබෝධයක් පළ විය යුතුය. අන්‍ය ප්‍රධාන ගණයේ ලේඛකයන් පිළිබඳ වූ වඩාත් පොදු ස්වරූපයේ ප්‍රශ්න තෝරා ගැනීමටද අපේක්ෂකයන්ට අවස්ථාව ලැබේ. එක් ප්‍රශ්නයකට ප්‍රංශ බසින් පිළිතුරු සැපයිය යුතුය.

21. ඉතිහාසය (පහළ කොටස).—ප්‍රශ්න පත්‍ර දෙකකි—ප්‍රශ්න පත්‍ර හතරක් ඇතත් අපේක්ෂකයන් විසින් ගත යුත්තේ ඉන් දෙකක් පමණි. ඉන් අඩුවෙන් හෝ වැඩියෙන් ගතයුතු නොවේ.

I පත්‍රය.—ඉන්දියා ඉතිහාසය, ක්‍රි. ව. 320 දක්වා.

II පත්‍රය.—ලංකා ඉතිහාසය.

III පත්‍රය.—යුරෝපා ඉතිහාසය, 1789 සිට.

IV පත්‍රය.—ඉන්දියානු අර්ධද්වීපයේ ඉතිහාසය හෝ 1707 සිට 1947 දක්වා ඉන්දියානු ඉතිහාසය.

22. **ඉතිහාසය (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරකි—ප්‍රශ්න පත්‍ර අටක් ඇත. එහෙත් අපේක්ෂකයන් විසින් ගත යුත්තේ ඉන් තමන් කැමති හතරක් පමණි :

1 පත්‍රය.—ඉන්දියා ඉතිහාසය, 320–1050.

2 පත්‍රය —ඉන්දියා ඉතිහාසය, 1050–1526.

3 පත්‍රය.—ඉන්දියානු දේශපාලන වාද, සමාජවාද හා සංසථා.

4 පත්‍රය.—ඉන්දියාවෙන් පිටතවූ ඉන්දියානු යටත් විජිත කටයුතු හා සංස්කෘතික කටයුතු.

5 පත්‍රය.—1760 සිට බ්‍රිතාන්‍ය ඉතිහාසය.

6 පත්‍රය.—බ්‍රිතාන්‍ය යටත් විජිත ඉතිහාසය.

7 පත්‍රය.—යුරෝපීය දේශපාලන චින්තාවේ ඉතිහාසය.

8 පත්‍රය.—ලංකා ඉතිහාසය, 1796 සිට.

23. **ආර්ථික විද්‍යාව (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි—අර්ථ නිරූපනය, විෂය සීමාව හා ක්‍රමය, ආර්ථික ක්‍රම, නිෂ්පාදන වාදය, එළඳයී ව්‍යාපාර යන්ගේ විවිධ ස්වරූප, වික්‍රය, විධානය, මිල නිර්ණය, ඒකාධිකාරයෙහි හා තරඟයෙහි ප්‍රතිඵල, එහි ප්‍රමාණය නිර්ණය කෙරෙනු ජාතික ආදායම් බලවේග ඉතුරු කිරීම හා ආයෝජන මගින් කෙරෙන සේවය, ජාතික ආදායම බෙදී යාම, ආර්ථික ජීවිතයෙහි ලා රජය මගින් කෙරෙන සේවය, පොදු මුදල් කටයුතු ඇතුළු ආර්ථික විද්‍යාවේ මූල ධර්ම.

මුදල්වල ස්වභාව හා අර්ථ නිර්ණය, මිල වෙනස්වීම් පිළිබඳ න්‍යාය, මුදල් ක්‍රම, බැංකු මගින් කෙරෙන කටයුතු, මහ බැංකු ව්‍යාපාරය, මුදල් සංවිධානය හා ප්‍රතිපත්ති පිළිබඳ ගැටළු, ජාත්‍යන්තර ආර්ථික ගනුදෙනු, ගෙවුම් ශේෂය, විනිමය ප්‍රමාණය ඇතුළු බැංකු ව්‍යාපාරය හා ව්‍යවහාර මුදල්.

19 වැනි හා 20 වැනි සියවස් තුළ එංගලන්ත, ප්‍රංශය, ජර්මනිය, රුසියාව හා අමෙරිකා එක්සත් ජනපදය යන රටවල ආර්ථික ඉතිහාසයද ඇතුළු නූතන ආර්ථික ඉතිහාසය.

24. **ආර්ථික විද්‍යාව (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරකි—ප්‍රශ්න පත්‍ර දහයක් අතුරෙන් අපේක්ෂකයන් විසින් පළමුවැනි ප්‍රශ්න පත්‍ර දෙකටත් ඉතුරු අටෙන් මෙහි යුගල වශයෙන් වරහන් තුළ යොද දක්වා ඇති එක් ප්‍රශ්න පත්‍ර යුගලකටත් පිළිතුරු සැපයිය යුතු වේ :

1 පත්‍රය.—ආර්ථික මූල ධර්ම ; පහළ කොටසෙහි ප්‍රශ්න පත්‍රයට වඩා උසස් තත්ත්වයකය.

2 පත්‍රය.—ලංකාවේ හා ලෝකයේ වර්තමාන ආර්ථික ගැටලු පිළිබඳව අපේක්ෂකයා සතු දැනීම හා අවබෝධය පිරික්සා බැලීම සඳහා සකස්වුනු නූතන ආර්ථික කරුණු පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. නූතන ආර්ථික විද්‍යාමය සඟරා හා ලිපි ලේඛනාදිය අපේක්ෂකයන් විසින් කියවිය යුතු වේ.

3 පත්‍රය } උසස් මූල්‍ය හා බැංකු ව්‍යාපාර න්‍යායය.
4 පත්‍රය } මූල්‍ය ඉතිහාසය හා සංවිධානය. ජාත්‍යන්තර වෙළඳ මුදල්.

5 පත්‍රය } 19 වැනි හා 20 වැනි සියවස් කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව යුරෝපය, අමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ලංකාව යන
6 පත්‍රය } රටවල ආර්ථික ඉතිහාසය.

7 පත්‍රය }
8 පත්‍රය } ගණිතමය සංඛ්‍යා විස්තර හා ආර්ථික හා වාණිජ කාර්‍යාලයන්හි ලා එය යොදාගැනීම.

9 පත්‍රය } ලෝකයේ ප්‍රධාන රාජ්‍යයන්හි රාජ්‍යවිධි හා පාලනය ; දේශපාලන න්‍යායය හා සමාජ න්‍යායය. දේශපාලනික චින්තාවන්ගේ
10 පත්‍රය } ඉතිහාසය.

25. **දේශපාලන විද්‍යාව (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකයි —

1 වන පත්‍රය—සමාජ හා දේශපාලන න්‍යාය.—ජාතික රාජ්‍ය පිළිබඳ න්‍යායන් ; මාකියාවෙල්ලි, බොඩින්, හොබ්ස්, ලොක්, රූසෝ, ලිබරල් වාදය, සමාජ වාද (මාක්ස් වාදය ඇතුළුව) සහ ඒ හා සමාන වාදයන්, පැසිස්ට් වාදය. නවීන රාජ්‍ය පිළිබඳ න්‍යායන්. නිදහස, අයිතිවාසිකම්, සමානාත්මතාවය, දේපල, ජාතික වාදය.

2 වන පත්‍රය—ලංකාවේ දේශපාලන ක්‍රමය (1833 සිට).—ලාංකිකයන් අතර දේශපාලන හැඟීම් වර්ධනය වීම, ජාතිකවාදී අදහස්වල නැඟීම, ජාතික නිදහස් ව්‍යාපාරය. දේශපාලන ආයතන හා ඒවායේ විකාශනය. දේශපාලනයට මහජනයාගේ සහභාගීත්වය. දේශපාලන සංවිධාන හා බල කණ්ඩායම්. 1931 සිට ආණ්ඩු ක්‍රමයේ ක්‍රියාකාරිත්වය.

26. **දේශපාලන විද්‍යාව (ඉහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර හතරයි—

1 වන පත්‍රය—සංසන්දනාත්මක ආණ්ඩු ක්‍රම හා ආණ්ඩු ක්‍රම මූලධර්ම—එක්සත් රාජ්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් සමූහාණ්ඩුව, ප්‍රංශය, ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ස්කැන්ඩිනේවියාව, ජපානය, චීනය, ඉන්දියාව. නවීන ආණ්ඩු ක්‍රමවල විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ ක්‍රමයන්, පරිපාලන ක්‍රම, නියෝජන ක්‍රමයන්.

2 වන පත්‍රය—ජාත්‍යන්තර සම්බන්ධතා.—1914 සිට ප්‍රධාන රටවල් අතර ජාත්‍යන්තර සම්බන්ධතාවයන්. ජාතීන්ගේ සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට සම්බන්ධ අන්‍ය ආයතනයන්. 1945 සිට ජාත්‍යන්තර දේශපාලන තීන්දු කරන ප්‍රධාන සාධකයන්.

3 වන පත්‍රය—උසස් දේශපාලන චින්තනය-I.—පැරණි ඉන්දීය දේශපාලන චින්තන (හින්දු හා බෞද්ධ) ග්‍රීක ; ප්ලේටෝ, ඇරිස්ටෝටල් පෞර රාජ්‍ය පිළිබඳ අදහස්, පැරණි රෝමයේ දේශපාලන චින්තකයන් හා නීති වේදීන්, ඔගස්ටින්, තෝමස් ඇක්වයිනාස්, ඩාන්ටේ මෙරසිලියෝ, රෙපරමාදු ප්‍රතිසංස්කරණ ; ලූතර්, කාල්වින්, නොක්ස්.

4 වන පත්‍රය—උසස් දේශපාලන චින්තනය—II

මැකියාවෙල්ලි, බොඩින්.
ඉංග්‍රීසි විප්ලවයේ දේශපාලන චින්තකයන්.
ප්‍රංශ පුනරුදයේ දේශපාලන චින්තකයන්.
ඇමෙරිකන් ආණ්ඩු ක්‍රමයේ ආදී කර්තෘවරුන්.
ඔක්තෝබර් විප්ලවයේ දේශපාලන චින්තකයන්.
චීන විප්ලවයේ දේශපාලන චින්තකයන්.

27. **සමාජ විද්‍යාව (පහළ කොටස).**—ප්‍රශ්න පත්‍ර දෙකකි —

I පත්‍රය—සමාජ විද්‍යාවේ මූලධර්ම—සමාජ විද්‍යාමය විමර්ශන ක්ෂේත්‍රයේ විභාජනය ; සමාජික පැවැත්ම පිළිබඳ ජීව විද්‍යාත්මක වර්ගීය හා භූගෝල විද්‍යාත්මක අර්ථ ව්‍යාඛ්‍යානය විචාරාත්මකව සොයා බැලීම ; සමාජ විද්‍යාව හා වෙනත් මානව විද්‍යාමය හැදෑරීම් හා සාමාජික විද්‍යාවන් හා අතර සම්බන්ධය ; සමාජය, සංස්කෘතිය හා පුද්ගල විශේෂත්වය, අතර ඇති විශ්ලේෂණාත්මක වෙනස්කම් මූලික සාමාජික විකල්පයේ ; සමාජ ව්‍යූහය ; සංස්ථා, ස්තරීභවනය, සාමාජික පාලනය, ගණ සකැස්ම, සමාජ පරිපූර්ණය හා සාමාජික විපර්යාසයද පිළිබඳ සෛද්ධාන්තික සූත්‍ර සම්පාදනය.

II පත්‍රය—සාමාජික ප්‍රශ්න හා සාමාජික පාලනය—අපරාධ විකල්පය ; අපරාධ විද්‍යාවේ ප්‍රවේශ මාර්ග හා ක්‍රම, අපරාධ මර්දන පිළිබඳ ගැටලු වර්ග විකල්පය ; වර්ගීය ආතතීන් පිළිබඳ සමාජ විද්‍යාව, ජන විකාස විද්‍යාව, ජනගහනයේ වැඩීම හා ඒ පිළිබඳ ගැටලු ; ආසියානු රටවල් කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව සමාජ සේවාවන්ගේ සංවර්ධනය හා අන්තර්ගත ද ; සමාජ සේවා පාලනය.

" සමාජ සේවා," " සුභ සාධක සමාජය " යන විකල්පයන්ගේ අර්ථය, රැකීරක්ෂා, මහලුවිය, අධ්‍යාපනය, දුරාචාරය, සෞඛ්‍යය හා රෝග, ගොවි ජනතාවගේ ආර්ථික ප්‍රශ්න ආදිය පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව සාමාජික අවශ්‍යතාවයන් හා ප්‍රතිපාදන පිළිබඳ විභාගය (ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.)

28. සමාජ විද්‍යාව (ඉහළ කොටස)—ප්‍රශ්න පත්‍ර හතරකි :—

I පත්‍රය—තුලනාත්මක සමාජ සංස්ථා—බන්ධුත්වය හා පවුල, සාමාජික ස්තරීභවනය (කුල භෙදය හා පන්ති භෙදය), ආගම, ආර්ථික ව්‍යුහය, දේශපාලන ව්‍යුහය, නිලබල ක්‍රමය පිළිබඳ න්‍යායය හා රූපික සංවිධාන, තුලනාත්මක හැදෑරීමේ අරමුණු හා ක්‍රම.

II පත්‍රය—ලංකාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව දකුණු ආසියාවේ සමාජ විද්‍යාව—ගොවි සමාජයේ හා ප්‍රජාවේ අර්ථ නිරූපනය ; ප්‍රජා හැදෑරීම් පිළිබඳ සමාලෝචනය.

ගොවිජන සමාජය පිළිබඳ හැදෑරීම් සඳහාවූ සෛද්ධාන්තික සැලැස්ම.

බන්ධුත්වය හා එය ඉන්දියාව හා ලංකාවද ඇතුළු වෙනත් තෝරාගත් රටවල ස්තරීභවනය ; ආර්ථික ලක්ෂණ, සාර ධර්ම ක්‍රම හා ගොවිජන සමාජයේ වෙනත් සංස්ථාගත ලක්ෂණ.

හින්දු ධර්මයේ හා බෞද්ධ ධර්මයේ සමනුවර්ත හා විසමනුවර්ත සමාජ විද්‍යාව.

ලාංකික පාරම්පරික සමාජයේ ඓතිහාසික විශ්ලේෂණය, වැඩ වසම් ක්‍රමය හා 19 සියවසේ සමාජ විපර්යාසය.

නොදියුණු රටවල ආර්තික දියුණුව පිළිබඳ ගැටලු.

III පත්‍රය—සමාජ විද්‍යාවේ සිද්ධාන්ත හා ක්‍රම—කොම්ටේ ගෙන් පසුව සිට සමාජ විද්‍යාවේ දියුණුව ; පරිණාමය, ප්‍රසාරණ, ශ්‍රිත වාදය හා අපර පරිණාමයද පිළිබඳ සිද්ධාන්ත, ඩර්කිම්, වේබල්, සිමෙල්, පරේටෝ හා විසිවැනි සියවසට අයත් මලිනොව්ස්කි, රැඩ්ක්ල්ප්බ්‍රවුන්, බෝස්, හොබ්හවුස්, පාර්සන්ස් වැනි මානව විද්‍යාඥයින් හා සමාජ විද්‍යාඥයින් ද විසින් ඉදිරිපත් කෙරුණු සිද්ධාන්ත. විද්‍යාත්මක ක්‍රමය : විද්‍යාත්මක විමර්ශණය හා අනුමිතිය පිළිබඳ තර්ක ශාස්ත්‍රය ; අනුමානයේ ස්වභාව, පරික්ෂණාත්මක ක්‍රමය, විද්‍යාත්මක ක්‍රමය, සමාජ විද්‍යාමය ගවේෂණයන් සඳහා යෙදවීම.

සමා විද්‍යාවේ හා මානව විද්‍යාවේ ක්ෂෙත්‍ර විධි හා ආනුභාවික ක්‍රම (නියමිත කරුණක් අරභයා පර්යේෂණ සැලැස්මක් සකස් කිරීමට අපේක්ෂකයාට නියම කරනු ලැබිය හැකිය.)

IV පත්‍රය—සමාජික මනෝවිද්‍යාව—පෞරුෂය හැඩගැස්වීමෙහිලා බලපාන සමාජික කරුණු සාමාජිකරණය, සංස්කෘතිය හා පෞරුෂය, ජාතික ගති ලක්ෂණ, පෞරුෂ වර්ධනය, ඉගෙනීම, ප්‍රත්‍යක්ෂය හා චේතනාවලිය ද පිළිබඳ සිද්ධාන්ත, කුඩා කාණ්ඩ පර්යේෂණ අංශය ද ඇතුළු ගණ ව්‍යුහය හා ගති විද්‍යාව ද පිළිබඳ මනෝ විද්‍යාත්මක විශ්ලේෂණය, මහජන මතය ගොඩ නැංවීමෙහි ලා බලපවත්වන කරුණු. බුද්ධිය සම්බන්ධ ගණ හා පුද්ගල වෙනස්කම්. මනෝ විද්‍යාත්මක ගවේෂණයන්හි ලා උපයෝගි කර ගන්නා ක්‍රම හා විධි.

V පත්‍රය—සාමාජික මානව විද්‍යාව—

(අ) සාමාජික මානව විද්‍යාවේ විෂය සීමාව සහ ක්‍රම. මූලික විකල්පයෝ, උදහරණ.—සමාජය, සමාජ ව්‍යුහය, සමාජ සංවිධාන, ශ්‍රිතය සහ සංස්කෘතිය. සංස්කෘතික වර්ධනය, ව්‍යාප්ති හැදෑරීම්, සංස්කෘතීන්ට හුරුවීම සහ සංස්කෘතික විපර්‍යාස.

(ආ) මෝර්ගන්, ෆ්‍රේසර්, ටයිලර්, රිවර්ස් සහ එලියට් ස්මිත් යන අයගේ කෘතීන් පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව, සමාජික මානව විද්‍යාවේ ඉතිහාසය.

(ඇ) මානව විද්‍යාවේ මෑත කාලයේදී ඇතිවූ නැඹුරුවීම් ; මැලිනොව්ස්කි, රැඩ්ක්ලිෆ් බ්‍රවුන් සහ එවාන්ස් ප්‍රිචාර්ඩ් යන අයගේ කෘතීන් පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව, ශ්‍රිතමය මාර්ගය, සංස්කෘතික මාර්ගය.

(ඈ) අග්නිදිග ආසියාවේ සාමාජික මානව විද්‍යාව.

29. භූගෝල විද්‍යාව (පහළ කොටස)—ප්‍රශ්න පත්‍ර දෙකකි :—

I පත්‍රය—(අ) භෞතික භූගෝල විද්‍යාව—භූ-ස්වරූප, ජලවහනය, ස්වාභාවික වෘක්ෂ ලතාදිය, පස, දේශගුණය හා කාලගුණය හා මානව භූගෝල විද්‍යාව (මිනිසාගේ ව්‍යාප්තිය, සංක්‍රමණය, විවිධ සමාජ, අර්ථ ක්‍රම) ද පිළිබඳ මූල ධර්ම.

(ආ) (1) ඉන්දියානු ප්‍රදේශයේ (ඉන්දියාව, පකිස්තානය, බුරුමය, ලංකාව) හෝ යුරෝපයේ ප්‍රාදේශීය භූගෝල විද්‍යාව ; භෞතික, මානව හා ආර්ථික ; එසේ නැතහොත් ඇන්ග්ලෝ අමෙරිකාවේ ප්‍රාදේශීය භූගෝල විද්‍යාව ; භෞතික, මානව හා ආර්ථික.

II පත්‍රය—සාමාන්‍ය සිතියම් වැඩ—භූ-ලක්ෂණ සිතියම් (ලංකාව, එක්සත් රාජ්‍යය, එක්සත් ජනපදය), මූලික භූමි මානක්‍රම (දම්වැල්, ප්ලේන් ටේබල, ප්‍රිස්ම, මාලිමා), ප්‍රක්ෂෙපණ ('' අන්තර්ගත ලක්ෂණ '', සරල නිර්මාණය) හා ප්‍රස්ථාර (මූලික සංඛ්‍යාමය දත්තයන් දක්වීම).

30. භූගෝල විද්‍යාව (ඉහළ කොටස).—ප්‍රශ්න පත්‍ර හතරකි :—

I පත්‍රය—(අ) උසස් භූ-රූප විද්‍යාව (මූලික භෞතික භූ-විද්‍යාව ද සහිතව), භූ-රූපයන්ගේ පරිණාමය හා ජල විද්‍යාඉය රටාවන්ගේ වැඩීම.

(ආ) උසස් දේශගුණ විද්‍යාව (මූලික කාලගුණ විද්‍යාව ද සහිතව), දේශගුණ කලාප විකල්පයෝ, ලෝකයේ දේශගුණ වර්ගීකරණය හා රටා ; දේශගුණ විපර්යාසයෝ හෝ

(ඇ) උසස් ජෛව භූගෝල විද්‍යාව හෝ

(ඈ) උසස් කෘෂිකර්ම භූගෝල විද්‍යාව.

II පත්‍රය—(අ) ආර්ථික භූගෝල විද්‍යාව, මූලික නිෂ්පාදන, බලවේග සම්පත්ති හා කර්මාන්ත ; වෙළඳ මධ්‍යස්ථාන හා දේශීය හා ජාත්‍යන්තර වෙළඳාම.

(ආ) ආසියාවේ හෝ එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ හෝ ලතින් අමෙරිකාවේ හෝ ප්‍රාදේශික භූගෝල විද්‍යාව ; භෞතික, මානව, ආර්ථික, ඓතිහාසික හා දේශපාලනික, හෝ භූගෝල විද්‍යාත්මක සොයාගැනීම්, ගවේෂණ සහ චින්තාවේ වර්ධනය.

III පත්‍රය—(අ) ලංකාවේ හා ඉන්දියාවේ ප්‍රාදේශික භූගෝල විද්‍යාව ; භෘතික මානව, ආර්ථික, ඓතිහාසික හා දේශපාලනික.

(ආ) අප්‍රිකාවේ හා ඕස්ත්‍රේලියාවේ ප්‍රාදේශික භූගෝල විද්‍යාව හෝ ප්‍රාදේශික කරුණු පිළිබඳ තුලනාත්මක විභාගය හා දේශපාලනික භූගෝල විද්‍යාව ; හෝ ප්‍රායෝගික භූගෝල විද්‍යාව සහ නූතන භූගෝල විද්‍යාවේ ගැටලු.

IV පත්‍රය—(අ) ප්‍රස්තාර විද්‍යාව—ගුවන් ඡායාරූප, භූ-විද්‍යාමය සිතියම් හා භූ-ලක්ෂණ සිතියම් ; මැනීම (ප්ලේන් ටේබල් මැනීම, ත්‍රිකෝණ මැනීම, මට්ටම් මැනීම, සමෝච්ච මැනීම පිළිබඳ ප්‍රතිච්ඡෙදය) ; ප්‍රක්ෂෙපණ හා ප්‍රස්තාර සටහන් (සංකීර්ණ සංඛ්‍යාමය දත්තයන් දක්වීම) හා

(ආ) ප්‍රායෝගික සිතියම් නිර්මාණය පිළිබඳ විධි හා ඒවා ක්‍රියාවේ යෙදවීම, (ප්‍රභව, ද්‍රව්‍ය සිතියම් සංස්කරණය, දළ සිතියම් සකස් කිරීම).

31. පුරා විද්‍යාව (පහළ කොටස).—ප්‍රශ්න පත්‍ර දෙකකි :—

I වන පත්‍රය—මූල ධර්ම වාස්තු විද්‍යාව, පුරා විද්‍යාවේ ඉතිහාසය, ලංකාවේ චිත්‍ර කර්මය හා ප්‍රතිමා නිර්මාණය.

II වන පත්‍රය—මූල පටන් ක්‍රි. ව. 1505 තෙක් සෙල් ලිපි හා පුරාලේඛන පිළිබඳ දැනීම. ලංකාවේ පැරණි කාසි.

32. පුරා විද්‍යාව (ඉහළ කොටස).—ප්‍රශ්න පත්‍ර හතරකි :—

I වන පත්‍රය—ප්‍රාග් ඉතිහාසය, පුරා විද්‍යා මූල ධර්ම හා පැරණි වාස්තු විද්‍යාව. ලංකාවේ පුරා විද්‍යාව පිළිබඳ ඉතිහාසය.

II වන පත්‍රය—ලංකාවේ චිත්‍ර කර්මයේ හා ප්‍රතිමා නිර්මාණයේ ඉතිහාසය.

III වන පත්‍රය—ලංකාවේ බ්‍රාහ්මී ලිපි.

IV වන පත්‍රය—ක්‍රි. ව. 8 සිය වසේ සිට ක්‍රි. ව. 1505 තෙක් සෙල් ලිපි හා පුරා ලේඛන, ලංකාවේ පැරණි කාසි.

33. මානව විද්‍යාව (පහළ කොටස)—ප්‍රශ්න පත්‍ර දෙකකි.—

I වන පත්‍රය—සාමාන්‍ය සහ භෞතික මානව විද්‍යාව :—

(අ) සාමාන්‍ය මානව විද්‍යාව—භෞතික මානව විද්‍යාවේ, ප්‍රාග් ඓතිහාසික පුරා විද්‍යාවේ හා සමාජ මානව විද්‍යාවේ විෂය සීමාව හා මූලික ක්‍රම. මූලික මානව විද්‍යාත්මක විකල්පයෝ.

(ආ) භෞතික මානව විද්‍යාව—ප්‍රධාන මානව ෆොසිල්, මානව පරිනාමය, මූලික පරිනාම වාදය, මානව ජාතීන්ගේ භෞතික ලක්ෂණ, මානව ජාති කොටස් වශයෙන් වෙන් කිරීම හා ජීවායේ පැතිරීම, මූලික ප්‍රවේණි විද්‍යාව.

II වන පත්‍රය—ප්‍රාග් ඓතිහාසික පුරා විද්‍යාව සහ සමාජ මානව විද්‍යාව :—

(අ) ප්‍රාග් ඓතිහාසික පුරා විද්‍යාව—පැරණි, මධ්‍ය හා නූතන ගල් යුගවල පුරා විද්‍යාව, සභ්‍යත්වයේ සම්භවය.

(ආ) සමාජ මානව විද්‍යාව—සංස්කෘතියේ හා සමාජයේ ස්වභාවය, සරල සමාජවල සමාජ සංවිධාන ක්‍රම, සරල සමාජවල පවතින ආගම, ඥාතිත්වය හා දේශපාලන සංස්ථා.

34. බෞද්ධ සංස්කෘතිය (පහළ කොටස)—ප්‍රශ්න පත්‍ර දෙකකි :—

I වන පත්‍රය—බෞද්ධ සංස්කෘතිය ඇරඹෙද්දී දඹදිව පැවති ආගමික හා සමාජ තත්ත්වය, නූතන විකාශනයන් ඇතුළුව ඉන්දියාවේ බෞද්ධාගමික බලපෑම් හා ඉතිහාසය.

II වන පත්‍රය—පැරණි බෞද්ධ නිකායන් සහ ඉන්දියාවෙන් පිටත බෞද්ධාගමේ විකාශනය ; නූතන යුගය ඇතුළුව, ලංකා ඉතිහාසයට අයත් බෞද්ධාගම.

35. බෞද්ධ සංස්කෘතිය (ඉහළ කොටස)—ප්‍රශ්න පත්‍ර හතරකි :—

I වන පත්‍රය—පැරණි බෞද්ධාගමික ආයතන, සංඝයා සහ තපස් සංවිධාන, විනය සහ ශාසනානුගත පිළිවෙත, ගිහි සමාජය සහ එහි සමාජ සංවිධාන, බෞද්ධ වැඳීම් ක්‍රම සහ පුද සිරිත්, බෞද්ධාගමික සමාජ ක්‍රම.

II වන පත්‍රය—පහත සඳහන් ප්‍රදේශ අතුරෙන් දෙකක බෞද්ධ චිත්‍ර ශිල්පය සහ ගෘහ නිර්මාණ ක්‍රම :—

(අ) ඉන්දියාව, පාකිස්ථානය හා ලංකාව.

(ආ) අග්නිදිග ආසියාව.

(ඇ) ටිබෙටය සහ මධ්‍යම ආසියාව.

(ඇ) චීනය සහ ජපානය.

III වන පත්‍රය—දේශපාලනයට, සංස්කෘතියට සහ සමාජ ආයතනවලට ඇතිවූ බෞද්ධ බලපෑම් වලට විශේෂ අවධාරණයෙන් යුතුව අග්නිදිග ආසියාව, පැරණි මැද පෙරදිග, ලංකාව, පාකිස්ථානය සහ ඉන්දියාව යන රටවලට ඇතිවූ බෞද්ධ අදහස්වල බලපෑම් හෝ බෞද්ධාගමේ ව්‍යාප්තිය.

IV වන පත්‍රය—නූතන ලෝකය, ජපානය, කොරියාව, චීනය, මධ්‍යම ආසියාව, ටිබෙටය යන රටවල බෞද්ධාගමේ ව්‍යාප්තිය.

36. දර්ශන ශාස්ත්‍රය (පහළ කොටස)—ප්‍රශ්න පත්‍ර දෙකකි—බටහිර දර්ශනයේ ඉතිහාසය :—

(අ) ග්‍රීක දර්ශනය, විද්‍යාත්මක යුගය, විතණ්ඩවාදීහු, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් මැත ආචාර්ය ධර්ම යුගය හා නව ප්ලෙතෝනික වාදය ද කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව.

(ආ) මධ්‍යතන යුගයේ දර්ශනය ; සෙන්ට් ඔගස්ටින්, ස්කොටස්, ඉයුජින්, අන්සෙලම්, තෝමස් ඇක්විනාස්, සෙන්ට් බොනවෙන්තුර්, ඩන්ස් ස්කොටස්, ඇරිස්ටෝටල් වාදයේ පුනර්ජීවය හා සාමාන්‍යයන් පිළිබඳ ගැටලු ද කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව.

(ඇ) නූතන දර්ශනය ; පුනර්ජීවනය බෲනෝ, බේකන්, හොබ්ස්, (බුද්ධිවාද ක්‍රම ඩෙකාටස්, ස්පිනෝසා, ලිබනිට්ස්), අනුභූතිවාදය හා අවබෝධය (ලොක්, බර්ක්ලි, හියුම්) හා ජර්මානු විඥාන වාදය (කාන්ට්, ෆිෂ්ර්, ෂෙලිං, හේගල්) ද කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව.

ආචාර ධර්ම.—ආචාර ධර්ම ශාස්ත්‍රයේ ස්වභාව හා විෂය සීමාව ; සදචාරය හා ආගම, සදචාර ඥානය පිළිබඳ ගැටලුව ; සදචාර ප්‍රගතිය, විශ්වාසය හා සිද්ධිය ; චාරිත්‍ර ක්‍රමය, සදචාරය ; සදචාරයේ සාමාන්‍ය මූලධර්ම ; බුද්ධිවාදය ; සුඛ පරමවාදය ; සුඛ සාධන වාදය ; සදචාර ප්‍රයෝගය; මානව හර පද්ධතිය ; මානව අයිතිවාසිකම්, යුතුකම්, යුතුකම් හා සද්ගුණවල ස්වභාව හා ආචාර ධර්ම ශාස්ත්‍රයෙහි ඒවා දරන තැන ; ආචාර ධර්ම ශාස්ත්‍රීය හා නෛතික යුක්තිය ආර්ථික ජීවිත හා සදචාරය, ලිංගික ජීවිතය, පවුල, රාජ්‍යය හා වෙනත් සංස්ථා.

37. දර්ශන ශාස්ත්‍රය (ඉහළ කොටස)—ප්‍රශ්න පත්‍ර හතරකි.—I වැනි හා II වැනි ප්‍රශ්න පත්‍ර තර්ක ශාස්ත්‍රය හා ඥාන විභාගය පිළිබඳය :—

තර්ක ශාස්ත්‍රය හා ඥාන විභාගය පිළිබඳ ප්‍රශ්නය ; යථාර්ථානු භාවය පිළිබඳ න්‍යායයෝ ; ඥාන ප්‍රශ්නය පිළිබඳ අනුභූති වාදත්මක, බුද්ධිවාදත්මක හා විචාරාත්මක දියුණුව ; සංකල්ප වාදය ; විනිශ්චයෝ, අනුමිති, රූපික තර්ක ශාස්ත්‍රය, අධ්‍යාත්ම විද්‍යාමය තර්ක ශාස්ත්‍රය, ගණිත විද්‍යාමය තර්ක ශාස්ත්‍රය, තර්කානුසාරී, යථාභූතවාදය, සත්‍යයේ ස්වභාව, ඥානය හා සත්‍යය පිළිබඳ විවිධ සිද්ධාන්ත, සත්‍ය පරීක්ෂා.

අධ්‍යාත්ම විද්‍යාව.—ඥාන විභාගය හා අධ්‍යාත්ම විද්‍යාව හා අතර සම්බන්ධය : තත්කාලීන දර්ශනය, සත්වාදය, නව-සත්වාදය, විචාරාත්මක සත්වාදය, විඥාන වාදය, ප්ලෙතෝනික විඥාන වාදය, බර්ක්ලිගෙ විඥාන වාදය, කාන්ට්ගේ විඥාන වාදය, හේගල්ගේ විඥාන වාදය, නව විඥාන වාදය, නව හේගලීය වාදය, උපයෝ වාදය, සත්භාවය හා පෙනුම පිළිබඳ ප්‍රශ්නය, ආපාතිකතාවේ හරය හා ගුණ ලකුණු, ද්‍රව්‍යය හා ගතිය, අවකාශය හා කාලය, අගය අමෘතය, දෙවියන් හා මැවීම, භාෂාවේ දර්ශනය, නවීන විද්‍යාවේ දර්ශනය යන මේවා කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව අධ්‍යාත්ම විද්‍යාවේ සාමාන්‍ය මූලධර්ම.

මනෝවිද්‍යාව හෝ ඉන්දීය දර්ශනය.—අපේක්ෂකයෝ මෙම කොටස් දෙකෙන් එකකට පෙනී සිටිය යුතුය.

III සහ IV පත්‍ර—මනෝවිද්‍ය ව.—මනෝවිද්‍යාවේ ස්වභාවය හා විෂය සීමාව ; මනෝවිද්‍යා ක්‍රම, මනඃ-කාය සම්බන්ධය, සංවේදනය, ප්‍රත්‍යක්ෂය, ස්මෘතිය, පරිකල්පනය, විකල්පමය චින්තනය, අසංකල්පිත ක්‍රියා, සහජාතයෝ, බුද්ධිය, වේදනයෝ, චිත්තවේගයෝ, භාවයෝ, අධිෂ්ඨානය, පෞරුෂය.

ජන්තු මනෝවිද්‍යාවේ හා මානව විද්‍යාවේ විෂය සීමාව හා ස්වභාව ; පුද්ගලික හා සාමාජික මනෝවිද්‍යාව, ප්‍රායෝගික මනෝවිද්‍යාව, සමකාලීන මනෝවිද්‍යානිකයයෝ, හැසුරුම් වාදය, හෝර්මීය මනෝ විද්‍යාව, ගෙස්ටෝල්ට් මනෝවිද්‍යාව, ස්පියර්මන් ගේ මනෝවිද්‍යාව, චින්ත වගාගීය නිකායයෝ ; ෆ්‍රොයිඩ්, ඇඩ්ලර්, ජුන්ග්.

III සහ IV විකල්ප ප්‍රශ්න පත්‍ර—ඉන්දියානු දර්ශනය—වෛදික සූක්තයන්ගේ ආගම හා දර්ශනය, උපනිෂද් ; භගවත් ගීතාවේ හා මහා කාව්‍ය යන්හි ඉගැන්වීම ; බෞද්ධාගමේ හා ජෛන ආගමේ සම්භවය හා ව්‍යාප්තිය : ඉන්දියානු භෞතික වාදය (චාර්වාක), දර්ශන යුගය, න්‍යාය හා වෛශෙෂක සත්වාදය හා අණුවාදය, මීමංසා නිකාය, ජෛනයන්ගේ අනේකාන්ත වාදය (ශ්‍යාද්වාද), පැරණි හීනයාන බෞද්ධ නිකායයෝ; සංඛ්‍යා හා යෝග දර්ශනයන්ගේ සම්භවය හා පරිණාමය, මහායාන හා වේදාන්ත නිකායයෝ.

සංකරගේ අද්වෛත වේදාන්ත වාදය හෝ මහායාන බෞද්ධ නිකාය හෝ මුල් අවධියේ බෞද්ධාගම හෝ පිළිබඳ සවිස්තර දැනුමක්.

38. **ශුද්ධ ගණිතය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—වීජ ගණිතය (සංකීර්ණ සංඛ්‍යා ද ඇතුළුවයි), ත්‍රිකෝණ මිතිය, ජ්‍යාමිතිය (ද්විමාන හා ත්‍රිමාන ඛණ්ඩජ්‍යාමිතිය ද ඇතුළුවයි), අවකලනය හා අනුකලනය සහ එක් සවයන්ත විචල්‍යයෙක අවකලන සමීකරණය.

ප්‍රශ්න පත්‍ර දෙකින් එක එකක් සකස් කෙරෙනුයේ මුළු නිර්දේශ පත්‍රයම පදනම් කොටගෙනය.

39. **ප්‍රායෝගික ගණිතය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—අංශුවක හා දෘඪ වස්තුවක ස්ථිතික හා ගති විද්‍යා, ද්‍රවස්ථිතික විද්‍යාව හා ගුරුත්වා කර්ෂණය.

ප්‍රශ්න පත්‍ර දෙකින් එක එකක් සකස් කෙරෙනුයේ මුළු නිර්දේශ පත්‍රයම පදනම් කොටගෙනය.

40. **ගණිතය (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—වීජ ගණිතය (න්‍යායයන්ද ඇතුළුව). ජ්‍යාමිතිය (ප්‍රක්ෂේපණ ජ්‍යාමිතිය හා අවකලන ජ්‍යාමිතිය) විශ්ලේෂණය හා අවකලන සමීකරණ.

ස්ථිතික විද්‍යාව, ගති විද්‍යාව (ලැග්රේන්ජ් හා ඉයුලර් සමීකරණ ද ඇතුළුව), ගුරුත්වාකර්ෂණය, විද්‍යුතය හා චුම්බකත්වය.

I වැනි හා II වැනි ප්‍රශ්න පත්‍ර ශුද්ධ ගණිතයට ද, III වැනි හා IV වැනි ප්‍රශ්න පත්‍ර ප්‍රායෝගික ගණිතයට ද වෙන් වේ. ඒ එක් එක් ප්‍රශ්න පත්‍රයක් ඊට අදාල වූ මුළු නිර්දේශ පත්‍රය ම පදනම් කොට ගෙන සකස් වේ.

41. **භෞතික විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—සාමාන්‍ය භෞතික විද්‍යාව ; තාපය හා තාප ගති විද්‍යාව : ධ්වනි විද්‍යාව, ජ්‍යාමිතික හා භෞතික ප්‍රකාශ විද්‍යාව, විද්‍යුතය හා චුම්බකත්වය, නූතන භෞතික විද්‍යාව.

42. **භෞතික විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—විශේෂ සාපේක්ෂතා වාදය ද ඇතුළු සාමාන්‍ය භෞතික විද්‍යාව, තාපය හා තාපගති විද්‍යාව, ධ්වනි විද්‍යාව.

' X ' කිරණ වර්ණාවලික්ෂය ඇතුළු භෞතික ප්‍රකාශන විද්‍යාව ; විද්‍යුත්-චුම්බක වාදය, ප්‍රත්‍යාවර්තක ධාරා අයනයන් ඇතුළු උසස් විද්‍යුත් විද්‍යාව ඉලෙක්ට්‍රෝන් වාදය, ඉලෙක්ට්‍රෝන් විද්‍යාව ; වායු සන්නයනය ; ක්වොන්ටම් වාදය ; න්‍යෂ්ටික භෞතික විද්‍යාව ; අන්තරීක්ෂ කිරණ.

43. **රසායන විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—

I පත්‍රය—සාමාන්‍ය හා අකාබනික රසායන විද්‍යා හා භෞතික රසායන විද්‍යාව.

II පත්‍රය—කාබනික රසායන විද්‍යාව.

44. **රසායන විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—

I පත්‍රය—සාමාන්‍ය හා අකාබනික රසායන විද්‍යාව.

II පත්‍රය—භෞතික රසායන විද්‍යාව.

III පත්‍රය—කාබනික රසායන විද්‍යාව (i).

IV පත්‍රය—කාබනික රසායන විද්‍යාව (ii).

45. **උද්භිද විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—

I පත්‍රය—පටක විද්‍යාව හා සාමාන්‍ය ව්‍යුහ විද්‍යාව, තලසශාකයෝ ; හරිතශාකයෝ පර්ණාංගශාකයෝ ; විවෘත බීජකයෝ.

II පත්‍රය—බීජශාකයන්ගේ රූප විද්‍යාව හා වර්ගීකරණ විද්‍යාව ; ශාරීරික විද්‍යාව ; පරිසර විද්‍යාව හා ශාක භූගෝල විද්‍යාව ; සෛල විද්‍යාව ; ප්‍රවේණි විද්‍යා හා පරිණාමය.

**සංලක්ෂ්‍යය.**—ඒ ඒ ප්‍රශ්න පත්‍රවලම විෂයයන් බෙද වෙන් කෙරෙනුයේ ඊට යෝග්‍ය වූ හරස් යොමුවලට අනුවය. වර්ගී කරණය—විශේෂයෙන් ආවෘතබීජක ගෝත්‍ර හා පවුල්වල—හා පරිසර විද්‍යාව ද භූගෝල විද්‍යාව ද සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුව ඇත්තේ ලංකාවේ ශාකවර්ග හා වෘක්ෂ ලතාදිය කෙරෙහිය.

46. **උද්භිද විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරෙකි.—

I පත්‍රය—තලසශාකයෝ, හරිතශාකයෝ, පර්ණාංගශාකයේ හා විවෘතබීජකයෝ ; සංක්ෂිප්ත ශාක ව්‍යාධි විද්‍යාව.

II පත්‍රය—වර්ගීකරණ විද්‍යාවේ මූලධර්ම ; සංවර්ධන හා ප්‍රතිජනක රූප විද්‍යාව ; රූප විද්‍යාව ; බීජ ශාකයන්ගේ ව්‍යුහ විද්‍යාව හා වර්ගීකරණ විද්‍යාව.

III පත්‍රය—ශාරීරික විද්‍යාව, සෛල විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව හා පරිණාමය.

IV පත්‍රය—පරිසර විද්‍යාව හා ශාක භූගෝල විද්‍යාව, සංක්ෂිප්ත ආර්ථික උද්භිද විද්‍යාව.

**සංලක්ෂ්‍යය.**—පහළ කොටසේ නිර්දේශ මාලාවේ සංලක්ෂ්‍යය බලන්න.

47. **සත්ත්ව විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—අපෘෂ්ඨ වංශීහු පරිණාමය, සත්ත්වයින්ගේ භූගෝලීය ව්‍යාප්තිය, පෘෂ්ඨවංශීහු, සාමාන්‍ය කලල විද්‍යාව, සෛල විද්‍යාව, ආවේණිය, පරිසර විද්‍යාව.

48. **සත්ත්ව විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර සතරකි.—

අපෘෂ්ඨවංශීහු.

පෘෂ්ඨවංශීහු.

කලල විද්‍යාව (සාමාන්‍ය හා ප්‍රායෝග දර්ශනාත්මක), සෛල විද්‍යාව, ආවේණිය, සත්ත්ව ගති පැවතුම්, පරිණාමයෝ, සත්ත්වයින්ගේ භූගෝලීය ව්‍යාප්තිය, සත්ත්ව පරිසර විද්‍යාව.

ආර්ථික සත්ත්ව විද්‍යාව.

49. **රාජ්‍ය පරිපාලන විද්‍යාව.**—රාජ්‍ය පරිපාලන විද්‍යාව යනු කුමක් ද ? ; පරිපාලන ක්‍රියාවලිය ; විධායකත්වය—එහි බලතල හා සංවිධානය ; රාජ්‍ය නිලධරවාදය ; රාජ්‍ය සේවය—එහි ව්‍යුහය හා කළමනාකරණය ; සමාජ සුබසාධක රාජ්‍යය තුළ ඊට අයත් කාර්ය පද්ධතිය ; පාර්ලිමේන්තුව හා අධිකරණය මගින් පරිපාලනය කෙරෙහි ඇති කෙරෙන පාලනය ; සමාජ සුබසාධක රාජ්‍යයක පරිපාලන ගැටළු ; පාර්ලිමේන්තුව හා අමාත්‍යාංශ මගින් පොදු ව්‍යාපාර කෙරෙහි ඇති කෙරෙන පාලනය ; ලංකාවේ ව්‍යාපාරවල පරිපාලන ගැටළු.

පළාත් ආණ්ඩු ක්‍රමයේ අර්ථ නිරූපනය ; ලංකාවේ පළාත් ආණ්ඩු ක්‍රමයේ සංවර්ධනය ; එහි වර්තමාන ව්‍යුහය ; විවිධ වර්ගයන්හි පළාත් ආණ්ඩු සභාවල ශ්‍රිතයන් හා බලතල ; ජීවායේ මූල්‍ය සම්පාදනය ; පළාත් පාලන සේවා කොමිසම.

50. **රාජ්‍ය මූල්‍ය.**—රාජ්‍ය මූල්‍ය යනු කිම ? අයබදු පිළිබඳ සිද්ධාන්ත, සෘජු හා වක්‍ර අයබදු, අයබදුවල අපතය හා ප්‍රතිඵල, රාජ්‍ය වැය න්‍යාය, රාජ්‍ය වැය පාලනය, රාජ්‍ය ණය න්‍යාය, බදු ප්‍රතිපත්ති, මූල්‍ය පරිපාලනය හා අයවැය ක්‍රියා මාර්ගය, මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය, ලංකාවේ මහ ආණ්ඩුවේ හා පළාත් පාලන ආයතන මූල්‍ය.

51. **ව්‍යාපාර පරිපාලනය—සිද්ධාන්ත හා භාවිතය.**—ව්‍යාපාර පරිපාලන විද්‍යාව හැදෑරීමේ අවශ්‍යතා හා මාර්ග, ලංකාව ගැන විශේෂ සඳහන් ඇතිව ව්‍යාපාර පරිසරය, ව්‍යාපාර සම්පත් හා ඒවායේ ක්‍රියාකාරිත්වය, නෛතික හා වෙනත් ව්‍යාපාර—රාජ්‍ය සම්බන්ධතා. අවස්ථා උදාහරණසේ ගෙන විවිධ පාලන ගැටළු නිරාකරණය කිරීමේ ශක්තිය හා ව්‍යාපාර ගැටළු විසඳීමේදී ද ව්‍යාපාර තීරණ ගැනීමේදී ද ආර්ථික විග්‍රහ ක්‍රම උපයෝගී කර ගැනීමේ ශක්තිය ද අපේක්ෂා කරනු ලැබේ. නූතන ආර්ථික හා ව්‍යාපාරික සංග්‍රහ සහ රජයේ සංයුක්ත මණ්ඩලවල වාර්ෂික වාර්තා පිළිබඳ අනුදැනුමක් අපේක්ෂා කරනු ලැබේ.

52. **පාලන මූල ධර්ම.**—අර්ථ නිරූපණය, ප්‍රමාණය හා පදනම ඇතුළු පාලන ප්‍රතිපත්ති, ව්‍යාපාර පාලන අදහස් සංවර්ධනය වූ අන්දම, පාලනය හා සමාජ වගකීම, සංවිධානය, න්‍යාය, පරිපාලනය පැවැත්ම, පරිපාලනයේ දී මානසික විද්‍යාව උපයෝගී කර ගැනීම, තීරණ ගැනීම සඳහා විද්‍යානුකූල ක්‍රම ඉවහල් කර ගැනීම, තෝරාගත් ක්‍රියාත්මක කොටස්වල පාලන ක්‍රියා මාර්ගය, නිෂ්පාදනය, මූල්‍ය ප්‍රවාහනය, සේවක පරිපාලනය හා කාර්මික සම්බන්ධතා, ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහිදී පාලන ක්‍රම බලපාන අයුරු.

53. **අලෙවි කිරීම.**— අර්ථ නිරූපනය, ප්‍රමාණය, ආර්ථික සංවර්ධනයෙහිදී ඇති වැදගත්කම, පාරිභෝගික ක්‍රියාකාරිත්වය, අලෙවිය හැදෑරීමේ ක්‍රම, අලෙවි කිරීම හා ආයතන (තොග වෙළඳාම හා සුළු වෙළඳාම), අලෙවි ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක විධි : අලෙවිය සඳහා සැකැසුම, මිල නියම කිරීම, බෙදා හැරීමේ මාර්ග, භාණ්ඩ බෙදා හැරීම, අලෙවිය පිළිබඳ පර්යේෂණ, ප්‍රචාරය, වෙළඳාම දියුණු කිරීම, මහජන සම්බන්ධතා, සමුපකාර අලෙවිය, ලංකාව ගැන විශේෂ සඳහන් ඇතිව අලෙවි කිරීමේ වෙනස්වන ක්‍රම.

54. **අධ්‍යාපන මනෝවිද්‍යාව—I පත්‍රය.**—බාල අවස්ථාවේ සිට වැඩිහිටි අවධිය දක්වා බුද්ධිමය වර්ධනය. බුද්ධිමය වර්ධනය කෙරෙහි ශාරීරික, සමාජයීය සහ චිත්තවේගී වර්ධනාංශයන්ගේ බලපෑම. සංජානනය, ස්මරණය, චින්තනය හා ගැටළු විසඳීම යන ක්‍රියාවලි. ඉගෙනීම පිළිබඳ මත. ඉගෙනීම මාරුව. බුද්ධිමය නොවන සාධක ඉගෙනීම කෙරෙහි බලපෑම. විශේෂ ගණයන්ට ඇතුළුවන ළමයි—මන්ද බුද්ධික ළමයි, සෙමෙන් උගන්නා ළමයි, උසස් දක්ෂතා ඇති ළමයි. ආකල්පයන් හා අගයයන් ඉගෙනීම. පෞරුෂ වර්ධනය හා මානසික සෞඛ්‍යය. අධ්‍යාපනික සංනයනය.

**II පත්‍රය.**—මානසික මිනුම්වල ස්වභාවය. මානසික මිනුම්වලට අදාල සංඛ්‍යාන විද්‍යාත්මක සංකල්ප හා ක්‍රම. අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක මිනුම්වල අපෙක්ෂණ. පරීක්ෂණ පිළියෙල කිරීමේදී උපයෝගී වන සංඛ්‍යාන විද්‍යාත්මක දර්ශක. අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පරීක්ෂණ පිළියෙල කිරීම, ප්‍රමාණ කිරීම හා ප්‍රයෝජනයට ගැනීම.

55. **අධ්‍යාපනික මූලධර්ම**—

(1) අධ්‍යාපනය යන සංකල්පය හා අධ්‍යාපනික පරමාර්ථ.

(2) අධ්‍යාපනයේ අගයයන්—පෞද්ගලික හා සමාජයීය.

(3) අධ්‍යාපන දර්ශන—ප්ලේටෝ, රූසෝ, ඩිවි, තාගෝර් සහ ගාන්ධි.

(4) අධ්‍යාපනයේ සදාචාරාත්මක හා ආගමික සාධක.

(5) මානුෂික සම්බන්ධතා හා අධ්‍යාපනය.

(6) ආර්ථික ක්‍රමය, දේශපාලනය, සමාජය හා අධ්‍යාපනය. පාඨශාලාව ජාතික ආයතනයක් ලෙස සැලකීම.

(7) සංස්කෘතිය, ප්‍රජාව, සමූහ හා සමාජයීය පුහුණුව.

(8) පාඨශාලාව සමාජයීය ඒකකයක් ලෙස පැවැත්ම.

(9) පාඨමාලාවට අඩංගු වන කරුණු. පාඨමාලාව පිළිබඳ සංකල්පය—සාමාන්‍ය හා විශේෂ අධ්‍යාපනය, පුළුල් හා වෘත්තීය අධ්‍යාපනය පාඨමාලාව සකස් කිරීමේ මූලධර්ම හා බලපෑම්. පාඨමාලාව සංවිධානය කිරීම හා අගය කිරීම. පාඨමාලාව සම්බන්ධ අත්හදා බැලීම්.

(10) විශ්ව විද්‍යාලය හා අනිකුත් උසස් ආයතනවල කාර්යයන් හා බලාපොරොත්තු වන සේවය.

(11) ගුරු වෘත්තිය හා ගුරුවරයාගෙන් කෙරෙන සේවය.

56. **තුලනාත්මක අධ්‍යාපනය**—

(1) **තුලනාත්මක අධ්‍යාපනය පිළිබඳ න්‍යාය.**—විවිධ රටවල අධ්‍යාපනික ප්‍රතිපත්ති සහ ව්‍යවහාරය තීරණය කරන දේශපාලන, සමාජික, ආර්ථික සහ සංස්කෘතික කරුණු පිළිබඳ අධ්‍යයනය.

(2) **දියුණු වූ සහ දියුණු වන රටවල අධ්‍යාපනයේ නව ලක්ෂණ.**—මේ වර්ගවලට අයත් රටවල් සමූහ කිහිපයක් පිළිබඳ අධ්‍යයනයකින් පැහැදිළි විය යුතුයි.

(3) **ලංකාවේ අධ්‍යාපන ක්‍රමය.**—ඓතිහාසික, සංස්කෘතික සහ සමාජ-ආර්ථික දෘෂ්ටි කෝණයන්ගේ හැදෑරීම.

(4) **ලංකාවේ සමකාලීන අධ්‍යාපන ප්‍රශ්න.**—වෙනත් රටවල සමාන ප්‍රශ්න හා සසඳමින් අධ්‍යයනය කිරීම.

57. **පුද්ගල හා දේපල නීතිය—රෝම ලන්දේසි නීතියේ මූල ධර්ම.**—ඒවා ලංකාවෙහි ක්‍රියාවෙහි යෙදවීම පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව.

58. **බැඳීම් නීතිය.**—ගිවිසුම්, සිවිල් වැරදි හා අර්ධ ගිවිසුම් පිළිබඳ රෝම ලන්දේසි නීතියේ මූල ධර්ම ; අදළ වන තන්හි ඉංග්‍රීසි නීතියද සහිතව.

59. **රෝම නීතිය.**—රෝම පුද්ගල නීතිය හා එහි ඉතිහාසය ; ව්‍යවස්ථාදායක හා අධිකරණ ක්‍රියා මාර්ගයන්ගේ ඉතිහාසය ද ඇතුළුව ගයස්ගේ හා ජස්ටිනියන්ගේ ආඥ සම්බන්ධකොට හදල යුතුය. පරිවර්තනය කිරීමට හා විවේචනාත්මක අදහස් පළ කිරීම සඳහා ඡෙදයන් දෙනු ලැබේ. එහෙත් හුදෙක් ග්‍රන්ථ කොටස් පරිවර්තනය කිරීමේ දක්ෂතාවට පමණක් ලකුණු දෙනු නොලැබේ.

60. **රාජ්‍ය විධි නීතිය.**—ඉංග්‍රීසි රාජ්‍ය විධි නීතිය ; එක්සත් රාජ්‍යය හා බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ අනික් කොටස් ද අතර ඇති සම්බන්ධය ලංකාවේ රාජ්‍ය විධි නීතිය.

61. **ජාත්‍යන්තර නීතිය.**—ජාත්‍යන්තර සංවිධානයද ඇතුළු ජාත්‍යන්තර සාම නීතිය.

62. **නීති විද්‍යාව හා නෛතික සිද්ධාන්තය.**—රාජ්‍යත්ව වාදය ද ඇතුළු නීතියේ ස්වභාව පිළිබඳ න්‍යායයෝ ; නීතියේ මූලාරම්භයන් හා එහි වැඩීම ඉංග්‍රීසි හා රෝම නීතිය කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව ; අයිතිවාසිකම් හා යුතුකම් (නෛතික හා සාධාරණ) වල ස්වරූපය හා වර්ගීකරණය නීතියෙහිදී යොදගනු ලබන ප්‍රධාන මතයන් පිළිබඳ විශ්ලේෂණය. නීති විද්‍යා ක්‍රම.

63. **අපරාධ නීතිය.**—ඉංග්‍රීසි අපරාධ නීතිය හා ලංකාවේ අපරාධ නීතිය ; අපරාධ නඩු සංවිධානය අත්හැරය.

**සී—කොටස**

46. **වාචසික පරීක්ෂණය (විශේෂ).**—පුද්ගලික ගුණාංගයන් සහ විදේශ රටවල්,ජාත්‍යන්තර කටයුතු, ජාත්‍යන්තර නීති සහ විදේශ භාෂාවන් පිළිබඳ විශේෂ දැනීම ද සැලකිල්ලට ගෙන, විදේශ සේවය සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුතාවය සොයාබැලීම සඳහා පවත්වන මෙය සාමාන්‍ය වාචසික පරීක්ෂණයට අමතර වශයෙනි.

7–569—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

ඊ. 4/69.

## ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට උසස් කිරීමේ තරඟ විභාගය—1969

1970 ජූනි මස 18 දිනැති අංක 14,911 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 ජූනි මස 9 වැනි දිනැති නිවේදනය සම්බන්ධවයි.

ඉහත සඳහන් විභාගය 1970 ජූලි මස 30 හා 31 වැනි දිනවලදී කොළඹදී පවත්වනු ලැබේ. ප්‍රවේශ පත්‍ර හා කාල සටහන් යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1, 1970 ජූලි මස 7 වැනි දින.

7–568—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

ඊ 5/65 (II) වෙළුම.

## ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන තරඟ විභාගය

1970 මැයි මස 29 වැනි දිනැති අංක 14,908 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 මැයි මස 10 වැනි දිනැති විභාග පරිපාටිය මෙයින් අවලංගු කරනු ලැබේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූලි මස 4 වැනි දින,
කොළඹ 1,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

7–550—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත්වීම—1970/71 අධ්‍යයන වර්ෂය

මෙම විද්‍යාලයයේ 1970/71 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ වන පස් අවුරුදු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් භාර ගනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 1970 ජූලි මස 31 දිනට ප්‍රථම කොළඹ 7, ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 23 හි පිහිටි රජයේ සංගීත විද්‍යාලයයේ විදුහල්පති වෙත ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

1. **සුදුසුකම් :**

(අ) 1970.7.31 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 16 ට වැඩි විය යුතු අතර අවුරුදු 25 ට නො වැඩි විය යුතුය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් (සාමාන්‍ය පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සමත් වී සිටිය යුතුය. අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් නම් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටිය යුතුය.

(ඉ) අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සංගීතය විෂයයෙන් හෝ විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ පෙරදිග සංගීත (ගාන්ධර්ව) විභාගයේ "ප්‍රාරම්භ" සංගීත විභාගයෙන් හෝ සමත් වී සිටිය යුතුය. (සිංහල සාහිත්‍යය, සංස්කෘත භාෂාව හා ඉතිහාසය යන විෂයයන්ගෙන් සාමාර්ථය ලත් අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(ඊ) චරිත සහතික දෙකක් ඉල්ලුම් පත්‍රයට ඈමිණිය යුතුය. (මෙයින් එකක් ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් විය යුතුය.)

2. **ප්‍රවේශ පරීක්ෂණය :**

(i) **ලිඛිත පරීක්ෂණය—**

(අ) සිංහල භාෂාව පිළිබඳ පැය 3 ක ප්‍රශ්න පත්‍රයක්. (වාක්‍ය රචනයක් සහිතව).

(ආ) අ. පො. ස. (සා. පෙ.) විභාගයේ සංගීත පිළිබඳ නිර්දේශ පත්‍රයේ තත්ත්වය අනුව පැය තුනක ප්‍රශ්න පත්‍රයක්.

(ii) **ප්‍රායෝගික පරීක්ෂණය—**

අ. පො. ස. (සා. පෙ.) සංගීත විභාග මට්ටමේ පරීක්ෂණයක් (ප්‍රායෝගික) පරීක්ෂණය, ගායනය, ස්වර වාද්‍ය හා තාල වාද්‍ය යන කොටස් තුනකින් යුක්තය. අයදුම්කරුවන් මෙයින් එක් පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතුය. තාල වාදනය, සඳහා අ. පො. ස. (සා. පෙ.) නිර්දේශයේ දැක්වෙන තාල නියමිත ය.

3. මෙම විද්‍යාලයයේ ඉගෙනුම සඳහා ගාස්තුවක් අය කරනු නො ලැබේ.

4. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. අසත්‍ය කරුණු ඇතුළත් කර ඇති බව ඔප්පු වුවහොත් ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරන බවත්, විද්‍යාලයට ඇතුළත් කර ගත් පසුව වුව ද නෙරපා හරිනු ලබන බවත් සැලකිය යුතුය.

බී. ජී. සුගතදාස,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපනාධ්‍යක්ෂ.

1970 ජූලි මස 8 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

**ආකෘති පත්‍රය**

### රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත්වීමේ අයදුම් පත්‍රය— 1970/71 අධ්‍යයන වර්ෂය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————,
3. උපන් දිනය :————.
4. 1970 ජූලි 31 දිනට වයස : අවුරුදු :——, මාස :——, දින :——.
5. ඉල්ලුම්කරුගේ පියාගේ/මවගේ/භාරකරුගේ නම :————.
6. ඔහුගේ/ඇයගේ ලිපිනය :————.
7. ඔහුගේ/ඇයගේ රක්ෂාව :————.
8. ඉල්ලුම්කරුගේ ජාතිය :————.
9. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.
11. සංගීත සුදුසුකම් :————.
12. හැදෑරීමට බලාපොරොත්තු වන විෂයයන් :————. (ගායනය/ස්වර වාද්‍ය/තාල වාද්‍ය)
13. චරිත සහතික ලබා ගත් අයගේ නම් හා තත්ත්වය :—
    (i) :————.
    (ii) :————.
14. අයදුම්කරු රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

| රු. 5 ක මුද්දරයක් මත කෙටි අත්සන තැබිය යුතුය. |
|---|

දිනය :————.

සැ. යු.—වයස අවුරුදු 18 ට අඩු සෑම අයදුම්කරුවකු විසින් ම පහත දැක්වෙන සහතිකය තමාගේ පියා/මව/භාරකරු ලවා සහතික කර ඉල්ලුම් පත්‍රයට ඈමිණිය යුතුය.

ඉහත සඳහන්————ගේ පියා/මව්/භාරකරු————වන මම අයදුම්කරු ඉහතින් සපයා ඇති විස්තර සත්‍ය බවත්, ඔහු/ඇ රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත් වී සංගීතය ඉගෙනුම ගැන මගේ විරුද්ධත්වයක් නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————.
අත්සන : පියා/මව/භාරකරු.

නම :————.
ලිපිනය :————.
දිනය :————.

7–559/1—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වීම— 1970/71 අධ්‍යයන වර්ෂය

මෙම විද්‍යාලයේ 1970/71 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ වන පස් අවුරුදු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් භාර ගනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරනලද අයදුම් පත් 1970 ජූලි මස 31 වන දිනට ප්‍රථම කොළඹ 7, ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 21 හි පිහිටි රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ විදුහල්පති වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. තමන් හැදෑරීමට බලාපොරොත්තු වන්නේ උඩරට හෝ පහත රට නැටුම් ද යන වග ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතු ය.

**සුදුසුකම්.—**

(අ) 1970.7.31 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 16 ට වැඩි විය යුතු අතර අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සමත්වී සිටිය යුතුය. අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් නම් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සමත්වී සිටිය යුතු ය.

(ඉ) විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ උඩරට නැටුම් (ගාන්ධර්ව) විභාගයෙ "ප්‍රාරම්භ" හෝ "මධ්‍යම" නැටුම් විභාගයෙන් හෝ සමත්වූ අයට හා සිංහල සාහිත්‍යය, සංස්කෘති භාෂාව හා ඉතිහාසය යන විෂයයන්ගෙන් සාමාර්ථය ලත් අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඊ) චරිත සහතික දෙකක් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. (මෙයින් එකක් ප්‍රදේශයේ ග්‍රාමසේවකගෙන් විය යුතුය.)

1. ලිඛිත පරීක්ෂණය :

(අ) සිංහල භාෂාව පිළිබඳව පැය 3 ක ප්‍රශ්න පත්‍රයක්. (වාක්‍ය රචනයක් සහිතව)

(ආ) පහත සඳහන් විෂයයන් ආශ්‍රිතව උඩරට හෝ පහත රට නැටුම් පිළිබඳ පැය 3 ක ප්‍රශ්න පත්‍රයක් :—

(i) උඩරට හෝ පහත රට දණ්ඩි කඳෙන් මූල් සරඹ හය.

(ii) තනි තිත, දෙතිත, තුන් තිතට අයත් බෙර මාත්‍රා, කස්තිරම් හා අඩව්.

(iii) වන්නම් හෝ සින්දු වන්නම් හයක්.

(iv) උඩරට හෝ පහත රට බෙර වාදනයට අයත් මූල් බෙර සරඹ හය.

2. ප්‍රායෝගික පරීක්ෂණය :

ලිඛිත පරීක්ෂණය යටතේ දැක්වෙන නැටුම්, ගායනය හා වාදනය පිළිබඳව.

3. අයදුම්කරුවන්ට පහත සඳහන් විෂයයන් දෙකින් එකක් හැදෑරිය හැකිය :—

(අ) උඩරට නැටුම් විෂයය : නැටුම්, වාදනය හා ගායනය.

(ආ) පහත රට නැටුම් විෂයය : නැටුම්, වාදනය හා ගායනය.

4. මෙම විද්‍යාලයයේ ඉගෙනුම සඳහා ගාස්තුවක් අය කරනු නො ලැබේ.

5. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. අසත්‍ය කරුණු ඇතුළත් කර ඇති බව ඔප්පු වුවහොත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන බවත්, විද්‍යාලයට ඇතුළත් කර ගත් පසුව වුව ද නෙරපා හරිනු ලබන බවත් සැලකිය යුතුය.

ඩී. ජී. සුගතදාස,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපනාධ්‍යක්ෂ.

1970 ජූලි මස 8 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

**ආකෘති පත්‍රය**

### රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වීමේ අයදුම් පත්‍රය 1970/71 අධ්‍යයන වර්ෂය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. 1970 ජූලි 31 දිනට වයස : අවුරුදු :——, මාස :——, දින :——.
5. ඉල්ලුම්කරුගේ පියාගේ/මවගේ/භාරකරුගේ නම :————.
6. ඔහුගේ/ඇයගේ ලිපිනය :————.
7. ඔහුගේ/ඇයගේ රක්ෂාව :————.
8. ඉල්ලුම්කරුගේ ජාතිය :————.
9. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.
11. නැටුම් පිළිබඳ සුදුසුකම් :————.
12. හැදෑරීමට බලාපොරොත්තු වන විෂයයන් :————. (උඩරට හෝ පහත රට) නැටුම් ද යන වග :————.
13. චරිත සහතික ලබා ගත් අයගේ නම් හා තත්ත්වය :————.
    (i) :————.
    (ii) :————.
14. අයදුම්කරු රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

| |
|---|
| රු. 5 ක මුද්දරයක් මත කෙටි අත්සන තැබිය යුතුය. |

දිනය :————.

සැ. යු.—වයස අවුරුදු 18 ට අඩු සැම අයදුම්කරුවකු විසින් ම පහත දැක්වෙන සහතිකය තමාගේ පියා/මව/භාරකරු ලවා සහතික කර ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.

ඉහත සඳහන්————ගේ පියා/මව/භාරකරු————වන මම අයදුම්කරු ඉහතින් සපයා ඇති විස්තර සත්‍ය බවත්, ඔහු/ඇ රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වී ඉගෙනුම ගැන මගේ විරුද්ධත්වයක් නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————.
අත්සන : පියා/මව/භාරකරු.

නම :————.

ලිපිනය :————.

දිනය :————.

7–559/2—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**තිරුවාන ගල් සැපයීම**

කොළඹ 7, නො. 55, රොස්මීඩ් පෙදෙසේ ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තැන විසින් 1970 ජූලි මස 23 වන දින පස්වරු 3 දක්වා, මීගමුව පිඟන් කම්හලට තිරුවාන ගල් සැපයීම සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

නැවත ලබාගත හැකි රු. 500 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා නැවත නොගෙවන රු. 10ක ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු පහත අත්සන් තබන අයගෙන් 1970 ජූලි මස 22 වන දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ලියකියවිලි ලබාගත හැක. සැපයීමට බලාපොරොත්තු වන තිරුවාන ගල් සාම්පලයක් ටෙන්ඩර් පත සමග ඉදිරිපත් කළ යුතුය.

සැපයීම් කළමණාකරු.

සැපයීම් හා වාප්පු දෙපාර්තමේන්තුව,
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
නො. 50, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7.

7–648—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## රජයේ සැපයීම දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 418, කොළඹ 1). පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ කැන්වස් සපත්තු සැපයීම ... ... ... | 1970.8.11 |
| 2. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ විශේෂ වර්ගයේ ලියුම්කවර සැපයීම ... ... ... | 1970.8.11 |
| 3. 1970.10.1 සිට 71.9.30 තෙක්, ඉවතලන කඩදාසි මිළදී ගැනීම | 1970.  .11 |
| 4. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ වානේ කැබිනට් හා කබඩ් සැපයීම ... ... ... | 1970.8.18 |
| 5. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ ලියන තීන්ත සැපයීම ... ... ... | 1970.8.18 |
| 6. 1970.8.1 සිට 1970.12.31 තෙක්, විදුලි කේතල, විදුලි ස්ත්‍රික්ක, හා විදුලි ගිණුම් උදුන් සැපයීම ... | 1970.8.18 |

ඉවතලන කඩදාසි මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ ලාංකිකයන්ට හා ලාංකික සමාගම් වලට පමණි.

ලියන තීන්ත සැපයීම සම්බන්ධයෙන්, ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින්, කොළඹ 7, බුලර්ස් පාරේ, අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන් ගේ සැම්පල් පරීක්ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතිකපත් ස්වකීය ටෙන්ඩර්පත්‍ර සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර්පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.7.17 දින,
කොළඹ දී ය.

7–673—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 අගෝස්තු මස 7 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා මීගමුවේ දූවට ටොන් ½ සිට 1 දක්වා බර ඇති කළුගල් 500ක් සහ 9"—12" සක්ක ගල් කියුබ් 100 ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1970 අගෝස්තු මස 7 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

(2) ටෙන්ඩර් කරුවන් කළුගල් පුපුරවීමට සහ ඒවා ප්‍රවාහනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ හා වාහන ආදිය තමන් සතුව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකි විය යුතු අතර, දැනටමත් විශාල කොන්ත්‍රාත් යටතේ කුට්ටි ගල් සපයා තම හැකියාවන් තහවුරු කර සිටිය යුතුය.

(3) ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නො එවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

(4) ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100ක මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

(5) ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1970 අගෝස්තු මස 5 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1970. 7. 17 දින.

7–662—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—වවුනියාව

වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා වෙන් වෙන්ව, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970 අගෝස්තු මස 4 වෙනි අඟහරුවාදා දහවල් 12 දක්වා භාරගනු ලැබේ :—

(1) දේවිපුරම් පාරට පිවිසීමේ ප්‍රධාන මාර්ගයේ පාර එලිකිරීම සහ පාර සකස් කිරීම.

(2) දේවිපුරම් පාරට පිවිසීමේ ප්‍රධාන මාර්ගයේ බොරලු ඇමීම.

සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර, ඒවා වවුනියාව කච්චේරියෙන් ලබා ගන්නා ලද නියමිත පෝර්ම වල විය යුතුය. මේ සම්බන්ධයෙන් වෙනත් සියලුම විස්තර වවුනියාව කච්චේරියෙන් ලබා ගත හැක. රජයේ දෙපාර්තමේන්තු වල ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන් හා අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති විවිධ සේවා සමුපකාර සමිති පමණක් මෙම ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වේ. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නන්ට ටෙන්ඩර් පෝර්ම සහ අනිකුත් ලියකියවිලි දෙනු ලබන්නේ ඔවුන් විසින් එක් එක් වැඩය වෙනු වෙන් වවුනියාව කච්චේරියේ රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ග්‍රාම සංවර්ධන සමිති හා විවිධ සේවා සමුපකාර සමිති මෙම තැන්පත් මුදල බැඳීම අවශ්‍ය නොවේ. 70.8.3 දින ප. ව. 3 දක්වා මෙම දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර්පත්‍ර ලබා ගත හැක.

ඒ. පෙරුමසිතාර්,
වවුනියාව දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1970 ජූලි මස 5 වෙනි දින,
දිසාපති කාර්යාලය, වවුනියාව.

7–555—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## යකඩ සුන්බුන් පැටවීම, බෑම සහ අඩුක්කිරීම

යකඩ සුන්බුන් ටොන් 5,000 ක් පමණ ප්‍රමාණයක් රත්මලානේ දුම්රිය වැඩපොල භූමියෙන් දුම්රිය බඩු වාහන වලට පැටවීමටත්, එම ද්‍රව්‍ය එබේරමුල්ලේ පිහිටා ඇති චීනාච්චව්චි ත්‍රාත්තු කම්හල් භූමියේ බෑමට සහ අඩුක්කිරීමටත් 1970 ජූලි මස 30 වැනි දින උදේ 10.00 වනතෙක් මෙම කාර්යාලයෙන් ලබාගතහැකි ටෙන්ඩර් පත්වල ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් 1970 ජූලි මස 29 වැනි දින දහවල් 12.00 ට ප්‍රථම රුපියල් 500 ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් ලබාගත හැක. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 5 ක් ගෙවීමෙන් ලබාගත හැක.

මිලට ගැනුම් කළමණාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.

7–653—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි භූමි ප්‍රදේශය වෙත ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය මෙහි පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා මෙහි පහත අත්සන් කරන නිලධාරියා විසින් 70.8.25 වෙනි දින පෙ. ව. 10 වනතෙක් ටෙන්ඩර් පත්‍ර බාර ගනු ලැබේ.

| | ඒකකය | මුළු වර්ෂය සඳහා දළ වශයෙන් අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| කළුගල් 6″ —9″ | කියුබ | ... 20 |
| ගංගා වැලි | කියුබ | ... 30 |
| කඩාපු ගල් 3/4″ | කියුබ | ... 30 |
| අළුහුණු | බුසල් | ... 100 |
| කම්බාපු හුණු | ටින් | ... 30 |

2. ටෙන්ඩර් පත් පිටපතකින් සමන් විය යුතුයි. එක් එක් විෂය සඳහා ටෙන්ඩර් කරණු ලබන මිළ ගණන් ඒ ඒ විෂයන්වලට ඉදිරියෙන් ඉලක්කමෙන් සහ වචනයෙන්ද දක්විය යුතුය. මිළ ගණන් එක් එක් ඒකකය සඳහා විය යුතුය.

3. සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කාර්යාලයේ හෝ කොළඹ හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කලයුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින්ම සකස් කරගතයුතුයි. ටෙන්ඩර්තැන්පත් මුදල සම්බන්ධයෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත්කරන ටෙන්ඩර් පත්‍රයට අමුනා තිබිය යුතුය. එසේ නොඑවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ.

4. ඉහත සඳහන් ද්‍රව්‍ය අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදිකරනු ලබන භූමිපෙදෙස වෙත සපයා ක්‍රමානුකූලව ගොඩ ගැසිය යුතුය.

5. සියලුම ටෙන්ඩර් පත්‍ර කවරයක දමා එය සීල් තබා කවරය වම් පස උඩ කෙළවරේ '' ගොඩනැගිලි සඳහා ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර්'' යන්න සඳහන්කොට ලියාපදිංචි තැපැලෙන් අනුරාධපුර බන්ධනාගාර අධිකාරි, අනුරාධපුරය, වෙත එවිය යුතුය,. නො එසේනම් අනුරාධපුර බන්ධනාගාරයේ අධිකාරි තුමාගේ කාර්යාලයේ මේ සඳහා තබා ඇති පෙට්ටියේ 1970.8.25 වැනි දින පෙ. ව. 10 ට පෙර බහාලිය යුතුය.

6. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් කලින් කලට ඔහු වෙත නිකුත් කෙරෙන ඇණවුම්වල සඳහන් ද්‍රව්‍ය නියම කරන ලද කාලසීමාව ඇතුලත සපයන බවට පහත අත්සන් තබාඇති නිලධාරියා සමග ගිවිසුමකට බැඳිය යුතුය. යම් හෙයකින් කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව යම් අයෙක් සැපයීම් කිරීමට අපොහොසත් වුවහොත් හෝ සැපයීම් පැහැර හැරියොත්, ඔහුගේ නම කොන්ත්‍රාත්තු පැහැර හැර ගිය අයවලුන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට හා ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදලද රාජ සන්තක කිරීමට ඉඩ තිබේ.

7. තොරාගත් ටෙන්ඩර්කරු වෙත අවශ්‍ය බඩු සපයන ලෙස දනුම් දී දින 14 ක් ඇතුලත ටෙන්ඩරයෙහි සඳහන් ද්‍රව්‍යවලින් 1/5 සැපයිය යුතු අතර ඉතිරි කොටස ඇණවුම් කැබූ ඒ ඒ අවස්ථාවල කොන්ත්‍රාත්තුවට අනුකූලව සැපයිය යුතුය.

8. ටෙන්ඩර්කරුවන් විසින් සැපයීමට බලාපොරොත්තුවන කඩාපු කළුගල්, හෙළේ වැලි ආදියෙහි (සැම්පල්) ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුය. සැපයීමට බලාපොරොත්තුවන කඩාපු ගල් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වැඩදෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඇති හෙයින් ඒවා ඉස්තරම් වර්ගය විය යුතුය. එසේ නොතිබුන හොත් එම ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. අනුරාධපුර බන්ධනාගාරයේ අධිකාරි තුමා විසින් 1970.8.25 වෙනි දින දහවල් 10.05 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩර් පත්‍රයක යම් කිසි කොටසක් පිලිගැනීමේ බලය සහ අයිතිය රජය සතුවේ.

11. අවශ්‍යනම් මෙහි පහත අත්සන් තබා ඇති නිලධාරියාගෙන් වැඩි විස්තර ලබාගත හැක.

සී. ඇම්. කොට්ලිංගම්,
බන්ධනාගාර අධිකාරි.

70.6.26 වෙනි දිනය,
අනුරාධපුර බන්ධනාගාරයේදිය.

7–605—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට දෙවර්ෂයක කාල සීමාව තුළ මෙහි පහතින් සඳහන් දුම්රිය ස්ථානවල බඩු බෑම සහ පැටවීම සඳහා ලියාපදිංචි කළ ටෙන්ඩර් කරුවන්ගෙන් 1970 අගෝස්තු මස 14 වෙනි සිකුරාදා පෙ. ව. 10 දක්වා කොළඹ තැ. පෙ. අංක 355 දරන ලංකා දුම්රිය සේවයේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල සභපති විසින් ටෙන්ඩර් භාර ගනු ලැබේ :—

| | |
|---|---|
| (1) මාතර | (10) හැටන් |
| (2) ගාල්ල | (11) නාවලපිටිය |
| (3) පොල්ගහවෙල | (12) ගම්පොල |
| (4) කුරුණෑගල | (13) වත්තේගම |
| (5) මහව | (14) මාතලේ |
| (6) යාපනය | (15) නානුඔය |
| (7) රඹුක්කන | (16) හපුතලේ |
| (8) මහනුවර | (17) බන්ඩාරවෙල |
| (9) තලවකැලේ | (18) බදුල්ල. |

2. මෙතෙක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ මේ සම්බන්ධව සැලකිලිමත් වීන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ නාමයන් ලියාපදිංචි කරන ලෙස ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරී වෙත පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමින් 1970 අගෝස්තු 3 වෙනි සඳු දින හෝ ඊට ප්‍රථම අයදුම් කළ යුතුයි :—

(අ) මෙම වර්ගයේ ව්‍යාපාර ගැන කලින් ඇති පළපුරුද්ද සම්බන්ධ විස්තරයක් සහිත ප්‍රකාශයක් ද පෙර පළපුරුද්ද කාර්යක්ෂම සහ මුදල් ස්ථාවරත්වය පිළිබඳව මහා භාණ්ඩාගාර චක්‍රලේඛණ 1085 පී/282/2ඒ හා 1961. 5. 26 අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉටු කරන ලද රජයේ කොන්ත්‍රාත්තු දැක්වෙන ප්‍රකාශයක් සහ එහි විස්තර,

(ඇ) සතු ඉඩකඩම් දේපල හා වෙනත් ව්‍යාපාර සම්බන්ධකමද, එය පිහිටි දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්කද දැක්වෙන සම්පූර්ණ විස්තරය සහිත ප්‍රකාශයක්, සහ

(ඈ) රජයේ කොන්ත්‍රාත්තු කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට සිය නම් ඇතුළු වී නැති බවට ප්‍රකාශයක්.

3. කොළඹ තැ. පෙ. 355 දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබා ගත යුතු ආකෘති පත්‍රවල ෂෙපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් සෑම සේවාවක් උදෙසාම රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලයේ හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 අගෝස්තු මස 11 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මෙම නිවේදනය සහ විස්තර ප්‍රකාශයද සමග ටෙන්ඩර් මුද්‍රා තබා කොළඹ 10 තැ. පෙ. 355 ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති නමට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම් ලිපිනය සහ සේවය විස්තර කවරයේ සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාර ගැනීමට බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ පැමිණ භාර දී එය භාර ගත් බවට ඔවුන්ගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. ඉහත සඳහන් පළමු වැනි ඡේදයේ නියමිත දිනය සහ වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එසේ කැමැත්තේ නම් ටෙන්ඩර්කරුවන්ටද එහි පෙනී සිටිය හැක. 1970 අගෝස්තු 14 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් භර ගැනීමේ අවසාන දිනයේ සිට ඉදිරියට සති 6 කාලයකට ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වැඩිපුර විස්තර කොළඹ 10, ල. දු. සේ. වාණිජ අධිකාරීගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

වී. ටී. නවරත්න,
වැඩබලන දුම්රිය සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. අංකය 355,
කොළඹ 10, 1970. 7. 2.

7–634—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### නුවරඑළිය උප කොට්ඨාශය

පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත් 1970 අගෝස්තු මස 12 වන බදාදා පෙ.ව. 10 දක්වා කුණ්ඩසාලේ, මධ්‍යම කොට්ඨාශයේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

| වැඩ විස්තරය | අවශ්‍ය ලියා පදිංචි මුදල රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|
| මල්උල්ල වැව ව්‍යාපාරයට සිදුවී ඇති ගංවතුර අලාභ හානි අළුත්වැඩියා කිරීම හා ආර්.සී.සී. කොන්ඩියුට් එකක් සෑදීම ... | ... 25,000 0 ... | 25 0 |

2. ඉහත සඳහන් ගණනට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

3. 1970 අගෝස්තු මස 8 වන ඉරිදා දවල් 12 දක්වා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී, නුවර එළිය, මහනුවර, මාතලේ සහ හසලක යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් දෙපිට පතකින් යුතුව ලබා ගත හැකි ටෙන්ඩර් පෝරමවල අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර, කුණ්ඩසාලේ මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත, 1970 අගෝස්තු මස 12 වන බදාදා පෙ.ව. 10 ට පෙර, සීල් තබන ලද කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමේදී ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල්, ඒ ඒ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල හෝ එම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම ටෙන්ඩර් පිළිබඳ සියළුම විස්තර, සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී, නුවරඑළිය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් දැන ගත හැක.

ජී. අම්බිකායිපහාර්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
නුවරඑළිය උප කොට්ඨාශය.

1970 ජූනි මස 30 වන දින,
නුවරඑළිය වාරිමාර්ග කාර්යාලයේ දීය.

7–484—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### දැරංගල වීරපාන රජයේ ගොවිපලේ රබර් ගස් 1,900 ක් කිරි ගැනීම සඳහා බදුදීම

මාතර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වීරපාන ගොවිපලේ ඇති රබර් ගස් 1,900 ක් කිරි ගැනීම පිණිස බදු දීම සඳහා 1970 ජූලි මස 30 වැනි දින පස්වරු 2.30 වන තෙක් ටෙන්ඩර් කැඳවනු ලැබේ. මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන්නවුන් පහත සඳහන් කොන්දේසි පිළිගැනීමට බැඳී සිටිය යුතු අතරම, ගොවිපල කළමනාකාර තැනගේ උපදෙස් පිළිපැදිය යුතුය :—

(1) රබර් ගස් 1,900 බදු දීම කරනු ලබන්නේ එක් වර්ෂයකට සීමිත වන පරිදිය.

(2) කිරි ගැනීමට ගස් කැපිය යුත්තේ ගොවිපල කළමනාකරු විසින් ලකුණු කරනු ලබන පරිදිය. එක් වරකට තනි කැපුමකට වඩා නොකැපිය යුතුය.

(3) දිනක් ඇර දිනක් කිරි ගැනීම කළ යුතුය.

(4) දින 30ක් ඇතුලතදී අඟලකට වඩා කැපුමේ බැස්සවීම නොකළ යුතුය.

(5) කිරි ගැනීමේදී කිසිදු ගසකට හානි නොවන පරිදි ක්‍රියා කළ යුතුය.

(6) රබර් කිරි ගැනීමට අවශ්‍ය පොල් කටු හා රබර් පිලි, පිළිගත් ටෙන්ඩර්කරු විසින්ම සපයා ගත යුතුය.

(7) පිලිගත් ටෙන්ඩර්කරු විසින් ඉල්ලුම් කර ඇති මුළු මුදලම ටෙන්ඩරය බාර ගැනීමට පෙර එක්වර ගෙවිය යුතුය.

2. ටෙන්ඩර් පෝරම මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර්පත්‍ර අනු පිටපතක්ද සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා, එහි මුදුන් වම් කොනේ "වීරපාන රජයේ ගොවිපලේ රබර් ගස් 1,900 ක් කිරි ගැණීම සඳහා බදුදීම" යන්න ලියා, මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර්පත් විවෘත කිරීමට නියමිත දිනට පෙර දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. පෝර්ම නිකුත් කරනු ලබන්නේ, එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මෙම මුදල් තැන්පත් කිරීම, ඕනෑම කච්චේරියක හෝ කොළඹ, යෝක් වීදියේ පිහිටා ඇති ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කළ යුතුය. පොරොන්දුපත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුලත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දුපත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර්පත් රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර්පත් රිජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම බාරදිය යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත් ලැබුනු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවනට එවැනි දැන්වීමක් ටෙන්ඩර්පත් විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුලත නොලැබුණේ නම් ඒ ගැන මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් වහාම විමසිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත සඳහන් ටෙන්ඩර් බාරගැනීම නැවැත්වීමට නියමිත වේලාවේදී මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ඇත.

6. නියමිත පෝර්මයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැත හෝ කිසිම ටෙන්ඩර්පත්‍රයක් ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තම ලිපිනය නිවැරදිව පැහැදිලි අකුරෙන් ටෙන්ඩර්පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් වූ ද, පිළිගනු ලැබුවා වූ ද, දේවල මුළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමට හා පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

9. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරණු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙණ ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාතක්රු බැඳී සිටී.

10. පොරොන්දුපත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර්පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර්පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර ගොවිපළ පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධත්වය පලකරන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. වැඩි විස්තර මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් හා වීරපාන රජයේ ගොවිපල කළමනාකරුගෙන් ද දැනගත හැකිය.

එම්. එල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1970.7.4 දින,
පේරාදෙණියේ දීය.

7–482—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය

### කාර් ටයරයන් හා ටියුබයන් විකිණීම

පහත සඳහන් භාණ්ඩයන් විකිණීම සඳහා 1970 ජූලි 31 වැනි දින පෙ.ව. 10.00 දක්වා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මිළ ගණන් බාරගනු ලැබේ.

| අංක | | භාණ්ඩ විස්තරය | | දළ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | ... | මීවැලින් X ටයරයන් 165 × 15 | ... | 38 යි |
| 2 | ... | මීවැලින් X ටියුබයන් 165 × 15 | ... | 22 යි |

2. මෙම භාණ්ඩයන් 19.7.70 වැනි දින සිට 30.7.70 වැනි දින දක්වා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී කොළඹ 2, යූනියන් පෙදෙස අංක 330, දරණ ස්ථානයේ පිහිටි මෙම අමාත්‍යාංශ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇත.

3. ලිඛිත මිළ ගණන් කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 330 දරණ ස්ථානයේ පිහිටි කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති අමතා "පරණ ටයර් හා ටියුබ් මිළයට ගැනීම සඳහා මිළ ගණන්" යනුවෙන් කවරයේ සඳහන් කර, මුද්‍රා තබා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැතහොත් ඒවා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශ කාර්යාලයයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුයි.

4. මිළ ගණන් 31.7.70 වැනි දින පෙ.ව. 10.00 ට විවෘත කරනු ලැබේ. මිළ ගණන් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන් කැමැති නම්, ඔවුන්ට එසේ කළ හැක.

5. සාර්ථක ටෙන්ඩර්කරු විසින් සිය මිළ ගණන් පිළිගත් බවට දැනුම් දීමක් ලැබී දින 7 ක් ඇතුළත තමන් විසින් ටෙන්ඩර් කරනු ලැබූ මුළු මුදල් ප්‍රමාණයම ගෙවිය යුතු අතර, එම භාණ්ඩයන් එම ගෙවීම කර දින 2ක් ඇතුළත දී ඉවත් කර ගෙන යා යුතුයි.

ඩී. සී. ඊ. ඇස්. සිරිමාන්න,
ස්ථිර ලේකම් වෙනුවට.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
330, යූනියන් පෙදෙස,
කොළඹ 2.
1970 ජූලි මස 6 වැනි දින.

7–498—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කුණ්ඩසාලේ පාසැල් ගොවිපලෙහි ශීතකර කාමරය සෑදීම

අංක 14,909 හා 1970. 6. 5 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 1970. 5. 23 වැනි දින දරණ ටෙන්ඩර් දැන්වීම පිළිබඳවයි.

ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම, 1970.8.12 වෙනි දින ප. ව. 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය, 1970. 7. 7.

7–562—70.71.7 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පට්ටි මධ්‍යස්ථාන ඉදිකිරීම

මෙහි පහත සඳහන් ස්ථානවල ඇති පට්ටි මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදි කිරීම සඳහා කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 8. 11 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. එක් එක් ස්ථානයට යටත් ව ඇති ගොඩනැගිලි සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර එක් ස්ථානයක් වෙනුවෙන් හෝ ස්ථාන කිහිපයක් වෙනුවෙන් හෝ ටෙන්ඩර් කිරීමට අපේක්ෂකයනට අවකාශ ඇත.

(අ) මැදියාව (කුරුණෑගල දිස්ත්‍රික්කය)

(ආ) පුල්මුඩෙයි (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය).

(ඇ) මදුරංකුළිය (පුත්තලම් දිස්ත්‍රික්කය).

(ඈ) ගලෙන්බිඳුනු වැව (අනුරාධපුර දිස්ත්‍රික්කය).

(ඉ) තඹුත්තේගම (අනුරාධපුර දිස්ත්‍රික්කය).

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝරම පත්‍රවල පිටපත් දෙක කින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. සෑම ටෙන්ඩර් කරුවෙකුම රු. 5,000 කට නොඅඩු කොන්ත්‍රාත් භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් වශයෙන් රජයේ ලියා පදිංචි විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970. 8. 3 දින ප. ව. 4.00 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය.

(අ) 3 ඡේදයේ සඳහන් අයුරු ලියා පදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) එක් එක් ස්ථානය වෙනුවෙන් රු. 25 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

එස්. කදිරකාමතම්බි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.
1970. 7. 6

7–573—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බිබිල—පශු වෛද්‍ය බෙහෙත් ශාලාවක් ඉදිකිරීම

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.8.4 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරුතැනගෙන් ලබාගත හැකි ෆෝර්මපත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 35,000කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.7.31 වැනි දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

එල්. එස්. එස්. ජයසුන්දර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5, 1970.7.8.

7–602—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අනුරාධපුර කොටසේ රජයේ ගොවිපල වලට ඉදුනු කොහු අඹ සැපයීම—1970/71 මහ කන්නය

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් අනුරාධපුර කොට-සේ පහත සඳහන් ගොවිපල වලට එම ගොවිපලේ නම් ඉදිරියේ දක්වා ඇති හොඳට පැසුනු පැල කිරීමට සුදුසු කොහු අඹ ප්‍රමාණයන් සැපයීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970.8.4 වෙනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ :—

ඒ ඒ අඹ ප්‍රමාණයන් පහත සඳහන් මාස වලදී ඒ ඒ ගොවිපල් වලට සැපයිය යුතුවේ.

| | ගොවිපල | අවශ්‍ය අඹ ප්‍රමාණය | සැපයියයුතු මාස |
|---|---|---|---|
| 1. | මහඉළුප්පල්ලම පාසැල් ගොවිපල ... | 30,000 ... | 1970 ඔක්තෝබර් හෝ නොවැම්බර් |
| 2. | පැල්වෙහෙර ගොවිපල ... | 30,000 ... | 1970 ඔක්තෝබර් සිට දෙසැම්බර් කාලය තුළ |
| 3. | පොළොන්නරුව බිත්තර වී ගොවිපල... | 5,000 ... | 1970 දෙසැම්බර් සිට 1971 ජනවාරි කාලය ඇතුලත |
| 4. | අනුරාධපුර ගොවිපල ... | 8,000 ... | 1970 සැප්තැම්බර් |
| 5. | හිඟුරක්ගොඩ ගොවිපල ... | 50,000 ... | 1970 ඔක්තෝබර් සිට දෙසැම්බර් |

ටෙන්ඩර්කරු විසින් සපයනු ලබන අඹවලට මුදල් ගෙවනු ලබන්නේ අඹ භාර දුන් පසු ඒවා කපා පරීක්ෂා කිරීමෙන් පසුවය. පැල කිරීමට නුසුදුසු හෝ සතුන්ගෙන් හානි පැමිණ ඇති අඹ වලට මුදල් ගෙවනු නො ලැබේ.

2. අනුරාධපුර කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන) තැනගෙන් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා, මුද්‍රා තබා ''පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් කාර්යාලයේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති'' නමට එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර අනු පිටපතකින් යුක්ත විය යුතු අතර, ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි වම්පස උඩ කෙලවරේ ''අනුරාධපුර කොට්ඨාශයේ රජයේ ගොවිපල වලට ඉදුනු කොහු අඹ සැපයීම සඳහා ටෙන්ඩර්'' යන්න සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. නැතහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ඒවා පෙරාදේණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් කාර්යාලයේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට අතින්ම භාරදිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි ද වම්පස උඩ කෙලවරෙහි ''අනුරාධපුර කොට්ඨාශයේ රජයේ ගොවිපල වලට ඉදුනු කොහු අඹ සැපයීම සඳහා ටෙන්ඩර්'' යන්න සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුනු බව ඒවා විවෘත කළ දිනයේම ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්-ඩර් පත්‍ර භාරදීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ටෙන්ඩර් මණ්ඩල-යේ සභාපති තැනගෙන් ඒ ගැන විමසිය යුතුයි.

5. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ අනුරාධපුර, කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන) තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970.8.3 වැනි දින දහවල් 12වන තෙක් දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ ටෙන්ඩරය සඳහා රු. 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුව පමණි. එම මුදල් තැන්පත් කිරීම දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කළ හැක.

6. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් දිනවලට පෙර හොඳට පැසී ඉදුනු කුණු නොවූ පැල කිරීමට සුදුසු කොහු අඹ ඒ ඒ ගොවිපල වලට ගෙනැවිත් භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වනු ලැබීමෙන් පසු දින දහයක් ඇතුළත ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මුදලෙන් සියයට පහක (5%) ඇප මුදලක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුයි. නියමිත කාලය තුලදී ඇපය තැබීමට තෝරාගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වීමට ඉඩ තිබේ. ඇප තැබීමෙන් පසුවද දන්වන ලද කාලය තුලදී ඉදුනු කොහු අඹ සැපයීමට ටෙන්ඩර්කරුට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල හා ඇප මුදල රාජසන්තක වීමට ඉඩ ඇති අතර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වීමට ද ඉඩ ඇත.

7. නියමිත ආකෘතියේ ලියා නැති හෝ එහි නියමිත කොටස් සම්පූර්ණ කර නැති ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලිව තීන්තෙන් ලකුණු කළයුතු අතර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුය.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, යම්කිසි ටෙන්ඩර් පත්‍රයක කොටසක් පිළිගැනීමේත් බලය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

9. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතට ම භාරදුන්නා සේ සලකනු ලැබේ.

10. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම ඇතුලත් වූ කිසිවෙකු සමඟ හෝ ටෙන්ඩර් මණ්ඩලයට සෑහේයයි පෙනී යන හේතු පිට ටෙන්ඩර් මණ්ඩලය විරුද්ධවන කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් යටත් පිරිසෙයින් සති දහසයක ටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් තෝරා ගනු ලබන ටෙන්ඩර් කරු විසින් නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි. කොන්ත්‍රාත්-තුවේ මේ කොන්දේසිය සපුරාලීමට ටෙන්ඩර්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විශේෂ අවස්ථා වලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ අනුමැතිය ඇතිව ලාංකික නොවන කම්-කරුවන් නියුක්ත කරවීමට ටෙන්ඩර්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ. ''ලාංකික'' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි. කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලව ද, වේතනයක් ගෙවීමට තෝරා

ගත් ටෙන්ඩර්කරු එකඟ විය යුතුයි. කොන්ත්‍රාත්තුවේ වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට තෝරා ගත් ටෙන්ඩර්කරු බැඳී සිටිය යුතුයි.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි අධිකාරය) යටතේ සේවකයෙකු විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කවර වන්දියක් සම්බන්ධයෙන් වුවද රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත් කරු වග බලා ගත යුතුය.

14. මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම්, අනුරාධපුර කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරී (ගොවිපල් පාලන හා නිෂ්පාදන) නැතගෙන් ලියා විමසන්න.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1970.7.8 දින, පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
කෘෂිකර්ම ගොවිපල් කාර්යාලයේ දීය.

7–593—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍යයන් හා සේවය කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයට ලබා ගැනීම සඳහා 1970–71 මුදල් වර්ෂය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර 1970.8.18 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ:—

| | ද්‍රව්‍යය | ප්‍රමාණය |
|---|---|---|
| (අ) | පාන් (අවුන්ස 16ට නොඅඩු) ... | ...රා 55,000 |
| | අවුන්ස හතරේ (4) ටී බනිස් ... | ... 10,000 |
| | හරක් මස් කටු නැති ... | ... 12,000 |
| | ඉඳි ආප්ප (එකක් අවු. 1½ ට නොඅඩු) | ... 1,80,000 |

| | මාළු | රාත්තල් |
|---|---|---|
| (ආ) | ඉස්සන් ... ... | ... 500 |
| | පරව් ... ... | ... 1,100 |
| | බලයා ... ... | ... 1,100 |
| | කෙලවල්ලන් ... ... | ... 1,000 |
| | ගල්මාළු ... ... | ... 1,100 |

(ඇ) ශිෂ්‍යත්වධාරී සිසුන්ගේ සහ විද්‍යාලයට අයත් ඒකකවල රෙදි ඇපිල්ලීම.

(පාන් සහ බනිස් පෙරවරු 6.00 හෝ ඉන් පෙර සිසු නිවාස වලට ගෙනවිත් භාරදිය යුතුයි).

2. කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අයදුම් පත් ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර (පෝර්ම) අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යනුවෙන් එහි පිට ලියා එහිම මුදුනේ කෙළවර "කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයට පාන් සැපයීම" (වෙනත් ද්‍රව්‍යයක් නම් ඒ ද්‍රව්‍යයෙහි නම යෙදිය යුතුයි) යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක් තැන්පත් කල බවට කුවිතාන්සියක් ඉදිරිපත් කල පසුවය. මේ තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ මහනුවර කච්චේරියේ කල යුතුයි. පොරොන්දු පත්‍රයක් අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවාට මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 14 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නට ඉඩ ඇත.

4. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් කටයුතු කරන ලිපිකරුට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් බහාලන ලද කවරයෙහි "කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයට ..........................(ද්‍රව්‍යයේ නම) සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනයද ඇතුලත් කළ යුතුයි. ලියා පදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදී සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දන්වීමක් නොලැබුණහොත්, ඔහු පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් ඒ ගැන කරුණු වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ එක් නියෝජිතයෙකුට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දිනයේදී ඉහතකී වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළහොත්, ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි ලෙස අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද, පිළිගනු ලැබූවාවූද, දේවල්වල මුලු වියදමින් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල් ආපසු දෙනු ලබන්නේ, කොන්ත්‍රාත්තුව සතුටුදායකව ඉටුකළ පසුවය. මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් ගෙවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට, සති තුනක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත්, බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟවෙන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ ද, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාකරුවා යම් කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිළධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එහි නිළධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලාංකික රට වැසියෙක් අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසි වලට අනුකූල වූද, වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත් කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

12. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියලුම දන්වීම් ඔහුගේ අතට දුන්නහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ, නම් තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත් වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධ වෙන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ විදුහල්පතිගෙන් දැනගත හැකිය.

ම. ලෙ. ක්‍රි. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක,
(කෘෂිකර්ම ගොවිපලවල්).

1970 ජූලි මස 8 වෙනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

7–592—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මිළ ගණන් කැඳවීම් පත් අංකය : ඇල්. කිව්. 697058

පහත දක්වා ඇති විස්තර අයුරු ෆෝක් ලිෆ්ට් ට්‍රක්ස් හයක් සැපයීම සඳහා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉන්ජිනේරු අංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1970.7.31 දින පෙරවරු 10.30 තෙක් මිළ ගණන් භාරගනු ලැබේ :–

| අංකය | විෂය | ප්‍රමාණය |
|---|---|---|
| (1) | ඩීසල්වලින් ක්‍රියා කරන ෆෝක් ලිෆ්ට් ට්‍රක්ස් ... | 3 යි |
| (2) | බැටරිවලින් ක්‍රියා කරන ෆෝක් ලිෆ්ට් ට්‍රක්ස් ... | 3 යි |

(වැඩි විස්තර සඳහා කරුණාකර මෙහි ඉංග්‍රීසි අනුවාදය බලන්න)

2. මිළ ගණන් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ " ෆෝක් ලිෆ්ට් සැපයීම සඳහා මිළ ගණන් පත් අංක ඇල්. කිව්. 697058 — අවසාන දිනය 70.7.31 " යන්න සඳහන් කර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිළ ගණන් වැසීමට නියමිත වේලාවට පෙර දෙපිටපතකින් යුතුව ලැබෙන්නට සැලැස්විය යුතුයි.

3. මිළ ගණන් දැක්විය යුත්තේ—

(අ) ගබඩාවෙන් සැපයීම සඳහා; හෝ

(ආ) තීරු ගාස්තුව නොමැතිව ආනයන කොට සැපයීම සඳහා (මෙම උපකරණ නාරාහේන්පිට නාවල පාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයට සැපයීම කළ යුතුව ඇත).

4. ඉහත 3 (ආ) ඡෙදය අයුරු පිලිගත් ටෙන්ඩර්කරු තමාගේ මිළ ගණන් භාරගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට සති 8ක් ඇතුලත එම ද්‍රව්‍ය දීම කළ යුතුය.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිළ කැඳවීමක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම මිළ කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

70.7.1 දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ඉංජිනේරු අංශයේදීය.

7–594—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## මෝටර් වාහනයක් විකිණීම

පහත සඳහන් මෝටර් වාහනය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1970 ජූලි මස 31 වැනි දින පෙරවරු 10.30 දක්වා කැඳවනු ලැබේ.

ඩොජ් ලොරිය අංක ඕඞ් 1045

තාර බර : හො. 60, කා. 3, රා. 7.

නියමිත බර : රාත්තල් 7,689.

මහරගම, හයිලෙවල් පාරේ අංක 88 දරණ ලංකා බැංකු ශාඛාවේ දී 70. 7. 30 දින දක්වා සාමාන්‍ය රාජකාරි වේලාවන් වන උදේ 9 සිට සවස 4 දක්වා මෙම වාහනය පරීක්ෂා කොට බැලීමට පුළුවන.

නැවත ආපසු ලබා ගැනීමට හැකි රු. 100 ක මුදලක් කොළඹ 1, යෝක් වීදියේ මධ්‍යම කාර්යාලයේ ලංකා බැංකුවේ, ගිණුම් අංශයේ තැන්පත් කොට එම රිසිට් පත ද ටෙන්ඩර් පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර, කොළඹ 1, යෝක් වීදිය, මධ්‍යම කාර්යාලයේ ලංකා බැංකුවේ සැපයුම් අංශයේ කළමනාකරුගෙන් ලබා ගත හැකිය.

2–607—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—වවුනියාව

වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා වෙන් වෙන්ව මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්‍ර 1970 ජූලි මස 30 වැනි දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ :—

(1) වවුනියාව දිසාපති කාර්යාලයීය (ආපනශාලා) ස්ථිර ගොඩනැගිල්ලෙහි වහල ආදී දෑ ඉදිකිරීමේ කටයුතු, හා

(2) මූලතිව් හා මාන්කුලම්හි තානායම්වල සුළු වැඩිදියුණු කිරීමේ කටයුතු.

2. සියලුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුක්ත වියයුතු අතර, ඒවා වවුනියාව කච්චේරියෙන් ලබා ගන්නා ලද නියමිත ෆෝර්මවල විය යුතුය. මේ සම්බන්ධව වෙනත් සියලු විස්තර වවුනියාව කච්චේරියෙන් ලබාගත හැක. රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන් හා අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ විවිධ සේවා සමුපකාර සමිති පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර එවීමට සුදුස්සන් වේ. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නන්ට ටෙන්ඩර් ෆෝර්ම සහ අනිකුත් ලියකියවිලි දෙනු ලබන්නේ ඔවුන් විසින් ඒ ඒ එක් එක් වැඩය වෙනුවෙන් වවුනියාව කච්චේරියේ රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සි පතක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ග්‍රාම සංවර්ධන සමිති හා විවිධ සේවා සමුපකාර සමිති මෙම තැන්පත් මුදල් බැඳීම අවශ්‍ය නොවේ. 70.7.22 දින සිට 70.7.29 දින දක්වා මෙම දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර්පත්‍ර ලබාගත හැක.

එන්. ඞී. ජයවීර,
දිසාපති, වවුනියාව දිස්ත්‍රික්කය.

1970 ජූලි මස 7 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දී ය.

7–674—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව—ගාල්ල

### 1970–71 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා ප්‍රාදේශීය ද්‍රව්‍ය මිළදී ගැනීම

1970–71 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම් සඳහා පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් මව්සින් කැඳවනු ලැබේ:—

මාතර දිස්ත්‍රික්කය :—දැරංගල, කළුබෝවිටියාන, ඌරුබොක්ක, ඊද්ධකිත, දංගල, දෙනියාය.

ගාල්ල දිස්ත්‍රික්කය :—බූස්ස, හියාරේ, පනංගල, බටුවන්ගල, මණ්ඩලපුර, පිටුවල, හල්විටිගල, දම්මල, හිනිදුම.

කළුතර දිස්ත්‍රික්කය :—තීනියාවල.

2. ගාල්ල, ඉඩම් සංවර්ධන කායාීලයේදී, ගාල්ලේ ඉඩම් සංවර්ධන නිළධාරි විසින් 1970.8.14 දින පෙ.ව. 10.30 දක්වා, 1970–71 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

(1) වියන ලද ජෝඩු පොල්අතු (අඩි 7ක් දික්වූ ද, අඟල් 14ක් පළල් වූද, 1,000ක මිළ).

(2) අළුහුණු බුසල් 1ක් (එකක්) (රාත්තල් 44කට නොඅඩු බර තිබිය යුතුයි).

(3) තම්බාපු හුණු බුසල් 1ක් (එකක්).

(4) කළුගල් 6" × 9" කියුබ්වලින්.

(5) තලාපු කළුගල් 2" කියුබ්වලින්.

(6) තලාපු කළුගල් 1½" කියුබ්වලින්.

(7) තලාපු කළුගල් 1" කියුබවලින්.

(8) තලාපු කළුගල් ¾" කියුබවලින්.

(9) තලාපු කළුගල් ½" කියුබවලින්.

(10) පිළිස්සූ ගඩොල් 1,000 (4½" × 2¾" × 8½")

(11) ගඟ වැලි කියුබවලින්.

3. ඉහතින් දක්වෙන ද්‍රව්‍යයන්ගෙන් අංක 4 සිට 9 දක්වා යටතේ දක්වෙන ද්‍රව්‍යයන් සඳහා පහත දක්වෙන ක්‍රමයට මිළ ගණන් දක්විය යුතුයි :—

i) ගල්වල ළඟදී අට්ටි ගසා කියුබ් ගණනින් භාරදීමට—

(අ) පුපුරණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.

(ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් සපයා.

(ii) ගල්වල සිට වැඩපලට කොන්ත්‍රාත්කරුගේ වාහනවලින් ප්‍රවාහනය කර වැඩපොලේදී අට්ටි ගසා භාරදීමට—

(අ) පුපුරණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.

(ආ) පුපුරණ ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.

4. ඉහතින් දක්වෙන අංක 1, 2, 3, 10 සහ 11 දක්වෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි මිළ ගණන් දක්විය යුතුයි :—

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේ නම් පෝරණුව/ගොඩ දමන ස්ථානය අසලදීම භාරදීමට.

(ආ) වැඩ අංශයට ගෙනැවිත් භාර දීමට.

5. පොල් අතු සහ හුණු සැපයීම් සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන්, එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් පණහක් (රු. 50ක්) බැගින් ද, පොල් අතු සහ හුණු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රුපියල් පණහ (රු. 50) බැගින් ද, තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම් පත් ලබා ගත හැක. සියලුම තැන්පත් මුදල් මගේ කාර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකි අතර, එම රිසිට් පත් ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිළධාරි කාර්‍යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම් පත් ලබා ගත හැකිය. ටෙන්ඩර් පත් ලබාගැනීමට හැකි අවසාන දිනය 1970.8.13 දින දවල් 12 තෙක් පමණක් බව සලකන්න.

6. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. හුණු සහ පොල් අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකට ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් (2න්) යුක්තව ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි "ගාල්ල ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් කවරයක බහා සීල් තබා ඉදිරිපත් කළ යුතුයි:—

"ගාල්ලේ ඉඩම් සංවර්ධන නිළධාරී,
ඉඩම් සංවර්ධන කාර්‍යාලය,
නගර ශාලාව,
ගාල්ල."

නැතහොත්, ගාල්ල ඉඩම් සංවර්ධන කාර්‍යාලයෙහි ඒ සඳහා වෙන් කරන ලද ටෙන්ඩර් තැන්පත් පෙට්ටියෙහි තැන්පත් කළ හැක.

7. 1970 අගෝස්තු මස 14 වැනි දින ප.ව. 2.30ට ගාල්ලේ ඉඩම් සංවර්ධන නිළධාරි විසින් එම කාර්‍යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. 1970 අගෝස්තු මස 14 වෙනි දින පෙ.ව. 10.30ට පසු ලැබෙන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී යෝග්‍යයැයි සිතේ නම් ටෙන්ඩර්කරුවනට පෙනී සිටිය හැක.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඒ බව දන්වූ විට සති දෙකක් (2ක්) ඇතුළත ද්‍රව්‍ය භාරදීමට හැකි විය යුතුයි. එසේ කිරීමට නොහැකිවුව හොත් ටෙන්ඩර් ගිවිසුම් කඩකළ කොන්ත්‍රාත්කරුවෙකු සේ සලකා ඒ අනුව කටයුතු කරනවා ඇත.

9. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයක කොටසක් භාර ගැනීම හෝ විශේෂ විස්තරයනට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ගාල්ලේ ඉඩම් සංවර්ධන නිළධාරි සතුය.

එෆ්. බී. ආර්. ද සිල්වා,
ඉඩම් සංවර්ධන නිළධාරි,
ගාල්ල.

1970 ජූලි මස 5 දින,
ගාල්ලේ ඉඩම් සංවර්ධන කාර්‍යාලයේදී ය.

7–600—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත අංක 42 ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් පහත දක්වන දිස්ත්‍රික්කයන්හි පිහිටි නි.මි.යෝ.ක්‍ර. ගබඩාවන්හි ඇති අබලන් හිස් ගෝනි මිළදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1970 ජූලි 27 වැනි සඳුදා ප.ව. 2.30 වන තෙක් බාරගනු ලැබේ :—

### 1. මාතර දිස්ත්‍රික්කය

| | | |
|---|---|---|
| මැද උයන්ගොඩ — | බුසල් 3½ ... | 1,178 |
| | සී.ඒ.එස්. ... | 274 |
| මැද්දවත්ත — | බුසල් 3½ ... | 6,609 |
| | බුසල් 2½ ... | 138 |

### 2. ගාල්ල දිස්ත්‍රික්කය

| | | |
|---|---|---|
| බුස්ස — | බුසල් 3½ ... | 3,491 |
| ඇල්පිටිය — | බුසල් 3½ ... | 530 |
| | සී.ඒ.එස්. ... | 258 |
| කොග්ගල — | බුසල් 3½ ... | 5,610 |

### 3. කලුතර දිස්ත්‍රික්කය

| | | |
|---|---|---|
| මතුගම — | බුසල් 3½ ... | 85 |
| | සී.ඒ.එස්. ... | 816 |
| හොරන — | බුසල් 3½ ... | 750 |
| | බුසල් 2½ ... | 4 |
| කටුකුරුන්ද — | බුසල් 3½ ... | 3,950 |
| | බුසල් 2½ ... | 95 |
| | සී.ඒ.එස්. ... | 39 |

### 4. රත්නපුර දිස්ත්‍රික්කය

| | | |
|---|---|---|
| ඕපනායක — | බුසල් 3½ ... | 1,440 |
| ඇහැලියගොඩ — | බුසල් 3½ ... | 4,800 |
| | සී.ඒ.එස්. ... | 391 |
| කුට්ටිගල — | බුසල් 3½ ... | 1,188 |
| | බුසල් 2½ ... | 94 |

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරිතැනට එක් දිස්ත්‍රික්කයක් සඳහා වෙනම රු. 50ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත කාර්යාලයේ නි.මි යෝ.ක්‍ර. හා වි.කෙ. අංශයට ඉදිරිපත් කර 1970 ජූලි 27 වැනි සඳුදා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිටපතද සහිතව පුරවා ඉදිරිපත් කළ යුතුයි.

3. වැඩි විස්තර සඳහා පහත සඳහන් කාර්යාලයෙන් හෝ ඒ ඒ දිස්ත්‍රික්ක භාර ගොවිජන සේවා සහකාර කොමසාරිස් කාර්යාලවලින් විමසා දැනගත හැක.

ඩබ්ලිව්. එස්. ඇපා,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. අංක 537,
කොළඹ 7,
1970 ජූලි 9 වැනි දින දීය.

7–659—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**1970 අගෝස්තු මස සිට 1970 දෙසැම්බර් මාසය දක්වා පොලොන්නරුවේ, තමන්කඩුව සත්ව ගොවිපල් ව්‍යාපාරයට ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම**

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා පොලොන්නරුවේ තමන්කඩුව සත්ව ගොවිපල් ව්‍යාපාරයට 1970.8.11 දින පස්වරු 2.30 වන තෙක් පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

1. කළුගල් 6" සිට 9" (කියුබයකට)
2. කැටගල් 2" (කියුබයකට)
3. කැටගල් 1½" (කියුබයකට)
4. කැටගල් 1" (කියුබයකට)
5. කැටගල් ¾" (කියුබයකට)
6. ගංගා වැලි (කියුබයකට)
7. පිළිස්සූ ගඩොල් (1,000කට)
8. වියාපු පොල් අතු (1,000කට)

2. කොළඹ 5, නාරාහේන්පිට, පළතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු කාර්යාලයේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ඔහු ගෙන්ම ලබා ගත හැකිය.

3. රුපියල් 25 කට ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970.8.3 දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

එස්. කදිරකාමතම්බි,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු අංශය,
පළතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.
1970.7.8 දින දීය.

7–620—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1970 ඔක්තෝබර 1 වනද සිට 1971 සැප්තැම්බර් 30 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

**සැ.යු.**—කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, වවුනියාව සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවැනි ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය ඒදහා පැමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි තැන, පුත්තලම " කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයේ බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කරගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**.—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (1) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් පක්විය යුතුය.

(2) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(3) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිළ ශත 50කි.

පරිත්‍යාග කරන ලද සහල්, නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත් කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාකය මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයනේ අඩු කරගනු ලැබේ.

(4) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළෙන් සලාක සහල් මිළේත් වෙනස අඩු කරගනු ලැබේ.

ආර්. එච්. පීරිස්,
සෞඛ්‍ය සේවා අධිකාරි, පුත්තලම.

1970 ජූලි මස 5 වෙනි දින,
පුත්තලම, සෞඛ්‍ය සේවා අධිකාරි කායර්ාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට — මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට — මාළු | මස් | කරවල | එළවළු | රිකි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | | |
| ආනමඩුව දිස්ත්‍රික් රෝහල ... | 100... | 800 | 70.8.7 පෙ.ව. 10 ට | 100... | 100... | 100... | 400... | 1,250... | 1,250... | 1,300... | 5,000... | 0 |
| මුන්දලම පර්යන්ත ඒකක ... | 100... | 800 | | 200... | 200... | 200... | 850... | 1,000... | 1,100... | 1,000... | 4,650... | 0 |
| මාදම්පේ ප. ඒ. ... ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,100... | 850... | 850... | 800... | 3,350... | 0 |
| ගල්මුරුව ප. ඒ. ... ... | 100... | 600 | | 250... | 250... | 250... | 900... | 1,100... | 1,110... | 1,100... | 4,350... | 0 |
| දංකොටුව, ප. ඒ. ... | 100... | 600 | | 250... | 500... | 250... | 1,100... | 1,850... | 1,800... | 1,900... | 7,350... | 3,750 |

7–489—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1970–71 වර්ෂය තුළ කිරි පිටි හා සීනි ප්‍රවාහණය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 ක් වූ ඔක්තෝබර් මස 1 දින සිට 1971 සැප්තැම්බර් 30 දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමු වන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට අගලවත්ත සෞඛ්‍ය කාර්යාලයේ සිටද, කළුතර දුම්රිය ස්ථානයේ සිට අගලවත්ත සෞඛ්‍ය කාර්යාලයටද කිරි පිටි ගෙනයාම සඳහා සහ එකී ආයතනයන්ට අගලවත්ත සෞඛ්‍ය කාර්යාලයේ සීටද, අලගවත්ත විවිධ සේවා සමුපකාර සංගමයේ සිට අගලවත්ත සෞඛ්‍ය කාර්යාලයටද, සීනි ගෙන යාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛණයෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි රුපියල් 100ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, මඩකලපුව, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පලමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරණ අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දැන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරණ ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරි පිටි හා සීනි ප්‍රමාණයන් දල වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි තුන්වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කළුතර'' කියා එවිය යුතුයි. සීල් කරණ ලද ටෙන්ඩර්පත් බහා එවන ලද කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවක් මෙන්ම එහි වම්පස පහල කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාල යෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරණු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස් විය හැකිය.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත උපලේඛනයෙහි 4 වන තීරයෙහි සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරණ වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයෙහි සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරණ ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දන ගැනීම සඳහා දෙවන ඡෙදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඒ. ජී. එච්. තාබෲ,
කළුතර, සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කළුතර, 1970 ජූලි 1 වනදා.

## උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) යැවිය හැකි ප්‍රමාණය දෙමසකට වරක් | (4) අවසාන දිනය |
|---|---|---|---|
| 1. කිරි පිටි ... | කළුතර දුම්රිය ස්ථානයේ සිට අගලවත්ත සෞඛ්‍ය කාර්යාලයටද අගලවත්ත සෞඛ්‍ය කාර්යාලයේ සිට එකී ප්‍රදේශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට | 3,024 | 1970.8.14 පෙ. ව. 10 දක්වා |
| 2. සීනි | අගලවත්ත, විවිධ සේවා සමුපකාර සමිති ගබඩාවේ සිට අගලවත්ත, සෞඛ්‍ය කාර්යාලයටද, එතැන් සිට එකී ප්‍රදේශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට | 100 | |

7–485/1—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1970 ඔක්තෝබර් 1 දින සිට 1971 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළ කිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි, රු. 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායර්ාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, මඩකලපුව, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමහ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, කළුතර" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිළි ව සඳහන් කළ යුතුවාක් මෙන් ම, එහි වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායර්ාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කමාම ගණකාධිකාරී මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකි ය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරණ ලද මිළ ගණන් මෙහි පළමුවන, ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දනගැනීම සඳහා දෙවන ඡෙදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඒ. ජී. එච්. තාබෲ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කළුතර, 1970 ජූලි 1.

## උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) යැවිය හැකි ප්‍රමාණය මසකට පයින්ට් | (4) අවසාන දිනය |
|---|---|---|---|
| 1. දකුණු කළුතර, කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට | කළුතර | ... 8,000 | 1970.8.14 පෙරවරු 10 |
| 2. පානදුර, පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි මධ්‍යස්ථානවලට ගෙනයාමට | පානදුර | ... 8,500 | |
| 3. හොරණ, පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට | හොරණ | ... 7,900 | |

7–485/2—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය

### කිලිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර් කරුවන්ගේ සුදුසුකම්.**—1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වනදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි සේදීම සඳහා ලංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරනලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ යාපනය, බදුල්ල, මඩකලපුව, අනුරාධපුරය, කොළඹ, ගාල්ල, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලවලින් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, කළුතර" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ලබාගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කරගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ එවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේනම් , එහි සඳහන් මිළ ගණන් මොන හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10 ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛන යෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදයම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිලිටි රෙදිවල විෂබීජ නැති කිරීම හා එහා මෙහා ගෙන යාමේ වියදම.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවලට පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩලවල ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීති වලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ යුතුය.

ඒ. ජී. එච්. තාබෘ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 ජුලි 1 වැනි දින,
කළුතර, සෞඛ්‍ය සේවා අධිකාරියේ දීය.

## උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | (6) ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| කොටස "අ" ශල්‍යාගාරය, මාතෘ හා ළමා වාට්ටුව ... | 50 ... | 400 ... | දිනපතා ... | 10,616 | 70.8.14 |
| කොටස "ආ" "අ" කොටසේ සටහන් ඒවා හැර අනිකුත් සියළුම වාට්ටු හා චිකිත්සාගාර ආදිය | 50 ... | 400 ... | 4 ... | 4,141 | පෙරවරු 10 ට |

7-485/3—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1970 ඔක්තෝබර් 1 වනදා සිට 1971 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත් ව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමු වන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, ගාල්ල, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වැනි තීරුව බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, කළුතර" කියා එවිය යුතුයි. සීල්කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම් කරන විට ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10 තැන්පත් ඇප මුදල.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. බඩුබාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස $4\frac{1}{2}$ ක් ඇතුළත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිල ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිළ ශත 60 කි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරගනු ලැබේ.

(iv) කූපන්භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාරදුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දනට මෙන් නොමිලයේ වූවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩුකරගනු ලැබේ.

1970 ජූලි 1 දින,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

ඒ. ජී. එච්. තාබෘෘ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට — මාළු | මස් | කරවල | එළවළු | රෝගීන්ට — මාළු | මස් | කරවල | එළවළු | කිරි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නැබඩ රජයේ රෝහල ... | 100... | 1,000 | 1970.8.14 පෙවරු 10 ට | 208... | 197... | 218... | 850... | 1,547... | 1,399 | 1,511... | 6,260... | — |
| මතුගම ගැමි රෝහල ... | 100... | 800 | | 24... | 24... | 25... | 97... | 943... | 921... | 941... | 3,818... | 743 |
| ඉත්තපාන රජයේ රෝහල ... | 100... | 600 | | 99... | 108... | 106... | 421... | 661... | 707... | 709... | 2,655... | — |
| මීගහතැන්න පර්යන්ත ඒකකය | 100... | 600 | | 142... | 144... | 140... | 579... | 1,376... | 1,232... | 1,339... | 5,447... | — |
| දෙඩම්ගොඩ ගැමි රෝහල ... | 100... | 400 | | 139... | 128... | 137... | 553... | 717... | 695... | 729... | 2,939... | — |

7–485/4—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා (දෙදිනම ඇතුලුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන අයුරු දුම්රියපලේ සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—රුපියල් 100ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර්ප‍ත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම සහ රත්නපුරය යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩරකරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වූවහොත් හෝ ටෙන්ඩර් සඳහා තැන්පත් කළ ලද මුදල අහිමිවීමට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු කිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි තුන්වන තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිම යුතු අන්දම.—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි කියා එවිය යුතුය සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම සෞඛ්‍ය සේවා අධිකාරී තැනට භාර දී එය ලැබුන බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි හතරවන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලබන නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කිරීම කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශෙෂ අඩංගුවක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි ඇතුලු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වේ.

11. **වෙනත් විස්තර.**—වැඩිදුර විස්තර දැනගැනීම සඳහා වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන අමතන්න.

පො. රත්නසභාපති,
වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන.

1970.7.9.
වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) සේවාව | (2) පෙදෙස | (3) මාසයකට සැපයිය යුතු පයින්ට් ගණන | (4) අවසාන දිනය |
|---|---|---|---|
| 1. මාන්කුලම් දුම්රිය ස්ථානයේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලයටත්, එතැන් සිට මුලතිව් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථානවලටත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... ... ... ... ... ... | මුලතිව් ... | 6,975 ... | 5. 8.70 |
| 2. මන්නාරම දුම්රිය ස්ථානයේ සිට මන්නාරම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කාර්යාලයටත් එතැන් සිට මන්නාරම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථාන කරාත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... ... ... ... | මන්නාරම ... | 11,335 ... | 5. 8.70 |
| 3. වවුනියාව රජයේ ගොවිපලේ සිට වවුනියාව සෞඛ්‍ය කාර්යාලයටත් එතැන් සිට වවුනියාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථාන කරාත් පිරිසිදු එළ කිරි ප්‍රවාහනය කිරීම ... ... ... ... .. ... | වවුනියාව ... | 360 ... | 5. 8.70 |

7–675—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

යොමුව : සී එස් සී 2/14/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සෙට්‍රිමයිඩ් බීපී කුඩු යනාදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සෙට්‍රිමයිඩ් බීපී කුඩු යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උප ලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 1 ,895 දරණ 1970 පෙබ වාරි මස 27 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම් ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.10.2 දින පෙ වරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත්

පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 0, ඩීන්ස් පාරේ, අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

කොළඹ, 1970.7.7 දින,

## උපලේඛනය

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1. .. | Cetrimide B.P. Powder .. .. | 1,800 × 500 grammes (nett) tins | In any convenient packing |
| 2 .. | Elastic adhesive bandages B.P.C. 3″ × 5 yds., unstretched and (5 to 6 yds. stretched) (for stroage and use under tropical conditions). | 6,000 dozen spools .. | In single tins and one dozen tins to a box |
| 3 .. | Halothane B.P. for Anaesthetic work .. | 3,000 bottles × 250cc. | In any convenient packing |
| 4 .. | Syr up Promethazine Hydrochloride containing 5 mgm. Promethazine Hydrochloride B.P. per 5 ml. | 5,000 litres .. | In 125 ml. bottles |
| 5 .. | Neomycin and Zinc Bacitracin dusting powder each gram containing: Neomycin Sulphate 5 mgm; Zinc Bacitracin 250 Units; L-Cystine2 mgm; Clycin 10 mgm; DL-Threonine 1 mgm. (suitable for use as dusting powder under tropical conditions) | 12,000 × 15 grammes containers | In any convenient packing |
| 6 .. | Sprays containing Polymixin B Sulphate 150,000 Units, Neomycin Sulphate 750 mgm. Zinc Bacitracin 37,500 units under pressure with a propellent gas | 5,000 Sprays .. | In any convenient packing |
| 7 .. | Injection of Ergometrine Maleate B.P. 0·5 mgm. per ml. | 350,000 ampoules .. | In boxes of 100 |
| 8 .. | Injection of Adrenalin Tartarate B.P. containing the equivalent of 1 in 1,000 in amber-coloured multi-dose vials | 8,000 rubber-capped .. 1 oz. vials | In boxes of 10 |
| 9 .. | Elixir of Piperazine Citrate (B.P.C. 1963) Strength 4 mls. (60 minims) of Elixir should contain the equivlent 500 mgm. of Piperazine Hydrate (The label should contain the strength clearly) | 9,000 Imp. gallons by volume | In ½-gallon leakproof bottles |
| 10 .. | Injection of Chlorpromazine Hydrochloride B.P. 2.5% W/V solution 50 mgm. | 50,000 ampoules .. | In boxes of 500 |

7-619—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 වැනි ද සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළවෙනි තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල සිට සෞඛ්‍ය කාර්යාලවලටත් සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලටත් පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර පුත්තලමේ සෞඛ්‍ය අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවෙනි ඡෙදයෙහි සඳහන් පරිදි රු. 100 ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර්පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් පත් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරී කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම සෞඛ්‍ය අධිකාරි මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ලබා ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවනට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මවිසින් බලය පවරනු ලබන නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි තුන්වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දක්වෙන ii වැනි ඡෙදයෙහි සඳහන් කුමන කායඝාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ආර්. එච්. පීරිස්,
සෞඛ්‍ය සේවා අධිකාරී, පුත්තලම.

1970 ජූලි 6 වැනි දින,
පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

## උපලේඛනය

| | සේවය | ප්‍රදේශය | සැපයිය යුතු ප්‍රමාණය මසකට පයින්ට් | | අවසාන දිනය |
|---|---|---|---|---|---|
| 1. | මාරවිල සහ දන්කොටුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට එම වෛද්‍යනිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට | මාරවිල සහ දන්කොටුව | 9,750 | ... | 1970.8.11 පෙ.ව. 10 ට |
| 2. | හලාවත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට එම වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට | හලාවත ... | 9,250 | ... | එම |

7-530—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

අංක 14,909 හා 1970. 6. 5 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1970-71 වර්ෂයට කොළඹ කොට්ඨාශයේ වෛද්‍ය ආයතන වලට පිසූ ආහාර සැපයීම සඳහා කැඳවූ ටෙන්ඩර් අවලංගුකර ඇත. ඒ සඳහා නැවතත් යථාකාලයේ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

වෛද්‍ය එච්. සී. ගෝමස්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

කොළඹ,
1970. 7. 10.

7-658—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ක්වූ අගෝස්තු මස 7 වැනි දින පෙරවරු 10 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන කායඝාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|
| 1. කෑ/අවුගොඩ මහ බෝධි විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ලක් සහ වැසිකිළියක් තැනීම. |
| 2. කෑ/තල්ගහදෙණිය විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ලක්, ළිඳක් සහ වැසිකිළියක් තැනීම. |

සංලක්ෂ්‍යය : කෑ = කෑගල්ල දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශ කායඝාලයේ හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කායඝාලයේ හෝ රුපියල් 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 20,000 කට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අගෝස්තු මස 4 වැනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත යුතුය. මුදල් බාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. 2 වැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡේදවල සඳහන් පරිදි කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩ සම්බන්ධව සියලු විස්තර දැන ගත හැකි අතර, සැලසුම් ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නො එවන ටෙන්ඩර්පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරි වෙත භාරදිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

5. 1970 අගෝස්තු මස 7 වැනි දින පෙරවරු 10ට කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුගේ නම හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වෙන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට මෙම වැඩ කිරීමට ටෙන්ඩර්කරුවන් කැමතිවිය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර ඇතොත් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කායඝාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේ දී 1966.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. සී. මහතන්තිල,
කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජූලි මස 8 වැනි දින,
කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

7-669—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

බ්‍රේක් ඩ්‍රම්ස් සෑදීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සඳහා ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනය 1970 අගෝස්තු මස 14 වැනි දින පෙ. ව. 10 වන තෙක් කල් දමා තිබේ. 1970 මැයි මස 29 වැනි දින ගැසට් පත්‍රයේ දැන්වීම හා සම්බන්ධවයි.

මිලදී ගැනුම් කළමනාකාර.

242, හැව්ලොක් පාර,
කොළඹ 5.

7-644—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

පහත සඳහන් වැඩ සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) ක්‍රියා කරනයන්, ඇතුළුව 36″ විදුලි පංකා 117ක් සැපයීම.

(2) ක්‍රියා කරනයන් ද ඇතුළුව 56″ විදුලි පංකා 90 ක් සැපයීම.

(3) දෙපාර්තමේන්තුවෙන් සපයන විදුලි පංකා 207 ක් බම්බල පිටිය පිහිටි නිවාසයන්හි සවිකිරීම.

1970 ජුලි 31 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. 1970 අගෝස්තු 25 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැක.

ඩී. රාජේන්ද්‍ර,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

7-606—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය මිලයට ගෙන ඉවත ගෙනයාම සඳහා පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරී විසින් 1970.8.7 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| | |
|---|---|
| 1. හිස් සිමෙන්ති මළු | 10,000 |
| 2. පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් | 500 |

2. පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල මිල ගණන් ඉදිරිපත් කළ යුතුයි. අනුමත ෆෝරමවල නොවන මිල ගණන් සලකා බලනු නොලැබේ. මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණක්, 1970.8.6 වෙනි දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

3. මිල ගණන් පිළිගත් බව දැනුම් දීමෙන් පසු, දින දහයක් (10) ඇතුලත ද්‍රව්‍ය සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකම සම්පූර්ණයෙන්ම තැන්පත් කිරීමට අපොහොසත් වූ හෝ පැහැර හරින ලද හෝ අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ.

4. සාර්ථක වූ ටෙන්ඩර්කරු වටිනාකම තැන්පත් කර දින තුනක් ඇතුලත අදාල ද්‍රව්‍ය ගබඩාවෙන් පිටතට ප්‍රවාහණය කර ගැනීමට කටයුතු යොදා ගත යුතුයි.

5. කිසිදු විමසීමක් නොමැතිව සියළුම මිල ගණන් හෝ කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමට පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරීට සම්පූර්ණයෙන්ම අයිතිය ඇත.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම බහා එවන කවරය වම්පස කෙළවරේ "හිස් සිමෙන්ති මළු හා පරණ ප්‍රවෘත්ති පත්‍ර" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරී කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරීගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ කළ හැකිය.

7. මගේ ප්‍රාදේශීය ගබඩාවේ දී කාර්යාලීය වේලාවන් ඇතුලත මෙම ද්‍රව්‍ය පරීක්ෂා කර බැලිය හැකිය.

8. 1970.8.7 දින පෙරවරු 11.15ට ටෙන්ඩර් විවෘත කරණ අතර එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

9. තවද, වැඩි විස්තර කාර්යාලීය වේලාවන් ඇතුලත පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබා ගත හැකිය.

ඩබ්ලියු. ඊ. ද සොයිසා,
ඉඩම් සංවර්ධන නිලධාරී,
පොළොන්නරුව.

1970. 7. 4 දින,
ඉ.සං.නි. කාර්යාලය,
පොළොන්නරුව.

7-537—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව—ගාල්ල

### ගාල්ල, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, බූස්ස ප්‍රාදේශීය ගබඩාවේ ඇති අබලි ටයර හා ටියුබ විකිණීම හා ඉවත් කිරීම

ගාල්ල, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, බූස්ස—ප්‍රාදේශීය ගබඩාවේ ඇති අබලි ටයර සහ ටියුබ විකිණීම හා ඉවත් කිරීම සඳහා ගාල්ල, ඉඩම් සංවර්ධන නිලධාරී විසින් 1970 ජූලි මස 30 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. සියලුම ටෙන්ඩර්පත් 1970 ජූලි මස 29 දින දවල් 12 දක්වා, ගාල්ල—ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැකි ආකෘති පත්වල පූරවා පිටපත් දෙක බැගින් යුතුව එවිය යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත් ලබාගැනීමට පෙර ගාල්ල ඉඩම් සංවර්ධන කාර්යාලයයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක මෙම කාර්යය සඳහා වූ රුපියල් පණහක (රු. 50) මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයේ වම්පස මුදුනේ "අබලි ටයර හා ටියුබ සඳහා ටෙන්ඩර්පත්" යන්න ලියා මුද්‍රා තබා ගාල්ල ඉඩම් සංවර්ධන නිලධාරී වෙත එවිය යුතුයි. කවරයේ වම් පස පහළින් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්පත් එවිය යුත්තේ ලේඛණගත තැපෑලෙනි. නැතහොත් ගාල්ල ඉඩම් සංවර්ධන නිලධාරී කාර්යාලයයේ ඉඩම් සංවර්ධන නිලධාරී තැනැගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

4. ගාල්ල, ඉඩම් සංවර්ධන නිලධාරී තැනගේ කාර්යාලයයේදී 1970 ජූලි මස 30 දින ප. ව. 2.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍යයයි හැඟී යන්නේ නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවට එහි පැමිණ සිටිය හැක.

5. ටෙන්ඩර්පත් එවීමට අදහස් කර සිටින්නවුනට ඉහත සඳහන් ටයර හා ටියුබ කාර්යාලයයීය වේලාවන් තුලදී (සාමාන්‍ය වැඩ කරන දිනයන්හිදී පෙ. ව. 8 සිට දවල් 12 දක්වා සහ ප. ව. 1 සිට ප. ව. 3.30 දක්වා ද, පෙර පොහෝදිනයන්හි දී පෙ. ව. 8 සිට දවල් 12 දක්වා කාලය තුල) ගාල්ල ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ බූස්ස ප්‍රාදේශීය ගබඩාවේදී පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට මත්තෙන් එලෙස ඒවා පරීක්ෂාකර බලන ලෙස උපදෙස් දෙමි.

6. ඉහත සඳහන් ටයර හා ටියුබ සියල්ල සඳහා හෝ ඉන් කොටසක් සඳහා හෝ ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් එවිය හැක. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කළයුත්තේ එහි සඳහන් එක් එක් බඩු තොගයට සඳහා වූ මුදලය. මුදල් ඉලක්කමින් හා අකුරෙන් ද සඳහන් කළයුතුයි. ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේදී යම්කිසි අඩුපාඩුවක් ඇතිව හෝ අකුරින් හා ඉලක්කමින් මුදල ලිවීමේදී වෙනසක් ඇතිව එවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩතිබේ.

7. තෝරාගත් ටෙන්ඩර්කරුවන් විසින් ඒ බව ඔවුනට දන්වා දස දිනක් ඇතුලත එහි සඳහන් මුළු මුදලම ගෙවිය යුතුයි. එසේ මුදල් ගෙවා දින දාහතරක් ඇතුලත එම බඩු ගෙනයා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යැවීමෙන් හෝ එහි සඳහන් ස්ථානයේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දන්වූවාසේ සලකනු ලැබේ. ගාල්ල, ඉඩම් සංවර්ධන නිලධාරී විසින් වෙන අන්දමකට තීරණය නොකළහොත්, නියමිත කාලසීමාව තුලදී

ඊගෙන නොගොස් ගබඩාවේ ඉතිරිවන බඩු නැවත විකුණා දැම්මට හෝ වෙනත් සුදුසු දෙයක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර් කරුවන්ට ඒවාට කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් කළ නොහැක.

8. (අ) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට කලින් ටෙන්ඩරය අස් කරගන්නා බව නො දැන්වුවහොත් හෝ

(ආ) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට කලින් ඒවා නො එවුව හොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරාගත් බව දැන්වීමෙන් පසුව නියමිත කාල සීමාව තුළදී මුදල් නොගෙවා හෝ බඩු ඉවත් නො කර හැරියහොත් හෝ, තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරුවෙකු බඩු නොගයම ප්‍රතික්ෂේප කළහොත් හෝ ගෙනයාමට බැරිවුවහොත් තැන්පත් මුදල රාජසන්තක කරනු හැර, කොන්දේසිකඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙහි ඔහුගේ නම ඇතුලත් කිරීමට ද ඉඩ තිබේ.

10. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර්පත් හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් භාරගැනීමේ අයිතිය ගාල්ල, ඉඩම් සංවර්ධන නිළධාරී සතුය.

එජ්. ඕ. ආර්. ද සිල්වා,
ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිළධාරී.

1970 ජූනි මස 29 දින,
ගාල්ලේ, ඉඩම් සංවර්ධන කාර්‍යාලයේදීය.

7–457—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ගැල්වනයිස් බෝල්ට් ඇණ සහ මුරිච්චි සැපයීම

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ගැණුම්පත් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් වර්ගයේ හතරැස් ශීර්ෂවලින් යුත් උඩ කම්බි මාර්ග සඳහා අවශ්‍ය ගැල්වනයිස් බොල්ට් ඇණ සහ මුරිච්චි සැපයීම සඳහා මිළ ගණන් මෙයින් කැඳවනු ලැබේ :—

| | වර්ගය | | අවශ්‍ය ප්‍රමාණය | බ්‍රිතාන්‍ය ප්‍රමිති යොමුව |
|---|---|---|---|---|
| 1. | ඇල් 106 සඳහා වොෂර් 2 ක් සහිත 4"× ⅝" ප්‍රමාණයේ බෝල්ට් ඇණ සහ මුරිච්චි | ... | 10,000 | 1 වෙනි සටහන |
| 2. | ඇල් 117 සඳහා වොෂර් 2 ක් සහිත 6½" × ½" ප්‍රමාණයේ බෝල්ට් ඇණ සහ මුරිච්චි | ... | 5,000 | 2 වෙනි සටහන |
| 3. | ඇල් 119 සඳහා වොෂර් 2 ක් සහිත 7½" × ½" ප්‍රමාණයේ බෝල්ට් ඇණ සහ මුරිච්චි | ... | 5,000 | 2 වෙනි සටහන |
| 4. | ඇල් 121 සඳහා වොෂර් 2 ක් සහිත 8½" × ½" ප්‍රමාණයේ බෝල්ට් ඇණ සහ මුරිච්චි | ... | 5,000 | 2 වෙනි සටහන |
| 5. | ඇල් 104 ගැල්වනයිස් බැක්ස් 26 × 1½" × ⅛" ... ... | ... | 4,000 | දෙපාර්ත. සැලසුම ඇල්. 580 |
| 6. | ඇල් 4 ස්පින්ඩල්ස් 5/8" කුඩා ... ... ... | ... | 11,000 | බ්‍ර. ප්‍ර. ස්පින්ඩල්ස් අංක 2 සටහන් 24,31 |
| 7. | ඇල් 8 ස්පින්ඩල්ස් 5/8" ජේ. සිංගල් ... ... | ... | 5,000 | බ්‍ර. ප්‍ර. අංක : 16 |
| 8. | ඇල් 10 ස්පින්ඩල්ස් 5/8" බැක්ස් ජේ. ඩබල් ... ... | ... | 4,000 | බ්‍ර. ප්‍ර. අංක : 14,29 සටහන |
| 9. | ඇල් 13 ස්පින්ඩල්ස් 5/8" "යූ" හැඩයෙන් යුත් ... ... | ... | 1,000 | බ්‍ර. ප්‍ර. අංක : 21,32 සටහන |
| 10. | ඇල් 5 සඳහා පාස්සන ලද (soldered) අඩි 2 කේ 3/20 ඝන කම්බි සමග 12" × 12½" ප්‍රමාණයේ පැතලි භූමි තහඩු (එර්ත් ප්ලේට) ඝනකම ⅛" (එස්. ඩබ්. පී. 10) යුක්ත. | ... | 3,000 | |
| 11. | ඇල් 2 ඩී. සී. බ්‍රැකට්ස් ... ... ... | ... | 1,000 | බ්‍ර. ප්‍ර. බ්‍රැකට් අංක 2,10 සටහන |

2. උඩ කම්බි වර්ග ද්‍රව්‍යයන් සම්බන්ධ 1949 යේ අංක 16 දරණ බ්‍රිතාන්‍ය ප්‍රමිති වැඩ විස්තරයනට අනුකූලව ඉහත සඳහන් ද්‍රව්‍යයන් නිපදවිය යුතුයි.

3. බෝල්ට් ඇණ, මුරිච්චි සහ වොෂර් සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ටෙන්ඩර් කරුවන් විසින් ඒවායේ සැම්පල් ඉදිරිපත් කළ යුතුයි. මේ සඳහා අවශ්‍ය නම් දැනට මෙම දෙපාර්තමේන්තුවේ භාවිතයට ගන්නා බෝල්ට් ඇණ සහ මුරිච්චි මරදානේ පිහිටි තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ දී පරීක්ෂා කර බැලීමට පුලුවන.

4. මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී එක එක වර්ගයේ 1000 ක් සඳහා මිළ ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුයි. ඒසේම ටෙන්ඩර් කරුවන් විසින් තමන් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන්වල වලංගු කාල සීමාව ද, එම ද්‍රව්‍යයන් සැපයීමට ගතවන කාලයද දන්විය යුතුයි.

5. මිළ ගණන් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "බෝල්ට් ඇණ සහ මුරිච්චි සඳහා මිළ ගණන්" යනුවෙන් ලියා, සීල් තබන ලද, රෙජිස්ටර් තැපැලෙන් කොළඹ 1, ලෝටස් පාරේ, තැ. සහ වි. ස. මූලස්ථානය ගොඩනැගිල්ලේ, 5 වෙනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු වෙත, 1970 අගෝස්තු මස 5 දින පෙ. ව. 10 පෙර ලැබෙන සේ එවිය යුතුයි. එසේම එම මිළ ගණන් ඉහත සඳහන් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ද බහා ලිය හැක.

6. මිළ ගණන් එදිනම (1970.8.5) පෙ. ව. 10.30 ට යථෝක්ත කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ඉල්ලුම් කරුවනට එම අවස්ථාවේ දී පැමිණ සිටීමට පුළුවන.

7. වැඩි විස්තර අවශ්‍ය නම් කාර්යාල වේලාවන්හි (පෙ. ව. 9.30 – ප.ව. 4.00 දක්වා) ප්‍රධාන විදුලි සංදේශ ඉන්ජිනේරු කාර්යාලයෙන් විමසා දැන ගැනීමට පුළුවන.

. මෙහි සඳහන් ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයෙන් අවශ්‍ය පරිදි අඩු වැඩි කිරීමේ බලය ගැණුම් පත් මණ්ඩලයේ සභාපති වෙත පැවරී ඇත්තේය.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර,
කොළඹ 1.

7—596—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

**කොළඹ-ගාල්ල පාරේ 61 වැනි සැතපුමේ පූර්ව මිශ්‍රණ වැඩ සඳහා යන්ත්‍රානුසාරයෙන් කඩන ලද වර්ග කළ හැකි ¾" කළුගල් කියුබ් 300 ක් එම පාරේ 58 වැනි සැතපුමේ පිහිටි පූර්වමිශ්‍රණ වැඩ පොළට ගෙනවිත් බාර දීම**

කොළඹ-ගාල්ල පාරේ 61 වැනි සැතපුමේ පූර්ව මිශ්‍රණ වැඩ සඳහා යන්ත්‍රානුසාරයෙන් කඩන ලද වර්ග කළ හැකි ¾" කළුගල් කියුබ් 300 ක් එම පාරේ 58 වැනි සැතපුමේ පිහිටි පූර්ව මිශ්‍රණ වැඩපොළට සැපයීම සහ ගෙනැවිත් බාරදීම සඳහා ටෙන්ඩර් පත් ගාල්ලේ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1970 අගෝස්තු මස 12 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් බාරගනු ලැබේ.

1970 අගෝස්තු මස 12 වැනි බදාදා පෙරවරු 11.05 ට ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක. ටෙන්ඩර් ලියකියවිලි ගාල්ලේ විධායක ඉංජිනේරු (මහා මාර්ග) කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර ගාල්ලේ විධායක ඉංජිනේරු (මාර්ග) තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තේගල වෙළඳ ආයතනය,

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කල සමුපකාර සමිති.

මෙහි සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. 1970 අගෝස්තු මස 3 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ලාංකිකයින්ට හා ලාංකික වෙළඳ සහ අනිකුත් සමාගම්වලට සීමාකර තිබේ.

ජේ. ආර්. වී. සෙනෙවිරත්න,
දකුණු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (මාර්ග).

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
මහා මාර්ග දෙපාර්තමේන්තුව,
මහා මාර්ග දෙපාර්තමේන්තුව,
1970 ජූලි 6 වැනිදා.

7–561—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කෝට්ටේ-බෝපේ පාරේ අංක 11/2 බෝක්කුව නැවත සෑදීම සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 අගෝස්තු මස 5 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ.

2. කොළඹ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත් වල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපතකින් ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගැනීමට පුළුවන.

3. රු. 8,000 නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 ජූලි මස 24 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහල චැතැම් වීදියේ පිහිටි මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එස්. පත්මනාදන්,
අධිකාරි ඉංජිනේරු. බටහිර කොට්ඨාශය
(මහාමාර්ග).

මහාමාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 ජූලි 10.

7–664—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ නිවාස යෝජනා ක්‍රමයට ප්‍රවේශවන මාර්ගය තැනීම සඳහා වූ ටැන්ඩර් පත්, කටුනායක, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1970 ක්වූ අගෝස්තු මස 5 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කටුනායක ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැළසුම්ද ඔහුගේ කායසීලයේ දී බලා ගැනීමට හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ/මහා මාර්ග දෙපාර්තමේන්තුවේ මාර්ග වැඩ සඳහා රු. 75,000 නොඅඩු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 100 තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය, වර්ෂ 1970 ක්වූ ජූලි මස 27 වෙනි සඳුදා දහවල් 12 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් වූ ආපසු ගෙවනු නොලබන, පමාවීමේ ගාස්තුවක් නිකුත්කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ද ලබාගත යුතුය.

4. කලින් මාර්ග තැනීමේ පළපුරුද්දක් ඇති, මාර්ග තැනීම සඳහා වූ උපකරණ සහ රථ වාහන ඇති ටෙන්ඩර්කරුවන් කෙරෙහි විශේෂ යෙන් සළකා බලනු ලැබේ. ටෙන්ඩර් පිළිබඳ මුදල් තැන්පත් කළ කුවිතාන්සිය නිකුත් කරන නිලධාරි තැන වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී, උපකරණ සහ රථ වාහන හිමිකම් පිළිබඳ සාක්ෂ්‍යයද ඉදිරිපත් කළයුතුය. කලින් මාර්ග තැනීම පිළිබඳ පළපුරුද්දක් ඇති, එහෙත් මාර්ග තැනීමේ උපකරණ සහ රථ වාහන නොමැති ටෙන්ඩර්කරුවන්, එම උපකරණ සහ රථ වාහන තමන්ට අවශ්‍ය වන අවස්ථාවන් හි ලබාගත හැකි බවට ලිඛිත ලෙස සනාථ කළ යුතුය.

5. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

6. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතුය.

7. ටෙන්ඩර් තැන්පත් මුදල, කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැකිය.

එස්. නාගලිංගම්,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු,
කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමය.

කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
කටුනායක,
1970 ක්වූ ජූලි මස 8 වෙනි දින දී.

7–672—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

### රාගම උතුරු කොළඹ මහා රෝහලට දර සැපයීම

1970 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1971 සැප්තැම්බර් මස 30 වැනිදයින් අවසන් වන වර්ෂය තුල මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර සැපයීම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර ලාංකික යන් ගන් හෝ ලාංකික ආයතනවලින් කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කායසීලය මගින් සපයන ලද පෝරමවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමඟ ඇති උපලේඛනයේ 4 වෙනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් සෞඛ්‍ය සේවා අධිකාරී හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමඟ ඇති උ¨ලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් කරන ලද මුදලට ලබා ගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙරදින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපැලෙන් පෝර්ම ඉල්ලුම් කරන අය, මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු සෞඛ්‍ය සේවා අධිකාරි වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාලවලින් ලබා ගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දන ගැනීමට ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන් ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරී තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලේකම්/ගණකාධිකාරී වරයාට පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක්ද ලබා ගත හැක. ටෙන්ඩරකරුවන්ට තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. එක් ආයතනයක් සඳහා සැපයිය යුතු දර ප්‍රමාණය දළ වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිළධාරි තුමාගෙන් හෝ එම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිලිපැදිය යුතු ද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීම ද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය ද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දන ගත හැකිය.

වෛද්‍ය. එච්. සී. ගෝමස්,
සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ, 1970.7.9.

උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. ශ. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| රාගම උතුරු කොළඹ මහා රෝහලට දර සැපයීම ... | 100 | ...600 0 ... | 1970.8.5 දින පෙ.ව. 10 ට |

7–666—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

### 1969–70 ටෙන්ඩර් ප්‍රතිඵල

| ටෙන්ඩරයේ නම | ටෙන්ඩර් කරුවන් ගණන | උප ලේඛන අංකය | ද්‍රව්‍ය අංකය | ද්‍රව්‍ය විස්තරය | සාර්ථක ටෙන්ඩර්කරු | ටෙන්ඩරය පියවූ දිනය | ඇණවුම්කළ ප්‍රමාණය රීම් | පිළිගත් මිළගණන් රීමක් රු. ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| මුද්‍රණ කඩදාසි සැපයීම 1969/70 | 23 | 1 | 1 | ඇඹුවර් ලේඩ් ලෙජර් කඩදාසි 22½″ × 35″ රා. 57 | සීමාසහිත ජෝන් ඩිකින් සන් සහ සමාගම, ඇප් ස්ලි මිල්ස්, හෙම්ස්ටඩ් | 24.2.70 | 125 | 71 86 |
| | | | 2 | එම 23″ × 36″ රා. 68 | | | 1,000 | 84 08 |
| | | | 3 | එම 27″ × 34″ රා. 7 | | | 1,000 | 92 73 |
| | | | 5 | එක්ස්ට්‍රා ස්ට්‍රොන් වයිට්වුඩ් කඩදාසි 2 ″ × 34″ රා 65 | | | 1,500 | 82 86 |
| | | | 6 | ස්පෙෂල් සර්ටිෆිකේට් කඩදාසි 25″ × 40″ රා. 70 | සීමාසහිත මෝබර්ග් සහ සම ගම ගෝර්ත් ර්ග්, ස්වීඩනය. | | 1,250 | 57 93 |
| | | | 4 | සුදු කාට්‍රිජ් කඩදාසි 30″ × 40″ රා. 90 | වැන් රිකුම් පැපියර් ගෙපැසි ඇම්ස්ටර්ඩෑම් | | 1,000 | 74 26 |
| | | | 7 | වයිට් ඕෆ්සෙට් වුඩ්ෆ්‍රි කඩදාසි 30″ × 40″—75 ජීඑස්එම් | | | 1,500 | 52 91 |
| | | | 8 | එම 27″ × 34″—75 ජීඑස්එම් | | | 1,500 | 40 40 |
| | | | 9 | එම 22½″ × 35″—80 ජීඑස්එම් | | | 1,500 | 37 01 |
| | | | 10 | එම 23½″ × 36″—80 ජීඑස්එම් | | | 1,500 | 39 5 |
| | | | 11 | එම 25″ × 40″—80 ජීඑස්එම් | | | 1,500 | 46 96 |

සැ. ඕ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 ජූලි 17 දින,
කොළඹ දීය.

7–671—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## දැන්වීමයි

මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කළ සහ අයිතිවාසිකම් නොකියන ලද බඩු 1970 අගෝස්තු මස 15 වෙනි දින පස්වරු 1 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. අයිතිවාසිකම් කියන්නෙක් සිටී නම් 1970 අගෝස්තු මස 8 වෙනි දින හෝ ඊට පෙර එසේ කළ යුතු ය.

පු. බ. රඹුක්වැල් ල,
මීගමුව මහෙස්ත්‍රාත්.

1970.7.6 වැනි දින,
මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

7–563—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## රාජසන්තක කරන ලද තුවක්කු වෙන්දේසියේ විකිණීම

කෑගල්ල කච්චේරියේ ඇති රාජසන්තක කරන ලද තුවක්කු, 1970 අගෝස්තු මස 7 වෙනි දින පෙරවරු 10.30 ට කෑගල්ල කච්චේරියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ. කෑගල්ලේ දිසාපති විසින් නිකුත් කරන ලද තුවක්කු අත්පත් කර ගැනීමේ අවසර පත්‍ර ඇති අයට පමණක් මෙම තුවක්කු එදින වෙන්දේසියේදී ඉල්ලුම් කළ හැක. එදින පෙරවරු 9 සිට 10 දක්වා එම අවසර පත්‍ර ලාභීන්ට අවශ්‍ය නම් වෙන්දේසි කරනු ලබන තුවක්කු පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ. තුවක්කුව ලබා ගැනීමට පෙර වෙන්දේසියෙන් නියම වූ සම්පූර්ණ මුදල එදින පස්වරු 3ට පෙර කච්චේරියට ගෙවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
කෑගල්ල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 5 දින,
කෑගල්ල කච්චේරියේ දීය.

7–534—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

1970 අගෝස්තු මස 7 වෙනි දින පෙ. ව. 10ට පහත සඳහන් සතුන් වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය ගොවි පලෙහිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

| | |
|---|---|
| 1. එළදෙනුන් | 2 යි. |
| 2. ගොන් වස්සන් | 8 යි. |
| 3. ඊරියන් | 1 යි. |

මෙම සතුන් සතියේ දිනවල පෙ. ව. 8ටත් ප. ව. 4ටත් අතර පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේ ඉල්ලීම සාර්ථක වන ඉල්ලුම් කරුවන් විසින් එහිදී මුදල් ගෙවා වෙන්දේසිය අවසන්වූ වහාම එම සතුන් ඉවත් කර ගත යුතුයි.

අධිකාරී,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය,
වතුපිටිවල.

0970 ජූනි 27 වෙනි දින.

7–531—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසියයි

කළුතර මහෙස්ත්‍රාත් උසාවියේ දී රාජසන්තක කරණ ලද පහත සඳහන් පාපැදි 1 70 අගෝස්තු මස 7 දින පෙරවරු 9.00 ට කළුතර මහෙස්ත්‍රාත් උසාවියේදී විකුණනු ලැබේ.

| නඩුවේ අංකය | | පාපැදියේ අංකය | |
|---|---|---|---|
| ඒ. ආර්. 544/63 | ... | ඒ. ඇෆ්. | 83646 |
| ඒ. ආර්. 499/66 | ... | බී. කේ. | 93058 |
| ඒ. ආර්. 42 /56 | ... | බී. ඊ. | 68446 |
| ඒ. ආර්. 1 91/33 | ... | ඩී. ඇල්. | 3 29 |
| ඒ. ආර්. 1365/68 | ... | ඇෆ් ඇෆ්. | 68 44 |
| ඒ.ආ . 319/.9 | ... | ඇම්. වයි. | 2493 |
| ඒ. ආර්. 227./69 | ... | සී. සී. | 33 |
| ඒ. ආර්. 824/68 | ... | ආර්. ඇන්. | 4525 |
| ඒ. ආර්. 2613 | ... | පී. ඇන්. | 7202 |
| 33840 | ... | බී. ඊ. | 21366 |
| 38991 | ... | ඩී. ඊ. | 25262 |
| 38678 | ... | ඩී. ඊ. | 169_8 |

සී. මනෝහරා,
මහෙස්ත්‍රාත් කළුතර.

මහෙස්ත්‍රාත් උසාවිය,
කළුතර,
1970.7.7.

7–548—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දව වෙන්දේසියේ විකිණීම

වෙල්ලාවෙලි අඩවියේ නොයෙක් ස්ථානවල ඇති වන අපරාධවල අත් අඩංගුවට ගත් තේක්ක, වෙලං, හල්මිල්ල, බුරුත යන වර්ග යෙන් දව තොග නැගෙනහිර දිසා වන නිලධාරී විසින් වෙල්ලාවෙලි අඩවි වන නිලධාරී කාර්යාලයේදී, 1970.7.27 දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන් දව වෙන්දේසි කිරීමට පෙර එම ස්ථානවල ඇති දව පරීක්ෂා කර බලා සෑහීමකට පත්විය යුතුය.

වැඩි විස්තර සඳහා වෙල්ලාවෙලි අඩවි වන නිලධාරීගෙන් විමසන්න.

එස්. මුත්තයියා,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී.

මඩකලපුව,
දිසා වන කාර්යාලයේදීය,
30.6.70.

7–463—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙම උසාවියේ ඇති පහත සඳහන් භාණ්ඩ 1970.7.24 වෙනි දින ප. ව. 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

(1) අංක සී. ඩී. 9183 හම්බර් වර්ගයට අයත් පා පැදිය.

(2) අංක ජීජී. 84921 රැලේ වර්ගයට අයත් පා පැදිය.

(3) අංක කේ. බී. 12675 බී. එස්. ඒ. වර්ගයට අයත් පා පැදිය.

(4) අංක එෆ්. එෆ්. 26445 රජ වර්ගයට අයත් පා පැදිය.

(5) අංක එච්. සී. 4835 දරණ වර්ගය හඳුනාගත නොහැකි පාපැදිය.

(6) අංක ඩී. ඊ. 3351 දරණ වර්ගය හඳුනාගත නොහැකි පා පැදිය.

(7) අංක බී. ඊ. 70987 දරණ රජ වර්ගයට අයත් පා පැදිය.

(8) අංක බී. ජේ. 67490 දරණ රජ වර්ගයට අයත් පා පැදිය.

මීට අමතරව පරණ අත් ඔර්ලෝසු, මන්නා, පිහි, කැති, පොරෝ ආදියද වෙන්දේසි කරනු ලැබේ.

මෙම භාණ්ඩ විකිණීමට ප්‍රථමයෙන් යම් අයෙක් එකී භාණ්ඩ යන් සඳහා හිමිකම් කීමට කැමති නම් වෙන්දේසි දිනට සතියකට ප්‍රථම අයිතිය පැහැදිලි කරන ලියවිලි සමග තම ඉල්ලීම් කළ යුතුය.

භාණ්ඩ මිලට ගන්නන් අත්පිට මුදල් ගෙවා වෙන්දේසි දින දීම මිලට ගත් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

චෙක්පත් මගින් කරන ගෙවීම් භාරගනු නොලැබේ.

සියළුම ගෙවීම් මුදලින් කළ යුතුය.

එෆ්. ජී. බී. ප්‍රනාන්දු,
මහෙස්ත්‍රාත්, මහනුවර.

1970 ජූලි මස 4 වෙනි දින,
මහනුවර, මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

7–499—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## රේගු දෙපාර්තමේන්තුව

### පරිහරණයට නුසුදුසු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මේස පුටු, ඇඳන්, කිරුම් යන්ත්‍ර, ශීතකරණ, වතුර ආදිය පරිහරණයට නුසුදුසු භාණ්ඩයන් 1970 අගෝස්තු මස 19 වැනි දින පෙරවරු 10 සිට කොටුවේ, [illegible] වීදියේ පිහිටි දෙපාර්තමේන්තු ලිපිද්‍රව්‍ය කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ. එදිනට වෙන්දේසියේ විකිණීම අවසන් කිරීමට නොහැකි වුවහොත් පසු දිනද එය පවත්වනු ඇත. 1970 අගෝස්තු මස 18 වැනි දින කාර්යාල වේලාව තුලදී මේ භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැක.

මෙම වෙන්දේසියේදී මිලයට ගන්නා සෑම භාණ්ඩයකම වටිනාකම වහාම මුදලින් ගෙවා වෙන්දේසිය අවසානයේදී ඒවා ඉවත් කර ගත යුතුයි.

වී. සින්නදොරේ,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක එස් ඕ/392,
ලිපි ද්‍රව්‍ය කාර්යාලය,
රේගුව, කොළඹ 1,
70.6.23 දින.

7–456—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## පාවිච්චි කළ තුවක්කු විකිණීම

පාවිච්චි කළ තුවක්කු හා රයිපල් වෙන්දේසියේ විකිණීමක් 1970 අගෝස්තු මස 5 වන දින පෙරවරු 9.30 ට යාපනය දිසාපති කාර්යාලයේ පැවැත්වේ.

වෙන්දේසියේ දී ඉල්ලුම් කළ හැක්කේ බලපත්‍ර දරන්නන්ට හා අවසර ලත් තුවක්කු වෙළෙන්දන්ට පමණකි.

එෆ්. සී. පීටර්ස්,
යාපනය දිසාපති.

දිසාපති කාර්යාලය,
යාපනය,
1970 අගෝස්තු මස 2 දින.

7–556—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

පහත සඳහන් බඩු බාහිරාදිය 1970.7.31 වැනි දින පෙ.ව. 10.00ට නාරාහේන්පිට, කිරිමණ්ඩල පාරේ පිහිටි කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එම බඩු බාහිරාදිය 1970.7.30 වැනි දින කාර්යාල වේලාව ඇතුලත ඉහත සඳහන් ස්ථානයේදී පරීක්ෂාකර බැලීමට පුළුවන.

1. පරණ ටයර් 750 × 20 10
2. පරණ ටයර් 650 × 16 4
3. පරණ ටයර් 750 × 16 26
4. පරණ ටයර් 11 × 28 4
5. පරණ ටයර් 560 × 13 9
6. පරණ ටයර් 825 × 20 5
7. පරණ ටයර් 600 × 16 2
8. පරණ ටයර් 550 × 16 4
9. පරණ ටියුබ් 750 × 16 32
10. පරණ ටියුබ් 650 × 16 9
11. පරණ ටියුබ් 825 × 20 5
12. පරණ ටියුබ් 560 × 13 27
13. පරණ ටියුබ් 750 × 20 7
14. පරණ ටියුබ් 700 × 16 3
15. පරණ ටියුබ් 400 × 19 4
16. පරණ ටියුබ් 700 × 20 7
17. පරණ ටියුබ් 11 × 28 1
18. පරණ ටියුබ් 10 × 28 3
19. පාවිච්චි කරන ලද පරණ බැටරි 48

සම්බන්ධතා නිලධාරී,
කෘෂිකර්ම මධ්‍යම ගබඩාව.

7–465—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## හිමිකම් නොපෑ තැපැල් පැකැට්ටුවල බහා තිබුණු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

අහිමි ලිපි කාර්යාලයට ලැබුණු හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩවල බහා තිබුණු පහත සඳහන් භාණ්ඩ 1970 ජූලි මස 27 වැනි සඳුද පස්වරු 1.30 ට කොළඹ 3, කොල්ලුපිටියේ 19 වෙනි පටු මගේ අංක 20 දරණ අහිමි ලිපි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාධාරණ ගණනකට නොඉල්ලනු ලබන භාණ්ඩ විකිණීම අත්හිටවනු ලැබේ.

ඇම්. පී. ද සිල්වා,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ වෙනුවට.

තැපැල් කොට්ඨාශය,
තැපැල් හා විදුලි සන්දේශ මූලස්ථානය, කොළඹ 1,
1970 ජූලි මස 8 වැනි දින.

| භාණ්ඩ අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1 | ... | පරණ පත්තර හොණ්ඩරයක් |
| 2 | ... | එම |
| 3 | ... | එකක් රාත්තල් 40ක් බැගින්වූ පරණ මුද්‍රිත කඩදාසි මලු 25ක් |
| 4 | ... | එම |
| 5 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 6 | ... | එම |
| 7 | ... | එම |
| 8 | ... | එම |
| 9 | ... | එම |
| 10 | ... | එම |
| 11 | ... | එම |
| 12 | ... | එම |
| 13 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 14 | ... | එම |
| 15 | ... | එම |
| 16 | ... | එම |
| 17 | ... | එම |
| 18 | ... | එම |
| 19 | ... | එම |
| 20 | ... | එම |
| 21 | ... | එම |
| 22 | ... | එම |
| 23 | ... | එම |
| 24 | ... | එම |
| 25 | ... | ඉංග්‍රීසි වෛද්‍ය සඟරා 100යේ මිටියක් |
| 26 | ... | එම |
| 27 | ... | එම |
| 28 | ... | එම |
| 29 | ... | ආගමික සඟරා 100යේ මිටියක් |
| 30 | ... | එම |
| 31 | ... | එම |
| 32 | ... | එම |
| 33 | ... | දෙමළ සඟරා මිටියක් |
| 34 | ... | විදේශ භාෂාමය සඟරා මිටියක් |
| 35 | ... | ඉංග්‍රීසි පොත් මිටියක් |
| 36 | ... | '' රීඩර්ස් ඩයිජස්ට් '' සඟරා තොගයක් (පරණ) |
| 37 | ... | ඉංග්‍රීසි වෛද්‍ය පොත් තොගයක් |
| 38 | ... | එම |
| 39 | ... | ඉංග්‍රීසි පොත් තොගයක් '' කිම් ඉල් සුං බයෝග්‍රැෆි '' |
| 40 | ... | විදේශ අපනයන නාමාවලි කුනක් |
| 41 | ... | ක්‍රිස්තියානි ආගමික පින්තූර තොගයක් |
| 42 | ... | ප්‍රංශ භාෂාමය පොතක් |

| භාණ්ඩ අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 43 | ... | " ටයිම් ලයිෆ් " පොත් පහක් (1) ජපාන් (2) ද බෝල්කන්ස් (3) මෑන් ඇන්ඩ් ස්පේස් (4) ද බර්ත් ඔෆ් යුරෝප් (5) කොලොම්බියා ඇන්ඩ් වැනිසීලා |
| 44 | ... | ඉංග්‍රීසි කාර්මික පොතක් |
| 45 | ... | පරණ සියල් පැනක්, නෝනා මහතුන්ගේ කුඩයක් පිරිමි කොට කලිසමක් හා කොපුවත් සමඟ ඇස් කන්නාඩියක් |
| 46 | ... | සිද්ධාලේප බාම් පැකට් පහයි, " ආෆ්ටර් ෂේව් ලෝෂන් " බෝතලයක්, සබන් කැල්ලක් |
| 47 | ... | කොට්ට උර තුනක්, ලේන්සු තුනක්, බොක්සින් බැනියමක්, ගැහැණු වෙස්ට් එකක්, කුඩා ගවුමක්, හැට්ට රෙද්දක් |
| 48 | ... | නත්තල් ලාම්පු සැට් එකක්, පිංපොං බෝලයක් |
| 49 | ... | සියල් පැනක්, යතුරු වැග් එකක්, කන්නාඩි කොපුවක්, යතුරක්, කොඩැක් ෆිල්ම් රෝල් දෙකක්, යේල් යතුරක් හා කැඩුණු උල්පත් පැනක් |
| 50 | ... | " චූර් ටෝනි " සෙල්ලම් වෑන් රථයක්, සෙල්ලම් බෝට්ටුවක් |
| 51 | ... | ජපන් පීරිසි කෝප්ප 26ක් සහ පිහන් පීරිසි 34ක් |
| 52 | ... | පරණ වූලන් කෝට් එකක් සහ කොට කලිසමක් |
| 53 | ... | සකස් කළ හැකි " ලෝන් ස්ප්‍රිං ක්ලර්ස් " තුනක් |
| 54 | ... | 20,000ක් පමණ අඩංගුවූ පාවිච්චි කළ මුද්දර තොගයක් |
| 55 | ... | එම |

7–657—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

# තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## පුත්තලම් දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂය සඳහා අරක්කු තැබෑරුම් විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා, පුත්තලම් දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට හා දනට බලපවත්නා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාල පොදු කොන්දේසි මාලාවටද යටත්ව, 1970–71 වර්ෂය සඳහා අංක 14,902 හා 70.4.17 දින ප්‍රකාශයට පත් රජයේ ගැසට් පත්‍රයේ සඳහන් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි වලට අනුකූලව ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

2. පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් " 1970–71 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද මිළට ගැනීම් ටෙන්ඩරය " යි සඳහන්කර, මෙහි පහත උප ලේඛයෙහි සඳහන් දින සහ වේලාවන් තුලදී එවිය යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගතහැකි නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතුය. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචිවීමෙන් හෝ ලාංකිකයන්වූ පුරවැසියන්ගෙන් පමණකි.

4. එක් එක් තැබෑරුමක් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර, එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රිකාවකට වඩා කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතුය.

5. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 500 කට කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

6. වටිනාකම් සහතිකයක්ද සෑම ටෙන්ඩර් පත්‍රයක් සමගම ඉදිරිපත් කළ යුතුයි. වටිනාකම් සහතික ඉදිරිපත් කිරීමේදී එම සහතික අරක්කු තැබෑරුම් විකිණීමේ කොන්දේසිවලට අනුකූල විය යුතුය.

7. ටෙන්ඩර් පත්‍රිකාවකට අදල තැබෑරුමේ නම හා අංකය ලියුම් කවරයක වම් කෙළවරේ පැහැදිලිව ලියා එකී ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තබා නියමිත ස්ථානයේ දී, නියමිත දිනයේ දී හා වේලාවේ දී කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත්, ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත්වීමට පෙර කච්චේරියට ලැබෙන පරිදි රජයේ දිසාපති නමට ලිපිනය ලියා, ලියා පදිංචිකළ තැපෑලෙන් එවිය යුතුය.

8. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තැන සතුය.

9. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමිවූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා දිසාපති තුමා විසින් නියම කරනු ලබන ඇප තැන්පත් මුදලක් දිසාපති වෙත ගෙවිය යුතුය.

10. සුරාබදු කොමසාරිස් තුමා විසින් අංක 14,902 හා 70.4.17 දින රජයේ ගැසට් පත්‍රයේ 1970–71 වර්ෂය සඳහා පළ කරවන ලද අරක්කු තැබෑරුම් විකිණීම් කොන්දේසි මාලාවේ සඳහන් වගන්තින් සැළකිළිමත්ව කියවා බලා ඒ අනුව ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලෙස දන්වමි. වෙනත් විස්තර ඉල්ලුම් පත් මගින් පුත්තලමේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හ:ක.

දිසාපති කාර්යාලය,
පුත්තලම,
1970 ජූනි 30 දින දීය.

පී. ජී. පුංචිහේවා,
පුත්තලමේ දිසාපති.

### උපලේඛනය

| අනු අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය සහ වේලාව | තැබෑරුම විවෘතකරන වේලාව පෙ.ව. | තැබෑරුම වසන වේලාව ප.ව. |
|---|---|---|---|---|---|
| 1. | පුත්තලම පළාත් ආණ්ඩු සභාව අංක 2 දරණ කොට්ඨාශය | වේනකුඩිරිප්පුව | 70.8.24 පෙව. 9.30—9.45 | 8.00 | 7.00 |
| 2. | පුත්තලම් පත්තුව | කුරුවිකුලම | පෙ.ව. 10.00 | 8.00 | 7.00 |
| 3. | එම | තේකාපොල | 70.8.24 පෙ.ව. 10 .15 | 8.00 | 7.00 |
| 4. | එම | කන්දතොඩුවාව | 70.8.24 පෙ.ව. 10.30 | 8.00 | 7.00 |
| 5. | එම | මදුරන්කුලිය | 70.8.24 පෙ.ව. 10.45 | 8.00 | 7.00 |
| 6. | එම | මංගලඑළිය | 70.8.24 පෙ.ව. 11.00 | 8.00 | 7.00 |
| 7. | එම | කට්ටෙයිකාඩු | 70.8.24 පෙ.ව. 11.15 | 8.00 | 7.00 |
| 8. | එම | ඔත්තපානිපෙරිය | 70.8.24 පෙ.ව. 11.30 | 8.00 | 7.00 |
| 9. | එම | මුන්දලම | 70.8.24 පෙ.ව. 11.45 | 8.00 | 7.00 |
| 10. | එම | ආඩිමුනේ | 70.8.24 මධ්‍යාහ්න 12.00 | 8.00 | 7.00 |
| 11. | කල්පිටිය | සෝතුපිටිවාඩිය | 70.8.24 ප.ව. 12.15 | 8.00 | 7.00 |
| 12. | එම | ඒත්තාලේ | 70.8.24 ප.ව. 12.30 | 8.00 | 7.00 |
| 13. | එම | නාරක්කල්ලි | 70.8.25 පෙ.ව. 9.45 | 8.00 | 7.00 |
| 14. | දෙමළහත්පත්තුව | ඉහල මණ්ඩලාන | 70.8.25 පෙ.ව. 10.00 | 8.00 | 7.00 |

උපලේඛනය—(සම්බන්ධයි)

| අනු අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය සහ වේලාව | තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. | තැබෑරුම වසන වේලාව ප.ව. |
|---|---|---|---|---|---|
| 15. | උතුරු පිටිගල් කෝරළේ | දකුණු උඩප්පුව | 70.8.25 පෙ.ව. 10.15 | 8.00 | 7.30 |
| 16. | එම | වෙල්ලාවල | 70.8.25 පෙ.ව. 10.30 | 8.00 | 7.30 |
| 17. | එම | රාජකදළුව | 70.8.25 පෙ.ව. 10.45 | 8.00 | 7.30 |
| 18. | එම | කරුකුපොනේ | 70.8.25 පෙ.ව. 11.00 | 8.00 | 7.30 |
| 19. | එම | දෙමටපිටිය | 70.8.25 පෙ.ව. 11.15 | 8.00 | 7.30 |
| 20. | එම | බණ්ඩාරවත්ත | 70.8.25 පෙ.ව. 11.30 | 8.00 | 7.30 |
| 21. | එම | පම්බල | 70.8.25 පෙ.ව. 11.45 | 8.00 | 7.30 |
| 22. | එම | අඹකඳවිල | 70.8.25 මධ්‍යාහ්න 12.00 | 8.00 | 7.30 |
| 23. | එම | උඩලාවල | 70.8.25 ප.ව. 12.15 | 8.00 | 7.30 |
| 24. | හලාවත් පළාත් ආණ්ඩු සභාවේ අංක 6 දරන කොට්ඨාශය | හලාවත කඩමන්ඩිය | 70.8.25 ප.ව. 12.30 | 8.00 | 9.00 |
| 25. | හලාවත පළාත් ආණ්ඩු සභාවේ අංක 7 දරන කොට්ඨාශය | හලාවත පිටිපන වීදිය | 70.8.26 පෙ.ව. 9.45 | 8.00 | 9.00 |
| 26. | නාත්තන්ඩිය | උතුරු තොඩුවාව | 70.8.26 පෙ.ව. 10.00 | 8.00 | 7.30 |
| 27. | එම | ඉහල මහවැව | 70.8.26 පෙ.ව. 10.15 | 8.00 | 7.30 |
| 28. | එම | කුඩා වැව | 70.8.26 පෙ.ව. 10.30 | 8.00 | 7.30 |
| 29. | එම | පහල තල්ගස්අගාර | 70.8.26 පෙ.ව. 10.45 | 8.00 | 7.30 |
| 30. | එම | තල්විල | 70.8.26 පෙ.ව. 11.00 | 8.00 | 7.30 |
| 31. | එම | මූදුකුටුව | 70.8.26 පෙ.ව. 11.15 | 8.00 | 7.30 |
| 32. | එම | දෙමටපිටිය | 70.8.26 පෙ.ව. 11.30 | 8.00 | 7.30 |
| 33. | එම | මොරකැලේ | 70.8.26 පෙ.ව. 11.45 | 8.00 | 7.30 |
| 34. | එම | පහලකටුනේරිය | 70.8.26 මධ්‍යාහ්න 12.00 | 8.00 | 7.30 |
| 35. | වෙන්නප්පුව | *උල්හිටියාව | 70.8.26 ප.ව. 12.15 | 8.00 | 7.30 |
| 36. | එම | බටහිර දුම්මලදෙනිය | 70.8.26 ප.ව. 12.30 | 8.00 | 7.30 |
| 37. | එම | බොරලැස්ස | 70.8.27 පෙ.ව. 9.45 | 8.00 | 7.30 |
| 38. | එම | වයික්කාල | 70.8.27 පෙ.ව. 10.00 | 8.00 | 7.30 |
| 39. | එම | නන්ජුන්ඩත්කරේ | 70.8.27 පෙ.ව. 10.15 | 8.00 | 7.30 |
| 40. | එම | තෝප්පුතොට | 70.8.27 පෙ.ව. 10.30 | 8.00 | 7.30 |
| 41. | එම | තඹරාවිල | 70.8.27 පෙ.ව. 10.45 | 8.00 | 7.30 |
| 42. | එම | ලුණුවිල | 70.8.27 පෙ.ව. 11.00 | 8.00 | 7.30 |
| 43. | එම | වෙන්නප්පුව | 70.8.27 පෙ.ව. 11.15 | 8.00 | 7.30 |

*උල්හිටියාව අරක්කු තැබෑරුම වෙන්නප්පුව සුළු නගර සභා සීමාවතුල පිහිටුවීමට බලය දෙනු නොලැබේ.

7–463/1—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂයේ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීම

### පුත්තලම් දිස්ත්‍රික්කය

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම්වල (ධාන්‍ය මත්පැන් ඇතුළු,) විදේශීය මත්පැන් විකිණීමේ අයිතිය සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට, සුරාබදු බලපත්‍රයන්ට අදල පොදු කොන්දේසි මාලාවට ද යටත්ව 1970—71 කාලය සඳහා අංක 14,906 හා 1970 මැයි 15 වැනි දින ප්‍රකාශයට පත් රජයේ ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව ටැන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටැන්ඩර් පත්‍ර ''1970–71 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩර්'' යයි සඳහන්කර මෙහි පහත සඳහන් දිනයන්හි දී සහ වේලාවන් තුළදී එවිය යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතුය. තවද, එම ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන අය විසින්ම පුරවා සම්පූර්ණ කළ යුතුය. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලාංකිකයන්වූ පුර වැසියන්ගෙන් පමණකි.

4. එක් එක් තැබෑරුමක් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතු අතර, එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රිකාවකට වඩා කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතුය.

5. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 500 කට කච්චේරි කුවිතාන්සියක් ද ඉදිරිපත් කළ යුතුය.

6. වටිනාකමේ සහතිකයක් ද සෑම ටෙන්ඩර්පත්‍රයක් සමගම ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර්කරුවන් වටිනාකම් සහතික ඉදිරිපත් කිරීමේ දී එම සහතික ඉහත සඳහන් විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් නියමයන්ට අනුව විය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රිකාවකට අදල තැබෑරුමේ නම හා අංකය ලියුම් කවරයක වම් කෙළවරේ පැහැදිලිව ලියා ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තබා නියමිත ස්ථානයේ දී නියමිත දින නියමිත වේලාව තුළදී කච්චේරියේ තිබෙන ටැන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට පෙර කච්චේරියට ලැබෙන පරිදි රජයේ දිසාපති නමට ලිපිනය ලියා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තැන සතුය.

9. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා දිසාපතිතුමා නියම කරන ලද ඇප තැන්පත් මුදල දිසාපතිතැනට ගෙවිය යුතුය.

10. සුරාබදු කොමසාරිස්තුමා විසින් අංක 14,906 සහ 70.5.15 දින දරන රජයේ ගැසට්පත්‍රයේ 1970–71 වර්ෂය සඳහා පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිමාලාවේ සඳහන් වගන්තීන් සැළකිලිමත්ව කියවා බලා ඒ අනුව ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලෙස දන්වමි. වෙනත් විස්තර අයදුම්පත් මගින් පුත්තලමේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

දිසාපති කාර්යාලය,
පුත්තලම, 1970 ජූනි 30 දින.

පී. ජී. පුංචිහේවා,
පුත්තලමේ දිසාපති.

උපලේඛනය

| අනු අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය හා වේලාවන් |
|---|---|---|---|
| 1 | හලාවත පළාත් ආණ්ඩු සභාව | හලාවත ප. ආ. සභාවේ අංක 7 පිටිපන වීදිය | 1970.8.27 පෙ.ව. 11.30 |
| 2 | එම | හලාවත ප. ආ. සභාවේ අංක 6 කඩවීදිය | 1970.8.27 පෙ.ව. 11.45 |

7–463/2—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම—බදුල්ල දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂයේ රටබීම තැබෑරුම් විකිණීම

1970, ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971, සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිනීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළ දී ගැනීම සඳහා 1970, මැයි මස 15 වැනි දින අංක 14,906 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනලද 1970–71 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදයන් සඳහා විදේශීය මත්පැන් රේන්ද විකිනීමේ කොන්දේසි වලට ද, දැනට බලපවත්නා සියලු සුරා බදු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 1970, අගෝස්තු මස 14 වන දින තෙක් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. විදේශීය මත්පැන් රේන්ද මිළ දී ගැනීමට ඉදිරිපත් වන අය ලංකාවේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි ආකාර සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත විදේශීය මත්පැන් තැබෑරුමේ ලැයිස්තුවෙහි නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කච්චේරි කුවිතාන්සිය ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම්කෙළවරේ හි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංක හා නමද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි පහත දක්වෙන ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කළ තැපැලෙන් එවීමෙන් හෝ මෙම කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිසාපතිතුමා වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්පත්‍රවල කරණු ලබන සෑම වෙනස් කිරීමක් හෝ සංශෝධනයක්ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 1970, අගෝස්තු මස 14 වැනි දින පෙරවරු 9.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියේ පෙණී සිටිය යුතුයි.

5. කිසියම් කරුණක් සඳහන් නොකොට, ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති තුමා සතුවේ.

6. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ අය ඔහු ගැණුම්කරු වශයෙන් ප්‍රකාශිත දින සවස 4 ට පෙර දිසාපති තුමා විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බදු මුදලක් තැන්පත් ඇප වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබිය යුතුයි.

7. සුරාබදු කොමසාරිස් තුමා විසින් 1970, මැයි මස 15 වැනි දින අංක 14,906 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් වගන්තියන්ට අනුව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සැලකිලිමත් විය යුතුයි. වෙනත් විස්තර බදුල්ල දිසාපති කාර්යාලයෙන් ලබාගත යුතුයි.

ඩබ්. තිලකරත්න,
අතිරේක දිසාපති
බදුල්ල දිසාවේ දිසාපති වෙනුවට.

1970 ජුනි, 30 වැනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේදිය.

### උපලේඛනය

### බදුල්ල දිස්ත්‍රික්කයේ රටබීම තැබෑරුම්—1970–71 (1970.10.1 සිට 1971.9.30)

| තැබෑරුමේ අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රාදේශීය කොටස | තැබෑරුම විවෘතකරන වේලාව | තැබෑරුම වසන වේලාව | නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන්කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| 1. | ... බණ්ඩාරවෙල නගර සභාව ... | බණ්ඩාරවෙල නගර සභා සීමාවේ අංක. 5 හා 6 කොටස | පෙ.ව. 9.00 ... | ප.ව. 9.00 ... | රු. 500 ... | 1970.8.14 පෙ.ව. 11.30ට |
| 2. | ... බදුල්ල මහ නගර සභාව ... | බදුල්ල මහ නගර සභා සීමාවේ අංක 10 සීමාව තුල | පෙ.ව.8.00 ... | ප.ව. 7.30 ... | රු. 500 ... | 1970.8.14. දහවල් 12.00ට |
| 3. | ... බදුල්ල මහ නගර සභා සීමාව | බදුල්ල මහ නගර සභා සීමාව තුළ, බසාර් වීදියේ අංක. 10 කොටස | පෙ.ව.8.00 ... | ප.ව.7.30 ... | රු. 500 ... | 1970.8.14. ප.ව. 12.30 ට |

7–458—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

### බදුල්ල දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂයේ අරක්කු තැබෑරුම් විකිණීම

1970, ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971, සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලයතුළ පහත සඳහන් උප ලේඛනයේ දක්වා ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1970, අප්‍රේල් මස 17 වැනි දින අංක 14,902 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970–71 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදයන්ද සඳහා අරක්කු රේන්ද විකිනීමේ කොන්දේසිවලටද, දැනට බල පවත්නා සියළු සුරා බදු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 1970, අගෝස්තු මස 14 වන දිනතෙක් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. අරක්කු රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත්වන අය ලංකාවේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි ආකාර, සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත අරක්කු තැබෑරුමේ ලැයිස්තුවෙහි නියම කර ඇති ටෙන්ඩර් මුදල් ගෙවා ලබාගත් කච්චේරි කුවිතාන්සියද ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නමද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දක්වෙන ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කළ තැපැලෙන් එවීමෙන් හෝ මෙම කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිසාපති තුමා වෙත ලැබීමට සැලස්විය යුතුයි.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරණු ලබන සෑම වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් ම ටෙන්ඩර් කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 1970 අගෝස්තු මස 14 වැනි දින පෙරවරු 9.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියේ පෙනී සිටිය යුතුයි.

5. කිසියම් කරුණක් සඳහන් නොකොට, ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තුමා සතුවේ.

6. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ අය, ඔහු ගැණුම්කරු වශයෙන් ප්‍රකාශිත දින සවස 4 ට පෙර දිසාපති තුමා විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බදු මුදලක්, තැන්පත් ඇප වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබිය යුතුයි.

7. සුරා බදු කොමසාරිස් තුමා විසින් 1970 අප්‍රේල් මස 17 වැනි දින අංක. 14,902 දරණ ගැස්ට් පත්‍රයෙහි පළකරන ලද අරක්කු තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් වගන්තියන්ට අනුව ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට සැලකිලිමත් විය යුතුයි. වෙනත් විස්තර බදුල්ල දිසාපති කාර්යාලයෙන් ලබාගත යුතුයි.

ඩබ්. තිලකරත්න,
අතිරේක දිසාපති,
බදුල්ල දිසාවේ දිසාපති වෙනුවට.

1970, ජුනි, 30 වැනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේ දීය.

7–461—1970.7.17 දින අංක 14,915 දරණ ගැසට් පත්‍රය

## උපලේඛනය

### අනුමතකරනලද අරක්කු තැබැරුම්– බදුල්ල දිස්ත්‍රික්කය, 1970–71 (1970.10.1 සිට 1971.9.30)

| අනුක්‍රමික අංකය. | ප්‍රදේශය | තැබැරුම පිහිටවිය යුතු ප්‍රාදේශීය කොටස | තැබැරුම විවෘත කරන වේලාව | තැබැරුම වසන වේලාව | නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| 1. | ... බදුල්ල මහ නගර සභාව | ... බදුල්ල මහ නගර සභාවේ අංක 9 දරණ කොට්ඨාශය තුල | පෙ.ව.8.00 | ... ප.ව.7.30 | ... රු. 2,500 | ... 1970.8.14. පෙ.ව.10.00 |
| 2. | ... පස්සර | ... මඩොල්සීම ගම තුල | ... පෙ.ව.8.00 | ... ප.ව.6.30 | ... රු. 1,000 | ... 1970.8.14. පෙ.ව.10.30 |
| 3. | ... පස්සර | ... ලුනුගල සුළු නගර සභාවේ වරිපනම් අංක 101 දරණ ස්ථානයේ | පෙ.ව.8.00 | ... ප.ව.7.30 | ... රු. 1,000 | ... 1970.8.14. පෙ.ව.11.00 |

බදුල්ල දිස්ත්‍රික්කයේ වතු සුරා සැල් (අරක්කු) ලැයිස්තුව (ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකළ යුතුයි.)

1. තලිපොතැන්න –තලිපොතැන්න වතුයාය තුල. ... 1970–71 වර්ෂය සඳහා අළුත්වැඩියා කිරීමට මෙම වතු අධිකාරි ඔහුගේ නිර්දේශය 1970 .8.14 වැනි දිනට පෙර මාවෙත එවිය යුතුයි.

7–461—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද වෙන්දේසිය

1970 ඔක්තෝබර් 1 වෙනි ද සිට 1971 සැප්තැම්බර් 30 දක්වා වූ කාලය තුළ පහත දක්වා ඇති තැබැරුම් වලදී සිල්ලර ප්‍රමාණයෙන් අරක්කු විකිණීමේ අයිතිය මිළයට ගැනීම ඉල්ලුම් කරන ටෙන්ඩර් පත්‍රය පහත සඳහන් වන වගන්තිවල විෂයට මෙයින් කැඳවනු ලැබේ:—

(i) 1970 අප්‍රේල් 17 දින හා 14,902 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අරක්කු රේන්දය විකිණීමේ කොන්දේසි.

(ii) දනට භාවිතා වන සැම සුරාබද්ද බලපත්‍රවලට අදළ පොදු කොන්දේසි.

2. සැම ටෙන්ඩර් ඉල්ලුම් පතක්ම අංක 1 දරණ ග්‍රෑන්ඩ් බසාර්, අංක 2 දරණ කරයූර්, අංක 3 දරණ වැල්වැටිතුරේ, අංක 4 දරණ කයිට්ස් සහ අංක 5 දරණ වන්නාන්කර්ණි යන තැබැරුම් එකක් වෙනුවෙන් රු. 5,000 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සඳහන් භාණ්ඩාගාර හෝ කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත් නියමිත ආකෘති පත්‍රයෙහි වියයුතුය.

3. සැම ටෙන්ඩරයක්ම බහාලන කවරය සීල් තැබිය යුතු අතර එහි ඉහළ කෙළවර වම්පස, මෙසේ සඳහන් කළ යුතුය. "යාපනය දිස්ත්‍රික්කයේ 1970–1971 වර්ෂයට අංක 1 දරණ ග්‍රෑන්ඩ් බසාර් ; අංක 2 දරණ කරයූර් ; අංක 3 දරණ වැල්වැටිතුරේ ; අංක 4 දරණ කයිට්ස් ; අංක 5 දරණ වන්නාර්කර්ණි අරක්කු තැබැරුම් සඳහා ටෙන්ඩරයයි". පහත සඳහන් ඕනෑම තැබැරුමක් සඳහා වූ බහාලන ලද සීල් තැබූ කවරය:—

(අ) කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතහොත්

(ආ) ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කිරීමට නියමිත වේලාවට පෙර ලැබෙන ලෙස යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන වෙත එවිය යුතුයි.

එක් එක් තැබැරුම් සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. සියළුම තැබැරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 1970 ජූලි 26 වන දින එක් එක් තැබැරුම් වෙනුවෙන් පහත දක්වා ඇති වේලාවල්වලදී අවසාන වේ :—

| | | |
|---|---|---|
| (අ) | අංක 1 තැබැරුම—ග්‍රෑන්ඩ් බසාර් | ... පෙ.ව. 9.30 |
| (ආ) | අංක 2 අරක්කු තැබැරුම—කරයූර් | ... පෙ.ව. 10.00 |
| (ඇ) | අංක 3 අරක්කු තැබැරුම—වැල්වැටිතුරේ | ... පෙ.ව. 10.30 |
| (ඈ) | අංක 4 අරක්කු තැබැරුම—කයිට්ස් | ... පෙ.ව. 11.00 |
| (ඉ) | අංක 5 අරක්කු තැබැරුම—වන්නාන්කර්නි | ... පෙ.ව. 11 30 |

ටෙන්ඩර්කරුවන් 1970 ජූලි මස 26 වැනි ඉරිද පෙ.ව. 9 ට මෙම කච්චේරියට පැමිණ සිටිය යුතුය.

4. (අ) සැම ටෙන්ඩර්කරුවකු විසින්ම සැම තැබැරුමක් සඳහා ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 25 කට නොඅඩු ප්‍රමාණයකට සමාන වටිනාකමක් ඇති වටිනාකමේ සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල සිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන ගෙන් වටිනාකමේ සහතිකය ලබා ගත යුතුය. එක දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්ක කීපයක තැබැරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර් කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමග වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇතිනම් අනිකුත් ටෙන්ඩර් වලට එම සහතිකයේ සහතික පිටපත් අමුණා සැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදළ තැබැරුමේ නම, අංකය සහ එය පිහිටි දිස්ත්‍රික්කය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

(ආ) පිළිගනු ලැබූ ටෙන්ඩර් කරුවකු විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම් සහතිකයේ සඳහන් දේපළ හෝ ඉන් කොටසක් මගේ කලින් ලේඛිත අනුමැතියක් නොමැතිව විකුණුවහොත්, උකස් තැබුවහොත් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි කඩ කිරීමක් වනු ඇත.

(ඇ) සමූහ වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කරන කල්හි ටෙන්ඩර් කොන්දේසිවලට සරිලන සේ නිශ්චල දේපල සම්බන්ධයෙන් වටිනාකමේ සහතිකය එක් අයකු හෝ වැඩි දෙනකු විසින් ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් හිමියන් අයිතිවාසිකම් ලැබීමට තෝරා ගනු ලැබූ බව දන්වීමෙන් පසු විකිණීමේ කොන්දේසි වලට අත්සන් තැබිය යුතු වන අතර ආණ්ඩුවේ ඒජන්තවරයකු විසින් නියම කරන ඇප මුදලක් ආණ්ඩුවේ ඒජන්ත තැන වෙත තැන්පත් කළ යුතුය.

6. ටෙන්ඩර් හිමියකු ඉහත සඳහන් තැබැරුම්වල අරක්කු විකිණීමට මිළයට ගන්නා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසුව වෙන්දේසියේ කොන්දේසි වලට අත්සන් තැබීම පැහැර හරින්නේ නම් හෝ ඇප මුදල තැන්පත් කිරීමට නියම කළ විට එයට අපොහොසත් වන්නේ නම් හෝ ඔහුට දෙනු ලැබූ වරප්‍රසාදය අවලංගු හැටියට ප්‍රකාශ කරනු ලබන අතර ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක වන්නේය. සියළුම සුරාබද්ද බලපත්‍ර සම්බන්ධයෙන් ඔහුගේ නම අණ කඩකළවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් වනවා ඇත. මෙම ව්‍යතිරේකයට යටත්ව, තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් වෙන්දේසියේ කොන්දේසිවලට අත්සන් තැබීමෙන් හා ඉහත සඳහන් වූ ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු, සියලු ටැන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල ආපසු භාර දෙනු ලැබේ.

7. ලංකාවේ පුරවැසියකු නොවන්නකු විසින් හෝ ඉහත සඳහන් රේන්ද විකිණීමේ 5 වැනි හා 6 වැනි කොන්දේසිවලින් නුසුදුස්සකු වූවකු හෝ ඉල්ලනු ලබන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

8. යම්කිසි ටෙන්ඩරයක් හෝ සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමට ඇති හේතුව කුමක් දැයි සඳහන් නොකර එසේ ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය ආණ්ඩුවේ ඒජන්ත තැන වෙත ඇති අවුරුම් හිමිකමක් සේ තබා ගන්නවා ඇත.

9. දනට තැබෑරුම් පවත්නා භූමි භාග 1970–71 වර්ෂය සඳහා ලැබේද යන්න ගැන ස්ථිරතාවයක් නැත. භූමිභාග සඳහා යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැනගේ පූර්වානුමැතිය තිබිය යුතුය.

10. වැඩිදුර විස්තර ඉල්ලුම්පතක් එවීමෙන් යාපනය කච්චේරියෙන් ලබා ගතහැක.

11. අරක්කු තැබෑරුම් විවෘත කරන හා වසන වේලාවල් මෙහි පහත දක්වෙන අයුරු සංශෝධනය කර ඇත :—

| අනු පිළිවෙල අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටිය යුතු ප්‍රදේශය | විවෘත කරන වේලාව පෙ.ව. | වසන වේලාව ප. ව. |
|---|---|---|---|---|
| 1 ... | ග්‍රෑන්ඩ් බසාර්—යාපනය නගර සභාව කොට්ඨාශය, වාට්ටු අංක 14 | යාපනය නගර සභා කොට්ඨාශය අංක 14 දරණ ස්ටේෂන් වාට්ටුව | 8.00 ... | 8.00 |
| 2 ... | කරයූර් යාපනය නගර සභා කොට්ඨාශය, වාට්ටු අංක 3 කැතුඩ්‍රල් වාට්ටුව | යාපනය නගර සභා කොට්ඨාශය, අංක 3 දරණ කැතිඩ්‍රල් වාට්ටුව | 8.00 ... | 8.00 |
| 3 ... | වැල්වැටිතුරේ—වැල්වැටිතුරේ සුළු නගර සභා අංක 3 | වැල්වැටිතුරේ සුළු නගර සභා කොට්ඨාශයේ අංක 3 දරණ වාට්ටුව | 8.00 ... | 7.00 |
| 4 ... | කයිට්ස්—කයිට්ස් සුළු නගර සභාව ... | කයිට්ස් සුළු නගර සභාව සීමාව තුළ ... | 8.00 ... | 8.00 |
| 5 ... | වන්නාර්කර්නි—පච්චිලයිපලි ... | වන්නාන්කර්නි ගම තුළ ... | 8.00 ... | 6.30 |

1970 ජූලි මස 4 වැනි දින,
යාපනය දිසාපති කාර්යාලයේදී.

ජේ. එම්. සබාරත්නම්,
යාපනයේ වැඩ බලන දිසාපති.

7–478—70.7.17 දින අංක 14,915 දරණ ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ අරක්කු සිල්ලරට විකිණීම සඳහා 1970 අප්‍රේල් මස 17 වැනි දින අංක 14,902 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප වශයෙන් මෙහි පහත දක්වෙන තැබෑරුම් ලැයිස්තුවේ (ඇ) තීරයේ සඳහන් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබා ගත් නියමිත ටෙන්ඩර් පෝරමයක ඉදිරිපත් කළ යුතුයි.

3. (i) ටෙන්ඩර් කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනගෙන් ලබා ගත් වත්කම් සහතිකයක්, ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුනා තිබිය යුතුය. එම වත්කම් සහතිකයේ වටිනාකම ඔවුන් විසින් එක් එක් තැබෑරුමකට ඉදිරිපත් කරනු ලබන මුදලේ වටිනාකමෙන් සියයට 25 ට වඩා අඩු නොවිය යුතුයි.

(ii) එක් තැබෑරුමකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන විට වත්කම් සහතිකයේ මුල් පිටපත හෝ විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් හෝ එක් එක් ටෙන්ඩරයකට අමුණා එවිය යුතුය.

(iii) කොන්ත්‍රාත්තුව දීම සඳහා තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුවකු විසින් ඉදිරිපත් කර ඇති වත්කම් සහතිකයේ දක්වෙන දේපල විකිණීම හෝ වෙන අන්දමකින් පැවරීම කොන්ත්‍රාත්තුව දීමේ ගිවිසුම් කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

4. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1970 අප්‍රේල් මස 17 වන දින අංක 14,902 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970–71 අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අංක 6 යටතේ නුසුදුසු හෝ අයගෙන් ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

5. එක තැබෑරුමක් වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර, පස් දෙනෙකුට වඩා හවුල්ව ද, ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරය වම් පස මුදුනේ ''කළුතර දිස්ත්‍රික්කයේ අංක : ........................................ දරණ අරක්කු තැබෑරුම් රේන්දය සඳහා ටෙන්ඩරය—1970–71'' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය.

ටෙන්ඩර් සහිත කවර :—

(අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්; හෝ

(ආ) ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් හෝ 1970 අගෝස්තු මස 10 වැනි දින පහත දක්වෙන උපලේඛණයේ (ඇ) තීරුවේ සඳහන් ටෙන්ඩර් නවත්වන වේලාවට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

මෙහි 4 වන ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත්, ඊට උචිතනා ලියවිලිද රැගෙන පැමිණිය යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බවට දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ, ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත. විකිණීමේ කොන්දේසි වලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නියි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර් පත්‍රිකා භාර ගනු නොලැබේ.

9. 1970–71 වර්ෂයට දනට තැබෑරුම් පිහිටා ඇති ස්ථාන ලබා දීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කළ හොත් ඒ සම්බන්ධව කළුතර දිසාපති තැනගේ අනුමැතිය ලබා ගත යුතුය.

වැඩි විස්තර කළුතර කච්චේරියෙන් ලබා ගත හැක.

කේ. ජී. ඩී. ඩී. පතිරත්න,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 5 වැනි දින,
කළුතර, දිසාපති කායර්‍ාලයේ දී්ය.

### 1970–71 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද අරක්කු තැබෑරුම් ලැයිස්තුව

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටා ඇති ප්‍රාදේශීය ප්‍රදේශය | (අ) තැබෑරුම් විවෘත කරන වේලාව පෙ.ව. | (ආ) තැබෑරුම් වසන වේලාව ප.ව. | (ඇ) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (ඈ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|---|
| 1 | කළුතර තොටමුණ | කලමුල්ල ගම් සීමාව තුළ | 8.00 | 7.30 | 1,500 | පෙ.ව. 10.00 |
| 2 | කළුතර තොටමුණ | දියලගොඩ ගම් සීමාව තුළ | 8.00 | 7.30 | 1,500 | පෙ.ව. 10.30 |
| 3 | බේරුවල පලාත් ආණ්ඩු සභාවේ අංක 1 දරණ කොට්ඨාශය තුළ | බේරුවල පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 1 දරණ කොට්ඨාශය තුළ | 8.00 | 7.30 | 1,500 | පෙ.ව. 11.00 |
| 4 | පානදුර තොටමුණ | පානදුර පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 8 දරණ කොට්ඨාශය තුළ (වලපල පට්ටිය) | 8.00 | 8.00 | 2,000 | පෙ.ව. 11.30 |
| 5 | පානදුර තොටමුණ | පානදුර පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 6 දරණ කොට්ඨාශය තුළ (කාල්ලුරුව) | 8.00 | 8.00 | 2,000 | දහවල් 12.00 |

7-535—70.7.17 දින අංක 14,915 දරණ ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1970 මැයි මස 15 වැනි දින අංක 14,906 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිනීමේ කොන්දේසිවලට හා සැම සුරාබදු බලපත්‍රය කටම අදාල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප වශයෙන් රු. 300ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ, සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර් පෝරමයක ඉදිරිපත් කළ යුතුය.

3. (i) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් හෝ එයට විකල්පයක් වශයෙන් විශ්වාස සහතික ඔප්පුවක් (FIDELITY GURANTEE BOND) ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. වත්කම් සහතිකයේ හෝ විශ්වාස සහතික ඔප්පුවේ වටිනාකම ඔවුන් විසින් එක් එක් තැබෑරුමකට ඉදිරිපත් කරනු ලබන මුදලේ වටිනාකමෙන් සියයට විසිපහ කට (25) වඩා අඩු නොවිය යුතුය.

(ii) එක් වත්කම් සහතිකයක් හෝ විශ්වාස සහතික ඔප්පුවක් රේන්ද කීපයක් අපේක්ෂා කරන ටෙන්ඩර්කරුවකු විසින් ඉදිරිපත් කළ හැකිය. එවැනි අවස්ථාවලදී එක් එක් ටෙන්ඩර් පත්‍රයට වත්කම් සහතිකයේ මුල් පිටපත හා එහි සහතික කළ පිටපතක් අමුණා තැබිය යුතුය.

(iii) වත්කම් ඇඟවෙන සහතිකයට ගැනෙන දේපල සහතික ලබාගත් පසු විකිණීම හෝ වෙනත් අන්දමකින් අයිතිය වෙනස් කිරීම රේන්දයේ කොන්ත්‍රාත්තුව දෙන ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමක් හැටියට සලකනු ලැබේ.

4. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1970 මැයි මස 15 වැනි දින අංක 14,906 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970/71 වර්ෂයට විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දය විකිණීමේ කොන්දේසි අංක 6 යටතේ නුසුදුසු වූවන්ගේ ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. එක තැබෑරුමක් වෙනුවෙන් එක් අයකු විසින් එක ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර පස් දෙනෙකුට වඩා හවුල්ව ද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

6. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවර වම්පස මුදුනේ ''කළුතර දිස්ත්‍රික්කයේ අංක ......... දරණ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දය සඳහා ටෙන්ඩර් 1970/71'' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය.

(අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

(ආ) ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන්, හෝ

1970 අගෝස්තු මස 10 වැනි දින පහත දක්වෙන උපලේඛනයේ සඳහන් ටෙන්ඩර් භාරගැනීම නවත්වන වේලාවට පෙර සියළුම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුය. මෙහි 4 ඡෙදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමේ ලියවිලි ද රැගෙන පැමිණිය යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිලිගත් බවට දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

9. 1970/71 වර්ෂයට දනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කළහොත් ඒ සම්බන්ධයෙන් කළුතර දිසාපති තැනගේ අනුමැතිය ලබා ගත යුතුය.

10. වැඩි විස්තර කළුතර දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැකිය.

කේ. ජී. ඩී. ඩී. පතිරත්න,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජුලි මස 5 දින,
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

### 1970/71 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද මත්පැන් තැබෑරුම් ලැයිස්තුව

| අනු පිළිවෙල අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය ප්‍රදේශය | තැබෑරුම් විවෘත කරන වේලාව | තැබෑරුම් වසන වේලාව | ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|
| 1 | හොරණ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය | හොරණ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ | පෙ.ව. 8.00 | ප.ව. 8.00 | ප.ව. 1.30 |
| 2 | පස්දුන් කෝරලය (බටහිර) | නෑබඩ ගම්සීමාව තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.30 | ප.ව. 2.00 |
| 3 | පස්දුන් කෝරලය (බටහිර) | තෙබුවන ගම්සීමාව තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.30 | ප.ව. 2.30 |

7—536—70.7.17 දින අංක 14,915 දරණ ගැසට් පත්‍රය

## අරක්කු රේන්ද විකිණීම—මන්නාරම දිස්ත්‍රික්කය—1970–71

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලසීමාව තුළ අරක්කු මිළ දී ගැනීම සහ පහත සඳහන් තැබෑරුම් වල සිල්ලරට විකිණීමේ තනි අයිතිය සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(i) 1970 අප්‍රේල් 17 වැනි දින අංක 14,902 දරණ රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද 1970–71 සහ පසු කාලසීමා සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි, සහ

(ii) දනට බලපවත්වන සියළු සුරාබදු බලපත්‍රවලට අදල පොදු කොන්දේසි.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මෙම කච්චේරියෙන් හෝ දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයේ විය යුතු අතර, ටෙන්ඩර් තැන්පත් මුදල රු. 3,000ක් තැන්පත් කළ බවට කච්චේරියකින් නිකුත් කරන ලද කුවිතාන්සියක්ද විය යුතුය.

3. වත්කම් සහතිකයේ සඳහන් අඩුම වටිනාකම රේන්දයේ වටිනාකමින් සියයට 25ක් වත් වටිනාකම තිබිය යුතු බවට සහතිකයක් විය යුතුය. සහතිකය සැපයිය යුත්තේ ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී වත්කම් සඳහා ගැනෙන නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැන විසිනි. මෙම සහතිකය ටෙන්ඩර් පෝර්මයට ඇමිණිය යුතුය.

4. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් ඔහුගේ නමින් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් අරක්කු විකිණීමේ කොන්දේසිවල 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුසු වූ හා ලාංකික නොවන තැනැත්තකුගෙන් හා ඔහුගේ නියෝජිතයකු මගින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර බාරගනු නොලැබේ.

5. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම සීල් කරන ලද ලියුම් කවරයක බහා එහි වම් පැත්තේ උඩ කෙළවරේ " මන්නාරම නගරයේ අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය 1970–71 " කියා සඳහන් කර 1970 ජූලි මස 27 වැනි දින පෙරවරු 10 ට පෙර මන්නාරම රජයේ දිසාපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ඉහත සඳහන් කොන්දේසිවලට අනුව ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. 1970 ජූලි මස 27 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරනු ලැබේ. එම වේලාවට සෑම ටෙන්ඩර්කරුවෙක්ම කච්චේරියේ පෙනී සිටිය යුතුය.

6. වරප්‍රසාද මිළදී ගැනීම ප්‍රකාශ කළ විට ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිළදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ පසු, විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල වශයෙන් දිසාපති තැන විසින් නියම කරන ලද මුදල දිසාපති තැනට ගෙවිය යුතුයි.

7. මිළයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ වුවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර, වරදකරුවෙකු වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නටද පුළුවන. මෙම ව්‍යතිරේකයට යටත්ව සාර්ථක ටෙන්ඩර්කරු විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් සහ ඉහතකී සාර්ථක ටෙන්ඩර් කරු තබන ලද ඇපයද ආපසු ගෙවනු ලැබේ.

8. එකක් හෝ සියළුම ටෙන්ඩර් එසේ කිරීමට කිසි කරුණක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ බලය රජයේ දිසාපති තැනට තිබේ.

9. ඇපකරු වවුනියාවේ ඇති රජයේ ගුදමින් පමණක් අරක්කු මිළදී ගත යුතුයි.

10. ඉහත සඳහන් අනුමත කරන ලද අරක්කු තැබෑරුම් පිළිබඳ විස්තර පහත දක්වේ :—

| අනුක්‍රමික අංකය | ප්‍රදේශය | තැබෑරුම පිහිටුවිය යුත්තේ කවර ප්‍රාදේශික පෙදෙසක් තුළද යන වග | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|
| 1 ... | මන්නාරම නගරය ... | මන්නාරම සුළු නගර සභා සීමාව තුළ ... | උදේ 8.00 ... | සවස 8.00 |

11. වත්මන් භූමිභාගය ලබා දීම සහතික නොකෙරේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් යෝග්‍ය භූමිභාගයක් මන්නාරමේ සුළු නගර සභා සීමාවන් තුළින් තෝරා ගෙන එම භූමිභාගය සඳහා මන්නාරමේ දිසාපතිවරයාගේ පූර්වානුමතිය ලබාගත යුතුය.

12. වැඩි විස්තර මන්නාරම කච්චේරියෙන් ලබාගත යුතුය.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිසාපති.

1970 ජූලි මස 5 වැනි දින,
මන්නාරම දිසාපති කායර්‍යාලයේ දිය.

7–590/1—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## රටබීම තැබෑරුම් රේන්ද විකිණීම—මන්නාරම දිස්ත්‍රික්කය—1970–71

1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාලසීමාව තුළ තැබෑරුම් බලපත්‍රයක් යටතේ පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන් ඇතුළත රජය අනුමත කළ යුතු සුදුසු ස්ථානවල රටබීම විකිණීමේ තනි අයිතිය සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(i) අංක 14,906 හා 1970 මැයි මස 15 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද 1970–71 සහ ඉන්පසු කාලයට අදල රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි, සහ

(ii) දනට බලපවත්වන සියළු සුරාබදු බලපත්‍රවලට අදල පොදු කොන්දේසි.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම නියමිත ආකෘතියේ විය යුතු අතර, ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 750ක් තැන්පත් කළ බවට කච්චේරියකින් නිකුත් කරන ලද කුවිතාන්සියක්ද විය යුතුයි.

3. වත්කම් සහතිකයේ සඳහන් අඩුම වටිනාකම රේන්දයේ වටිනාකමින් සියයට 25ක් වත් වටිනාකම තිබිය යුතු බවට සහතිකයක් විය යුතුයි. සහතිකය සැපයිය යුත්තේ ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී වත්කම් සඳහා ගැණෙන නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ, ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැන විසිනි. මෙම සහතිකය ටෙන්ඩර් පෝර්මයට ඇමිණිය යුතුය.

4. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් ඔහුගේ නමින්ම ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් රටබීම තැබෑරුම් රේන්ද විකිණීම කොන්දේසි වල 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුසු ලාංකික නොවන තැනැත්තකුගෙන් හා නියෝජිතයකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

5. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම සීල් කරන ලද ලියුම් කවරයක එහි වම් පැත්තේ උඩ කෙළවරේ " 1970–71 මන්නාරම නගරයේ රටබීම තැබෑරුම් රේන්ද සඳහා ටෙන්ඩර් පත්‍ර " යනුවෙන් සඳහන් කර 1970 ජූලි මස 27 වැනි දින පෙරවරු 10.20 ට පෙර රජයේ දිසාපතිට ලැබෙන සේ එවිය යුතුය. 1970 ජූලි මස 27 වැනි දින පෙරවරු 10.20 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරනු ලැබේ. එම වේලාවට සෑම ටෙන්ඩර්කරුවෙක්ම මෙම කච්චේරියේ පෙනී සිටිය යුතුය.

6. වරප්‍රසාද මිළදී ගැනීම ප්‍රකාශ කළ විට ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිළදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ පසු රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල වශයෙන් දිසාපති තැන විසින් නියම කරන ලද මුදල දිසාපති තැනට ගෙවිය යුතුය

7. මිළයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ වුවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර පිළිබඳ වරදකරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් වන්නාටද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු විසින් විකිණීම පිළිබඳ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදල් සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර් කරු විසින් තබන ලද ඇපයද ආපසු ගෙවනු ලැබේ.

8. එකක් හෝ සියළුම ටෙන්ඩර් එසේ කිරීමට කිසි කරුණක් නොදක්වාම ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැනට තිබේ.

9. ඉහත සඳහන් අනුමත කරන ලද රටබීම තැබෑරුම් පිළිබඳ විස්තර පහත සඳහන් වේ :—

| අනුක්‍රමික අංකය | ප්‍රදේශය | තැබෑරුම පිහිටුවිය යුත්තේ කවර ප්‍රාදේශික පෙදෙසක් තුළද යන වග | තැබෑරුම විවෘත කළ යුතු වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|
| 1 | ... මන්නාරම නගරය | ... මන්නාරම සුළු නගර සභා සීමාව තුළ | ... පෙ.ව. 8.00 | ... සවස 7.30 |

10. මන්නාරම දිසාපතිගේ අනුමතිය ලබාගෙන දනට තිබෙන ස්ථානය 1970–71 වර්ෂය සඳහා පාවිච්චි කරන්න.

11. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වාගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපතිතුමාට දන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගේ අනුමතිය ලබාගත යුතුය.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිසාපති.

1970 ජූලි මස 5 වන දින,
මන්නාරම දිසාපති කායාීලයේ දීය.

7-390/2—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## අරක්කු රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය, 1970/71

ඒ. ඇක්ස්. 16/69.

1970 ඔක්තෝබර් 1 දින සිට 1971 සැප්තැම්බර් 30 දින දක්වා ඇති තනි අයිතිය පිට පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මෙහි දක්වෙන අරක්කු තැබෑරුම්වල සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) 1970 අප්‍රේල් මස 17 දින අංක 14,902 දරණ රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි.

(2) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දක්වෙන කාර්යාලයයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන ''බී'' තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක්ද සමගය. ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කර ගත් කිසිදු දේපොලක් විකුණා නැති නම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගුවේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී, සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැතිනම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුයි.

(ඒ) ඕනෑම කච්චේරියකින්,

(බී) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කායාීලයයෙන්,

(සී) කොළඹ සුරාබදු මණ්ඩල කායාීලය,

(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කායාීලය,

(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කායාීලයය.

3. සීල් තබන ලද කවරයක බහාලු එක් එක් ටෙන්ඩර් පත් ඇතුළත් කවරයේ උඩ වම්පස කෙළවරේ ''අංක.........දරණ අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය 1970/71'' යනුවෙන් සඳහන්කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපැලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම්දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9(1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල ආණ්ඩුවේ ඒජන්ත තුමාට ගෙවිය යුතුයි.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නාට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් තබන ලද ඇපය ද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වා ම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. 1970/71 වර්ෂය සඳහා දනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන විශේෂයෙන්ම අංක 10 කෙරගෙපොකුණ තැබෑරුම් ස්ථානය ලබාගත හැකිවේදයි කිව නොහැක. සෑම ස්ථානයක්ම කොළඹ දිසාපති තුමාගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුයි.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබා ගත හැක.

ඩී. ඩබ්ලිව්. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කොළඹ කච්චේරිය,
1970 ජූලි මස 8 දින.

කොළඹ දිස්ත්‍රික්කය

### ඉහත දක්වූ අනුමතකළ තැබෑරුම් ලැයිස්තුව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | ... මොරටුව නගර සභාවේ අංක 9 [illegible] | මොරටුව නගර සභා ප්‍රදේශයේ අංක 9 කොට්ඨාශයේ [illegible] | 70.8.3 | පෙ.ව. 9.30 | ... පෙ.ව. 9.00 | ... ප.ව. 9.00 | රු. 5,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (කැබැරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) කැබැරුම විවෘත කරන වේලාව | (ජී) කැබැරුම වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 2 ... | නො. 27 කොට්ඨාශය, බම්බලපිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—ස්කූල් පටුමගේ සහ කොල්ලුපිටිය පටුමගේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ගාලුපාරේ නැගෙනහිර පෙදෙස දක්වා සහ සාන්ති කිල්ඩා පටුමගේ ද, 14 වෙනි පටුමගේ ද සන්ධිය දක්වා එම සන්ධියේ සිට ගාලුපාරේ බටහිර පෙදෙස ද වේත්. | 70.8.3 | ...පෙ.ව.10.00 | ...පෙ.ව. 9.00 | ...ප.ව. 9.00 ... | 5,000 |
| 3 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (පිකරින්ස් පාර) | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට කොලේජ් වීදියේ දකුණු පෙදෙස; අළුත් මාවත පාර සහ කොටහේන වීදියේ සන්ධියේ සිට වූ පෙදෙස : නැගෙනහිරට : කොටහේන වීදියේ බටහිර පෙදෙසේ සිට කොලේජ් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස, උතුරු ස්කිනර් පාරේ පළමු කී සන්ධිය දක්වාවූ පෙදෙස; දකුණට: උතුරු ස්කිනර් පාරේ කොලේජ් වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙසේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එම සන්ධියේ සිට කෝටබෝන් වීදියේ සන් ය දක්වා වූ පෙදෙස ; බටහිරට: අලුත් මාවත පාරේ සහ උතු ෑ ස්කිනර් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට කෝටබෝන් වීදියේ නැගෙණහිර පෙදෙස සහ කොලේජ් වීදියේ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට අළුත් මාවත පාරේ නැගෙණහිර පෙදෙස. | එම | ...පෙ.ව.11.00 | ...පෙ.ව. 9.00 | ...ප.ව. 9.00 ... | 5,000 |
| 4 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (ජම්පටා වීදිය) | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට ලැස්කරින් වීදියේ සහ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වාද එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට : ජම්පටා වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා සහ එම සන්ධියේ සිට ලැස්කරින් වීදියේ බටහිර පෙදෙස; දකුණට: කෝටබෝන් වීදියේ සහ ලැස්කරින් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස; බටහිරට: උතුරු ස්කිනර් පාරේ සහ ජම්පටා වීදි ය් සන්ධිය දක්වා. | එම | ...දවල් 12.00 | ...පෙ.ව. 9.00 | ...ප.ව. 9.00... | 5,000 |
| 5 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට මෝ ර වී යේ සන්ධියේ සිට වෙරළාසන්නපෙදෙස සහ එම සන්ධියේ සිට ටෙම්පල් පාරේ දකුණු පෙදෙසද, අළුත් මාවත පාර සහ මෝදර වීදියේ සන්ධිය දක්වා ද, එහි සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට: මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා , එහි සිට අළුත්මාවත පාරේ බටහිරට පෙදෙස; දකුණට : වෙරළාසන්න පෙදෙසේ සිට අලුත් මාවත පාරේ සන්ධිය දක්වා සහ එහි සිට මාෂල් වීදියේ උතුර පෙදෙ ස ද; බටහිරට: මාෂල් වීදිය සහ ටෙම්පල් පාර අතර වූ වෙරළාසන්න කොටස ද වේත්. | එම | ...ප.ව. 2.00 | ...පෙ.ව. 9.00 | ...ප.ව. 9.00... | 4,000 |
| 6 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට, නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට පර්ගයුෂන් පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට නාගලගම් වීදියේ බටහිර පෙදෙස; දකුණට: ලූකස් පාර සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා පෙදෙස; එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස; බටහිරට : මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා පෙදෙස; එම සන්ධියේ ලූකස් පාරේ නැගෙණහිර පෙදෙස ද වේත්. | එම | ...ප.ව. 3.00 | ...පෙ.ව. 9. 0 | ...ප.ව. 9.00... | 5,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 7 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය (පර්ගියුෂන් පාර) | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට ගහ දක්වා වූ මට්ටක්කුලිය පල්ලිය පාරේ පෙදෙස සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධියේ සිට වූ පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එම සන්ධියේ සිට ලූකස් පාරේ බටහිර පෙදෙස; දකුණට : දනියෙල් පාරේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස; බටහිරට: හිනමුල්ල පටු මහේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට දනියෙල් පාරේ නැගෙණහිර පෙදෙස ද වෙත්. | 70.8.3 | ...ප.ව. 4.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 4,000 |
| 8 ... | හැඳල සුළු නගර සභාවේ අංක 4 කොට්ඨාශය | හැඳල සුළු නගර සභාවේ අංක 4 කොට්ඨාශයේ තිඹිරිගස්යාය ගමේ පමණක් | 70.8.4 | ...පෙ.ව. 9.30... | පෙ.ව. 9.00... | ප.ව. 8.00... | රු. 2,500 |
| 9 ... | බටහිර සියනෑ කෝරළේ (අ.ප.) | නුවර පාරෙන් හැරී යාර 400කට නො අඩු දුරින් කඩවත-රාගම පාරේ දෙපස පිහිටි කරගහමුනේ පහළ ගමේ පමණක් | එම | ...පෙ.ව.10.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 3,000 |
| 10 ... | කඳාන සුළු නගර සභාවේ අංක 8 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ අංක 8 කොට්ඨාශයේ කෙරගෙපොකුණ ගමේ පමණක් | එම | ...පෙ.ව.10.30... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 2,500 |
| 11 ... | දකුණු අළුත්කුරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් ... | එම | ...පෙ.ව.11.00... | පෙ.ව. 8.00 | ප.ව. 7.00... | රු. 500 |
| 12 ... | කඳාන සුළු නගර සභාවේ අංක 2 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ අංක 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් | එම | ...පෙ.ව.11.30... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 2,500 |
| 13 ... | ජාඇල නගර සභාවේ අංක 6 කොට්ඨාශය | ජාඇල නගර සභා ප්‍රදේශයේ අංක 6 කොට්ඨාශයේ වැලිගම්පිටිය ගමේ පමණක් | එම | ...දවල් 12.00... | පෙ.ව. 9.00... | ප.ව. 8.00... | රු. 2,000 |
| 14 ... | ජාඇල නගර සභාවේ අංක 1 කොට්ඨාශය | ජාඇල නගර සභා ප්‍රදේශයේ කනුවන උතුර අංක 1 කොට්ඨාශයේ කනුවන ගමේ පමණක් | එම | ...ප.ව. 2.00... | පෙ.ව. 9.00... | ප.ව. 8.00... | රු. 3,000 |
| 15 ... | දකුණු අළුත්කරුකෝරළේ | දඹුගම ගමේ පමණක් ... | එම | ...ප.ව. 2.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 2,000 |
| 16 ... | එම ... | බෝපිටිය ගමේ පමණක් ... | එම | ...ප.ව. 3.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 1,000 |
| 17 ... | දකුණු අළුත්කුරුකෝරළේ සහ උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කැපුන්ගොඩ ගමේ පමණක් ... | එම | ...ප.ව. 3.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |
| 18 ... | උතුරු අළුත්කුරුකෝරළේ (ඒ) | සීදූව ගමේ පමණක් ... | එම | ...ප.ව. 4.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 2,000 |
| 19 ... | එම ... | කටුනායක ගමේ පමණක් ... | එම | ...ප.ව. 4.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 2,000 |
| 20 ... | එම ... | පිටිපන ගමේ පමණක් ... | 70.8.5 | ...පෙ.ව. 9.30... | පෙ.ව. 8.00... | පෙ.ව. 7.00... | රු. 1,000 |
| 21 ... | මීගමුව මහා නගර සභාව අංක 11 කොට්ඨාශය | මීගමුව නාගරික -යේ අංක 11 කොට්ඨාශයේ කුරණ ගමේ පමණක් | එම | ...පෙ.ව.10.00... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 2,000 |
| 22 ... | මීගමුව මහා නගර සභාව අංක 10 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 10, මහවීදිය කොට්ඨාශයේ බෝලවලාන ගමේ පමණක් | එම | ...පෙ.ව.10.30... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 2,500 |
| 23 ... | මීගමුව මහ නගර සභාව අංක 8 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 8 කොට්ඨාශයේ උඩයාර්තොප්පු ගමේ පමණක් | එම | ...පෙ.ව.11.00 | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 4,000 |
| 24 ... | මීගමුව මහ නගර සභාව අංක 4 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 4 වැල්ල වීදිය කොට්ඨාශයේ කුඩාපාඩුව ගමේ පමණක් | එම | ...පෙ.ව.11.30... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 500 |
| 25 ... | මීගමුව මහ නගර සභාව අංක 5 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 5 කොට්ඨාශයේ පෙරියමුල්ල ගමේ පමණක් | එම | ...දවල් 12.00... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 2,000 |
| 26 ... | උතුරු අළුත්කුරුකෝරළේ (ඒ) | කඳවල ගමේ පමණක් ... | එම | ...ප.ව. 2.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |
| 27 ... | එම ... | දළුවාකොටුව ගමේ පමණක් ... | එම | ...ප.ව. 2.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |
| 28 ... | කොච්චිකඩේ සුළු නගර සභාවේ අංක 3 කොට්ඨාශය | කොච්චිකඩේ සුළු නගර සභාවේ අංක 3 කොට්ඨාශයේ සීමාව තුළ පමණක් | එම | ...ප.ව. 3.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 1,000 |
| 29 ... | උතුරු අළුත්කුරුකෝරළේ (ඒ) | ඇත්තගාල ගමේ පමණක් ... | එම | ...ප.ව. 3.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 250 |
| 30 ... | එම ... | හේනේමුල්ල ගමේ පමණක් ... | එම | ...ප.ව. 4.00... | පෙ.ව. 8.00 | ප.ව. 7.00... | රු. 250 |
| 31 ... | උතුරු අළුත්කුරුකෝරළේ (බී) | දගොන්න ගමේ පමණක් ... | එම | ...ප.ව. 4.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |

7-661—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ. එක්ස්. 14/69

## රට බීම තැබෑරුම් රේන්ද විකිණීම, 1970–71—කොළඹ දිස්ත්‍රික්කය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වා තයා අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ :—

(i) 1970 මැයි මස 15 දින අංක 14,906 දරන රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සුරාබද්ද බලපත්‍ර සම්බන්ධව දනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දක්වෙන කාර්යාලයයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන "බී" තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තබෙන නියමක මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කර ගත් කිසිදු දේපොලක් විකුණා නැති නම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී, සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැතිනම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන්වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුයි:—

(ඒ) ඕනෑම කච්චේරියකින්,

(බී) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබද්ද කාර්යාලයෙන්,

(සී) කොළඹ සුරාබද්ද මණ්ඩල කාර්යාලයය,

(ඩී) කළුතර සුරාබද්ද මණ්ඩල කාර්යාලයය,

(ඊ) හලාවත සුරාබද්ද මණ්ඩල කාර්යාලයය,

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුයි : "1970–71 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයේ අංක....දරණ රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර පත්‍රයයි". ටෙන්ඩර්පත්‍ර තැබෑරුමේ නමට කෙළින් පහත දී තිබෙන වේලාවන් සහ දිනයන්හිදී ලැබෙන සේ කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමාට එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර භාර ගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රටබීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර 9 වැනි කොන්දේසියේ වරප්‍රසාද යටතේ විකිණීමේ කොන්දේසි අත සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් ආණ්ඩුවේ ඒජන්තතුමාට ගෙවිය යුතුයි.

5. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බව දන්වූ විට, රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල යථාකල්හි තැනපත් කිරම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමිවන අතර, වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබද්ද බලපත්‍රකරුවන් ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර, විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්තතුමාට තිබේ.

7. 1970–71 වර්ෂය සඳහා දනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන විශේෂයෙන්ම අංක 6 මීගමුව තැබෑරුම් ස්ථානය ලබා ගත හැකිවේදැයි කිව නොහැක. සෑම ස්ථානයක්ම කොළඹ දිසාපති තුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත් ස්ථාන විය යුතුය.

8. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දක්වේ :—

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) කොට්ඨාශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත්විය යුතු පෙදෙස) | (ඩී) විවෘත කරන වේලාව | (ඊ) වසන වේලාව | (එෆ්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල | (ජී) ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව | (එච්) විකිණීම් කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| (1) | නො. 9 කොට්ඨාශය, මොරටුව පළාත් ආණ්ඩු සභාව | මොරටුව පළාත් ආණ්ඩු සභාවේ නො. 9 කොට්ඨාශයේ ගාලු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 9 | ප.ව. 9 | රු.3,000 | පෙ.ව.10.00 | 70.8.7 |
| (2) | නො. 13 කොට්ඨාශය, කොටුව | (ඒ) ක්වීන් වීදියේ සහ යෝක් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියෙ සිට වූ චෙලි වීදියේ දෙපස පෙදෙස<br>(බී) කැනල් රෝ සහ චර්ච් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට වූ යෝක් වීදියේ බටහිර පෙදෙස<br>(සී) යෝක් වීදියේ සහ ෆ්ලැග්ස්ටාෆ් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියෙ සිටවූ වැතැම්වීදියේ දෙපස පෙදෙස<br>(ඩී) චර්ච් වීදියෙ සහ වැතැම් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට වූ ක්වීන් වීදියේ නැගෙනහිර පෙදෙස | පෙ.ව. 9 | ප.ව. 9 | රු. 2,500 | පෙ.ව.11.00 | එම |
| (3) | නො. 2 කොට්ඨාශය මෝදර | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—උතුරට : අළුත් මාවත පාරේ සහ මෝදර වීදියේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙසද ; නැගෙනහිරට : පහළ සාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට අළුත් මාවත පාරේ බටහිර පෙදෙස ද ; දකුණට : සාන්ත ඇන්ඩෘගේ පාරේ සහ අළුත්මාවත් පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට පහළ සාන්ත ඇන්ඩෘගේ පෙ. දයේ උතුර. පෙදෙ ද ; බ. හිරට : මාෂල් වීදියේ සහ පහළ ශාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට සාන්ත ඇන්ඩෘ පාරේ නැගෙනහි. පෙදෙස සහ මාදම්පිටිය හා මාෂල් වීදියේ සන්ධිය දක්වා එය සන්ධියේ සිට වූ මෝ ර වීදියේ නැගෙනහිර පෙදෙසත්ය | පෙ.ව. 9 | ප.ව. 9 | රු. 2,000 | දවල් 12.00 | එම |
| (4) | නො. 3 කොට්ඨාශය, ම. ම්පිටිය | වේල්ස් කුමා. මාවතේ සහ ස්ටේස් පාරේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ සාන්ත ජෝශප් වීදියේ දෙපස පෙදෙස | පෙ.ව. 9 | ප.ව. 9 | රු. 3,000 | ප.ව. 2.00 | එම |
| (5) | නො. 6 කොට්ඨාශය, පෑලියගොඩ ළාත් ආණ්ඩු සභාව | පෑලියගොඩ ප ාත් ආණ්ඩු සභාවේ පෑලිය ගොඩ උතුර නො. 6 කොට්ඨාශය, පෑලියගොඩ ගමේ ම ක් | පෙ.ව. 10 | ප.ව. 9 | රු. 2,500 | .ව. 3.00 | එම |
| (6) | නො. කොට්ඨාශය, මීගමු නාගරිකය | මී මු නාගරිකයේ නො. 8 කොට්ඨාශයේ කුන්ඩන්විල පමණක් | පෙ.ව. 10 | ප.ව. 9 | රු. 2,000 | .ව. 3.30 | එම |

9. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබාගත හැක.

ඩී. ඩබ්ලිව්. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 ජූලි මස 8 වැනි දින,
කොළඹ කච්චේරියේ දීය.

7-665—70.7.17 දනා අංක 14,915 දරන ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍රය

අම්පාර දිස්ත්‍රික්කයේ කරවාගු පත්තුවේ කාරතිවු 3 වෙනි කොට්ඨාශයේ පදිංචි [illegible]නි ජීලීලේ රාසයියා වන මා මඩකලපු දිස්ත්‍රික් උසාවියේ අධිකරණ සීමාව තුළ දෙමළ භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට අනුමත කර ලියාපදිංචි කරන ලෙස එක් මසකින් පසු රෙජිස්ට්‍රාර් ජෙනරල් තුමා වෙත ඉල්ලීමට අදහස් කර ඇති බව නොතාරිස්වරුන්ගේ නීති මාලා (91 පරිච්ඡේදය) B උපලේඛනය, 2 වෙනි පනත අනුව දැනුම් දෙමි.

ඇන්. රාසයියා

7–505—70.7.17 දින අංක 14;915 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.10 සිකුරාද | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 70.10. 2 සිකුරාද | ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.27 සිකුරාද | ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී